Hilton
COLOMBO

අසමසමයි
අද්විතීයයි

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී
වාර්ෂික වාර්තාව 2018

පටුන

මූල්‍ය ක්ෂේත්‍රයේ වැදගත් තොරතුරු බිඳක්---------- 9
සභාපතිතුමාගේ පණිවිඩය---------- 11
නිසි බලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලය---------- 14
කළමනාකාර කණ්ඩායම---------- 19
කළමනාකරණ සමාලෝචනය හා විශ්ලේෂණය---------- 21
සංයුක්ත පාලනය---------- 34
අවදානම් කළමනාකරණය---------- 37
තිරසරකත්ව වාර්තාකරණය---------- 40
සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව---------- 48
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම---------- 51
විගණන කමිටු වාර්තාව---------- 52

මූල්‍ය වාර්තා

විගණකාධිපතිවරයාගේ වාර්තාව---------- 55
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය---------- 59
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය---------- 60
ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය---------- 61
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය---------- 62
මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්---------- 63
ඍස්වීම පිළිබඳ නිවේදනය---------- 86
සටහන්---------- 87
පෙරකලාසි ආකෘති පත්‍රය---------- 89
සමාගම පිළිබඳ තොරතුරු----------පසු කවරයේ ඇතුල් පැත්ත

අසමසම

අද්විතීය

හිල්ටන් ශ්‍රී ලංකාවේ වඩාත්ම ප්‍රසිද්ධ හෝටල් සන්නාමය ලෙස අද්විතීය උරුමයක් සනිටුහන් කරයි. දශක තුනකට අධික කාලයක් තිස්සේ අනෙකුත් හෝටල්වලට වඩා උසස් අන්දමින් ලෝක මට්ටමේ ආගන්තුක සත්කාර පිරිනමමින් හිල්ටන් කළම්බු, ජාතික ආර්ථිකය නංවාලීමටත් ශ්‍රී ලංකාව වඩාත් ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීමටත් අඛණ්ඩව මහඟු දායකත්වයක් ලබාදුන්නේය.

තම අමුත්තන්ට ගෞරවයෙන් හා අභිමානයෙන් සලකන හෝටලයක් ලෙස, මෙය ව්‍යාපාරික කටයුතු හා විනෝදජනක අවස්ථා සඳහා තෝරාගැනීමට වැඩි කැමැත්තක් ඇතිවී තිබෙන අතර එහි උත්සව ශාලා සහ අවකාශයන් අලංකාර අන්දමින් නවීකරණය කිරීමෙන් පසු දැන් එය අසමසම ස්ථානයක් බවට පත්වී ඇත. අපගේ ප්‍රණීත ආහාරපානවල ගුණාත්මකභාවය සහ අසමසම සේවාවන් අමුත්තන් ප්‍රබෝධයට පත්කරන අතර අපගේ සුවිශේෂත්වය විදහා දක්වයි.

හිල්ටන් කළම්බු ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ වඩාත්ම උසස් මට්ටමේ විශ්වසනීය හෝටලය ලෙස අනභිභවනීය නාමයක් දිනාගෙන තිබේ. ඉහළම මට්ටමේ වෘත්තිමය සුදුසුකම්වලින් හෙබි විනීත සේවක මණ්ඩලයකගෙන් හෙබි හිල්ටන් හෝටලය මෙම ක්ෂේත්‍රයේ අනෙකුත් තරඟකරුවන්ට මගසලකුණක් වේ.

The Grand Ballroom ප්‍රධාන උත්සව ශාලාව



මැතකදී වැඩිදියුණු කරන ලද කුලුනු නොමැති විශාල උත්සව ශාලාව විවාහ මංගල්‍යයන් සහ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ විශේෂ උත්සව අවස්ථාවන් සඳහා පහසුකම් සැපයීමේ ප්‍රධාන ශාලාව වශයෙන් භාවිතයට යොදා ගැනේ


PULL
ERANDI

The Blue ද බ්ලූ



"නේ වාසික සහ නේවාසික නොවන සම්මන්ත්‍රණ වැනි විවිධාකාරවූ අවශ්‍යතා සඳහා උපයෝගී කරගත හැකි අලංකාර ගෘහ උද්‍යානයකින් සමන්විත මෙම ශාලාව ව්‍යාපාරික ක්ෂේත්‍රයේ අප වෙත දිනෙන් දින වැඩිවෙමින් පවතින ඉල්ලුම සපුරාලීමට උපකාරීවේ"


EXIT
EXIT
EXIT

Onyx ඔනික්ස්



ව්‍යාපාරික ක්ෂේත්‍රයේ විශේෂ උත්සව අවස්ථාවන් සඳහා පහසුකම් සැලසීමට අලුතින්ම එක්වූ ශාලාව වශයෙන් ඔනික්ස් බහුකාර්ය ශාලාව සැලකිය හැකිය. ව්‍යාපාරික ක්ෂේත්‍රයේ විශේෂ අවස්ථාවන්, පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා ඔනික්ස් ශාලාව ඉතා සාර්ථක අන්දමින් යොදාගැනීමට හැකිවී තිබේ.




ආදායම් සංයුතිය
Rs. Mn
1,800
1,600
1,400
1,200
1,000
800
600
400
200
-
2014
2015
2016
2017
2018
Room
F&B


වියදම් සංයුතිය
Rs. Mn
1,600
1,400
1,200
1,000
800
600
400
200
-
2014
2015
2016
2017
2018
විකුණුම් පිරිවැය
පරිපාලන වියදම්
ක්ෂයවීම්
අනෙක් වියදම්


ආදායම් සහ ඉපැයීම්
Rs. Mn
3,500
3,000
2,500
2,000
1,500
1,000
500
-
2014
2015
2016
2017
2018
ආදායම
දළ ලාභය

මූල්‍ය ක්ෂේත්‍රයේ වැදගත් තොරතුරු බිඳක්

	2018	2017
කාමර ලබාදීමෙන් ආදායම ශ්‍රී ලංකා රු.'000	1,219,736	1,317,248
ආහාරපාන ආදායම ශ්‍රී ලංකා රු.'000	1,631,492	1,635,026
වෙනත් ආදායම් ශ්‍රී ලංකා රු.'000	59,312	63,088
මුළු ආදායම ශ්‍රී ලංකා රු.'000	2,910,540	3,015,362
දළ ආන්තික ලාභය %	79.62	82
බදු අයකිරීමට පෙර ලාභය/(අලාභය)ශ්‍රී ලංකා රු.'000	(126,461)	172,976
බදු ගෙවූ පසු ලාභය/(අලාභය) ශ්‍රී ලංකා රු.'000	(127,507)	258,017
කොටසක ඉපැයීම්/(පාඩුව) ශ්‍රී ලංකා රු.	(0.05)	0.13
සාමාන්‍ය කාමර ගාස්තු ප්‍රමාණය ශ්‍රී ලංකා රු.	22,944	21,077
කාමර පදිංචිව සිටීමේ අනුපාතය %	48	57
දිගු කාලීන පොලිය මත ණය ගැනීම් ශ්‍රී ලංකා රු.'000	Nil	Nil
මුළු ස්කන්ධ ප්‍රාග්ධනය ශ්‍රී ලංකා රු.'000	14,022,329	14,022,329
ණය / ස්කන්ධ අනුපාතය %	3.09	1.94
සමස්ත වත්කම් ශ්‍රී ලංකා රු.'000	15,330,551	15,428,109
ණය / සමස්ත වත්කම් අනුපාතය %	2.82	1.77
ජංගම වත්කම් ශ්‍රී ලංකා රු.'000	711,958	755,730
ජංගම වගකීම් ශ්‍රී ලංකා රු.'000	905,859	875,628
ජංගම අනුපාතය (වාර) %	0.79	0.86
ක්ෂණික වත්කම් අනුපාතය (වාර) %	0.72	0.80



සභාපතිතුමාගේ පණිවිඩය

"ත්‍රස්ත ප්‍රහාර සංචාරක කර්මාන්තයට සහ පොදුවේ ආර්ථිකයට බරපතළ අභියෝගයක් සිදුකළ බව අපි කවුරුත් දනිමු. කෙසේ නමුත් එමගින් සියලුම ශ්‍රී ලාංකිකයින්ට එක් අයෙකු සේ සමගියෙන් එක්සත්ව සිටීමටත් පෙරට වඩා ශක්තිමත් වීමට සහ යථා තත්ත්වයට පත්වීමට අවස්ථාවක් උදාකර දුන් බව අපි හඳුනාගෙන සිටිමු. ත්‍රස්තවාදය සෑම තැනකම ප්‍රජාතන්ත්‍රවාදයට තර්ජනයක් වන අතර, ලොව පුරා ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන රටවල් එවැනි ප්‍රහාරයන්ගේ අහිතකර බලපෑම් වළක්වා ගැනීම සඳහා තම පුරවැසියන්ට ශ්‍රී ලංකාවට යාමට දිරිගන්වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි."

හිතවත් කොටස්කාරභවතුනි,

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා ඔබේ සමාගමේ කාර්යසාධනය විස්තරාත්මකව ලේඛනගත කරමින් වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මම ඔබ වෙත සතුටින් ඉදිරිපත් කරමි.

පළමුවෙන්ම අපගේ රටේ බොහෝදෙනෙක් සහ විශේෂයෙන්ම ව්‍යාපාරික ප්‍රජාව දරන්නාවූ අදහස් පිළිබඳව මා විශ්වාස කරන කරුණු කිහිපයක් ඔබවෙත ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාව කරගනිමි. පසුගිය සමයේ ශ්‍රී ලංකාව ඉතා අර්බුදකාරී කාලසීමාවකට මුහුණ දුන්නේය. පළමුවෙන් 2018 වසරේ අගභාගයේදී ඇතිවූ දේශපාලන ව්‍යාකුල තත්ත්වය මත අවිනිශ්චිත බවක් ඇතිවිය. ඉන්අනතුරුව 2019 වසරේ මුල්භාගයේ පාස්කු ඉරුදින අතිශය බිහිසුණු ප්‍රහාරයක් සිදුවිය.

පළමුව මෙම පාස්කු ඉරුදින සිදුවූ ප්‍රහාරයෙන් දිවි අහිමිවූ පුද්ගලයින්ගේ ආදරණීය ඥාති හිතවතුන්ට මාගේ ශෝකය ප්‍රකාශ කිරීමට අවස්ථාව කරගනිමි. හිල්ටන් හෝටලයද මෙම ප්‍රහාරයේ ගොදුරක් බවට පත්විය. අපගේ ආදරණීය ජපන් ජාතික සූපවේදියා හිකරු තකහාෂිගේ ආදරණීය බිරිඳ කඔරි තකහාෂි පාස්කු ඉරිදා දිනයේදී මරණයට පත්වූවාය. හිකරු සහ ඔහුගේ පවුලේ අය කොළඹ හිල්ටන් හෝටලයේ වසර හතරකට වැඩි කාලසීමාවක් සේවය කළේය. ඔහුට සහ ඔහුගේ කුඩා දරුවන් දෙදෙනාට කඔරි අහිමිවීම අදහාගත නොහැකි විය. මෙම සිදුවීමෙන් මාස තුනකට පසුව හිකරු ඔහුගේ දියණිය ඇමි සහ පුතා යූ සමගින් නැවතත් ශ්‍රී ලංකාවට පැමිණ හිල්ටන්කළම්බු වෙත පැමිණීම පිළිබඳව මාගේ ගෞරවාදරය ඔවුන්ට පුදකරමි.

හිල්ටන් කළම්බු හෝටලයේ සියලුම අධ්‍යක්ෂවරුන් විධායක සහ අනෙකුත් කාර්ය මණ්ඩලය වෙනුවෙන් මාගේ අදහස් ප්‍රකාශ කරමි. තකහාෂි පවුලේ සියලු දෙනාට අපගේ නොවෙනස් සහ කොන්දේසි විරහිත සහාය ලබාදෙන්නෙමු. අපගේ රටට අපගේ හෝටලයට අප සැමට ඔවුන් සුවිශේෂී පවුලක් වනු ඇත.

මට මෙන්ම අප සියල්ලන්ටම විශ්වාසයි අපේ සෙසු සගයින් අසරණ වුවහොත් අපද සුළු හෝ කිසිම වටිනාකමක් නැති අය බවට පත්වන බව. ඇත්තෙන්ම අස්ථාවරත්වය දිගින් දිගටම පවත්නා අවස්ථාවකදී සාර්ථකව ක්‍රියාත්මක විය හැක්කේ ව්‍යාපාර කිහිපයකට පමණි. කෙසේවෙතත් දුෂ්කර තත්ත්වයන්ට ඔරොත්තුදීමට ශක්තිය ඇති ජාතියකට අභියෝගවලට සාර්ථකව මුහුණදීමට හැකිවනු ඇත. එසේම ශක්තිය, අධිෂ්ඨානය සහ නම්‍යශීලිත්වයෙන් සමන්විත සමාගමකටද මේ ආකාරයෙන්ම අභියෝග හමුවේ සාර්ථකව කටයුතු කළ හැකිය. එමනිසා මම නිහතමානීව අප මෙම දුෂ්කර තත්ත්වයන් යටතේ අපගේ ව්‍යාපාරය පවත්වාගෙන යාමට පමණක් නොව වඩාත් ශක්තිමත්ව විවිධාංගීකරණයට ලක්වෙමින් සජීවී ආකාරයෙන් කටයුතු කිරීමට හැකිවූ බව මේ අවස්ථාවේ පැහැදිලිව ප්‍රකාශ කරමි.

මෑතකදී සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාර සංචාරක කර්මාන්තයටත් පොදුවේ ආර්ථිකයටත් දරුණු බලපෑමක් එල්ල කළ බව අපි සියලුදෙනාම දන්නෙමු. ඒ වාගේම එම සිදුවීම ශ්‍රී ලාංකිකයින් සැමටම එකාවන්ව එකට එක්වී පෙරට වඩා ශක්තිමත්ව නැගී සිටිය යුතු බවට අවධාරණය කිරීමට හේතුවිය. ත්‍රස්තවාදය ලෝකයේ සෑම ස්ථානයකම ප්‍රජාතන්ත්‍රවාදයට තර්ජනයක් එල්ල කරනු ලබයි. ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන සියලුම රටවල් තමන්ගේ රටවැසියන්ට ශ්‍රී ලංකාවට පැමිණීමටත් එවැනි ප්‍රහාරයන්ගෙන් ඇතිවූ අයහපත් බලපෑම අවම කිරීමටත් උනන්දු කරනු ඇතැයි මම අපේක්ෂා කරමි.

සභාපතිතුමාගේ පණිවිඩය

අපගේ ක්‍රියාකාරිත්වය

2018 වසරේ අවසන් කාර්තුවේ ඉහළම සංචාරක පැමිණීමක් වාර්තාවූ කාල සීමාවේදී අමුත්තන් විශාල සංඛ්‍යාවක් හෝටලය වෙත ආකර්ෂණය කරගැනීමට සමාගම සමත්විය. කෙසේවෙතත් රටේ පැවති අයහපත් දේශපාලන වාතාවරණය නිසා අප අපේක්ෂා කළ ප්‍රතිලාභ ලබාගැනීමට අපොහොසත් විණි.

2018 වසරේ ඔක්තෝබර් මාසයේ සිට හෝටලය පෙනෙනතෙක් මානයේ නිතර මහජන උද්ඝෝෂණ පැවැත්විණි. මෙම සියලුම අභියෝග සමගින් හිල්ටන් කළමිබු එහි මූලික මූලධර්ම එනම් ගුණාත්මකභාවය, කාර්ය මණ්ඩලය, කැපවීම සහ කණ්ඩායම් හැඟීම මත පිහිටා සිටිමින් වසර පුරා පැවති අභියෝගවලට සාර්ථකව මුහුණදෙමින් කැපී පෙනෙන අයුරින් තම ස්ථාවරත්වය සහ සම්පත්වලින්, පරිපූර්ණත්වය මැනවින් විදහා දැක්වීමට සමත්විය.

නැවත අලුත්වැඩියා කිරීමේ කටයුතුවල ප්‍රමාදයක් ඇතිවූවත් මෙම ක්ෂේත්‍රයට අලුතින් එක්වූ නව අංග සමගින් සාර්ථකව තරඟ වැදීමට අපට හැකිවූ අතර පසුගිය වසරට සාපේක්ෂව ආදායම අඩුවූයේ ඉතා සුළුවෙනි. 2018 වසරේ දී ලැබීමට තිබූ ලාභයට 2017 වසරේ මුල්අවධියේදී සිදුකරන ලද පළමු අදියරේ අලුත්වැඩියා කටයුතු සඳහා වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම් අඩුකිරීම මගින් සැලකියයුතු බලපෑමක් සිදුවිය.

කෙසේවෙතත් මේ අතර ධනාත්මක තත්ත්වයන් ගණනාවක් ද දක්නට හැකිවිය. නවීකරණය කරන ලද ආහාරපාන වෙළඳ කවුළුවලින් ඉහළ මට්ටමේ ආදායමක් ලැබීම සහ ඒවායේ ඉහළ මට්ටමේ ක්‍රියාකාරිත්වයක් වාර්තාවීම, MICE ක්ෂේත්‍රයේ ව්‍යාපාර වර්ධනය වීම මගින් හිල්ටන් කළමිබු ව්‍යාපාර ක්ෂේත්‍රයේ විශේෂ අවස්ථාවන් සඳහා වඩාත් සිත්ගත් ස්ථානය බවට පෙනී ගියේය.

අමුත්තන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හිල්ටන් හෝටලය ආරක්ෂක උපකරණ සහ තාක්ෂණය වෙනුවෙන් කැපීපෙනෙන ආයෝජනයක් සිදුකර තිබේ. මෙය මෑතකාලීනව තවදුරටත් ශක්තිමත් කිරීමට පියවර ගනු ලැබිණි. කොළඹ නගරයේ අප දිනා ගෙන තිබෙන ඉහළ මට්ටමේ නාමය සහ හෝටල් ක්ෂේත්‍රයේ අප විසින් සපයනු ලබන ආරක්ෂාව සහ රැකවරණය අපගේ අමුත්තන් සහ අපගේ ව්‍යාපාරික ගනුදෙනුකරුවන් තුළ අප කෙරෙහි දැඩි විශ්වාසයක් ජනිත කිරීමට සමත්වී තිබේ.

අප සෑම විටම හෝටල් ක්ෂේත්‍රයේ අපගේ වර්ධනය අඛණ්ඩවම පවත්වාගෙන යාම සඳහා මධ්‍යම සහ දීර්ඝකාලීන දැක්මක් සහිතව කටයුතු කිරීමට අවධානය යොමු කර තිබේ. මෙම වසරේද එය නොවෙනස්ව පවත්නා බවට මා විශ්වාස කරන අතර මෙම කර්මාන්තය කෙටි කාලයක් තුළ නැවත යථා තත්ත්වයට පත්වනු ඇතැයි මම විශ්වාස කරමි. ශ්‍රී ලංකාවට සංචාරය කිරීමේ සීමාවන් ඉවත් කර තිබෙන අතර සංචාරකයින්ට නිවාඩුවක් ගත කිරීම සඳහා ශ්‍රී ලංකාව තෝරාගැනීමට නැවත වතාවක් විශ්වාසය ගොඩනැංවීමට එය හේතුවී තිබේ.

2019 වසර පිළිබඳව ධනාත්මක ප්‍රක්ෂේපණ සැලකිල්ලට ගනිමින් අප එක්ව වැඩ කිරීම තුළින් ශ්‍රී ලංකාවට නැවත පැමිණීමට සංචාරකයින් තුළ විශ්වාසය ගොඩනැංවීමට කටයුතු කිරීමට හැකිවනු ඇතැයි මම සම්පූර්ණ විශ්වාසය තබමි.

2018 සංචාරක කර්මාන්තය

2018 වසරේදී සිදුවූ සංචාරක ආගමනයේ යහපත් වර්ධනයත් සමගින් සංචාරක කර්මාන්තයෙන් උපයන ආදායම් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලබාදෙන ප්‍රධානතම මූලාශ්‍රය බවට පත්වෙමින් තිබේ. 2018 වසරේදී එක් වසරකදී වාර්තාවූ ඉහළම අගය සනිටුහන් කරමින් 10.3%කින් 2,333,796 දක්වා වර්ධනය විය.

නැගෙනහිර ආසියාවෙන් සහ මැදපෙරදිගින් හැරුණු විට අනෙකුත් සියලු ප්‍රදේශවලින් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව 2018 වසරේදී වර්ධනය විය. 2017 වසරේ සංචාරක කර්මාන්තයෙන් උපයන ලද ආදායම වන ඇමරිකන් ඩොලර් මිලියන 3925 සමග සංසන්දනය කරන විට 2018 වසරේ දී සංචාරක කර්මාන්තයෙන් ඉපයූ ආදායම එනම් ඇමරිකන් ඩොලර් මිලියන 4381 වූ අතර එය 11.6% කින් වර්ධනය වීමකි. සංචාරකයින් විසින් සිදුකරනු ලබන සාමාන්‍ය වියදම ඉහළ යාමද මෙයට යම් තාක් දුරකට බලපෑම් සිදුකර තිබේ.

සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් සිදුකරන ලද ආයෝජන 2018 වසරේදී තවදුරටත් වර්ධනය වීම අපව දිරිගන්වන සුලුවේ. 2018 වසරේදී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට හෝටල් ව්‍යාපෘති යෝජනා 141 ක් ලැබිණි. මෙහි සමස්ත වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 919 කි. 2017 දී ලැබුණු ව්‍යාපෘති යෝජනා 95 හි වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 95 කි. සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘති යෝජනා 44ක් අනුමත කරන ලද අතර මෙහි ආයෝජනයන්හි වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 201 ක් විය. එමගින් සංචාරක කර්මාන්තයට අලුතින් කාමර 1302 ක් එක් කරනු ලැබිණි.

අනාගත දැක්ම

සංචාරක කර්මාන්තය පසුගිය කාලසීමාව තුළ යහපත් අන්දමින් ක්‍රියාත්මක වූ බැවින් 2019 වසරේදී සියලුම අංශයන්ගෙන් ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරනු ලැබිණි. කෙසේවෙතත් පාස්කු ඉරුදින සිදුවූ ප්‍රහාරයත් සමගින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට මෙම කර්මාන්තය නැවත යථා තත්ත්වයට පත්කිරීමට සහ එහි ප්‍රගමනය නැවත අත්පත් කරගැනීමේ අභියෝගයට මුහුණ දීමට සිදුවිය.

මෙම තීරණාත්මක මොහොතේදී එයට අවශ්‍ය ප්‍රතිචාර දක්වමින් රජය සංචාරක කර්මාන්තය නැවත යථාතත්ත්වයට

පළමුවෙන්ම පාස්කු ඉරුදින සිදුවූ ත්‍රස්ත ප්‍රහාරයෙන් ජීවිත අහිමිවූ පුද්ගලයින්ගේ ඥාති හිතවතුන්ට මාගේ මහත් සංවේගය පුදකර සිටිමි. හිල්ටන් හෝටලයද මෙම ප්‍රහාරයේ ගොදුරක් බවට පත්විය. අපගේ ආදරණීය ජපන් ජාතික සූපවේදී හිකරු තකහාෂිගේ ආදරණීය බිරිඳ කඹරි තකහාෂි පාස්කු ඉරිදා දිනයේදී මරණයට පත්වූවාය. හිකරු සහ ඔහුගේ පවුලේ අය කොළඹ හිල්ටන් හෝටලයේ වසර හතරකට වැඩි කාලසීමාවක් සේවය කළේය. ඔහු සහ ඔහුගේ කුඩා දරුවන් දෙදෙනාට කඹරි අහිමිවීම විශ්වාස කිරීමට නොහැකි විය. මෙම සිදුවීමෙන් මාස තුනකට පසුව හිකරු ඔහුගේ දියණිය ඇමි සහ පුතා යු සමගින් නැවතත් ජපානයේ සිට ශ්‍රී ලංකාවට හිල්ටන් කළමිබු වෙත පැමිණීම පිළිබඳව මාගේ ගෞරවාදරය ඔවුන්ට පුදකරමි. මම අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය, විධායක සහ කාර්ය මණ්ඩලය වෙනුවෙන් තකහාෂි පවුලේ සියලුදෙනාටම අපගේ කොන්දේසි විරහිත සහයෝගය ප්‍රකාශ කරමි. ඔවුන් අපගේ රටට හෝටලයට සහ අප සෑම දෙනාටම සුවිශේෂී පවුලක් වනු ඇත.

පත් කිරීම සඳහා සහනදායී ණය ආධාර සහ වෙනත් අන්දමේ පහසුකම් සහ දිරිගැන්වීම් ලබාදීමට කටයුතු කරමින් සිටී. කර්මාන්තය සහ ආර්ථිකය ගොඩනැංවීමට සියලුම පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණයෙන් යුත් ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වේ.

කර්මාන්තය හැකි ඉක්මනින් යථා තත්ත්වයට පත් කිරීමටත් එමගින් මෙම ක්ෂේත්‍රයට සිදුවන සෘණාත්මක බලපෑම් අවම කරගැනීමටත් අවශ්‍ය වන්නාවූ කෙටිකාලීන සහ මධ්‍ය කාලීන සැලසුම් සකස් කිරීම සඳහා රජයට සහාය දීමට පෞද්ගලික අංශය ඉතා කැමැත්තෙන් සැදී පැහැදී සිටී.

මුහුණු දීමට සිදුවූ බාධක හමුවේ වුවත් සංචාරක කර්මාන්තය අඛණ්ඩව පවත්වාගෙන යාමටත් වඩාත් ශක්තිමත් ආකාරයෙන් ගොඩනැගීමටත් සූදානම්ව සිටී. ශ්‍රී ලංකාව සංචාරක කර්මාන්තය සඳහා සූදානම්ව සිටින බවට ලොව පුරා ප්‍රචාරය කිරීමට රජය විසින් සක්‍රිය අලෙවි ප්‍රවර්ධන ප්‍රචාරක වැඩ පිළිවෙළක් ආරම්භ කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

මෙහිදී වඩාත් ශක්තිමත්ව ඉදිරියට ගමන් කිරීම සඳහා ක්ෂේත්‍රයේ සියලුම පාර්ශ්වකරුවන් සාමූහිකව තීරණාත්මක කාර්යභාරයක් සිදුකළ යුතුය. මෙහිදී හිල්ටන් වෙළඳනාමය තුළින් ක්ෂේත්‍රයේ කැපී පෙනෙන වෙනසක් සිදුකරන්නේ කෙසේද යන්න පිළිබඳව අපි සැලකිලිමත් වන්නෙමු. අප පිළිබඳව සහ අප සමග සිටින ජනතාව සම්බන්ධයෙන් විශ්වාසය තබමින් අඛණ්ඩ වර්ධනයක් පවත්වා ගැනීමට අපට පවත්නා ශක්තිය පිළිබඳව මම දැඩි විශ්වාසයෙන් සිටිමි.

පිළිගැන්වීම

අපගේ පාරිභෝගිකයන්ට සහ ආගන්තුක සත්කාරය පිළිබඳව අසමසම වූ හිල්ටන් වෙළඳනාමය කෙරෙහි විශ්වාසය තැබූ අපගේ අමුත්තන්ට මාගේ මහත් කෘතඥතාව පිරිනමමි. සියලුම බාධක හමුවේ ආදායම් උත්පාදනය කිරීමට අපගේ සමාගම මෙහෙයවූ අධ්‍යක්ෂ මණ්ඩලයේ මාගේ සහෘදයින්ට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ දැඩි කැපවීම මේ අවස්ථාවේ සිහිපත් කරමි. ශ්‍රී ලංකාවේ කොළඹ නගරයේ පිහිටි තරු 5 හෝටල් අතරින් හිල්ටන් හෝටලය ප්‍රමුඛස්ථානයේ පසුවීමට සාමාන්‍යාධිකාරි තුමාගේ සහ කාර්ය මණ්ඩලයේ කැපවීම තීරණාත්මක සාධකයක් වේ. අපගේ පාර්ශවකරුවන් සියලුම දෙනාට ඔවුන් විසින් ලබාදුන්නාවූ සහායට මේ අවස්ථාවේ මාගේ ස්තුතිය පුදකරමි. ජාතියක් ලෙස අපි සියලු දෙනා මෙම අවස්ථාවේ අපට එල්ලවූ බාධාවන් අපගේ අනාගත අභියෝගයන් ජයගැනීම සඳහා උපයෝගී කරගැනීමට අපට හැකිවනු ඇතැයි මම නිසැකවම ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.



ක්‍රිෂාන්ත ප්‍රසාද් කුරේ
සභාපති

නිසි බලධාරි සහ අධ්‍යක්ෂ මණ්ඩලය



වමේ සිට, සිටගෙන සිටින : චතුරි රණසිංහ මහත්මිය, ධීෂණා අමරසේකර මෙනවිය, අතුල සේනානායක මහතා, සංජීව් අලස් මහතා, ප්‍රවීර් සමරසිංහ මහතා, ධනුක සමරසිංහ මහතා, ජේ.එම්.යූ.පී ජයමහ මහතා

වමේ සිට, වාඩි වී සිටින : සී. රාමචන්ද්‍ර මහතා, ක්‍රිෂාන්ත ප්‍රසාද් කුරේ මහතා, සොනාලි ලියනමාන මහත්මිය, ටෙහානි මැතිව් මහත්මිය.



නිසි බලධාරි සහ අධ්‍යක්ෂ මණ්ඩලය

ක්‍රිෂාන්ත ප්‍රසාද් කුරේ මහතා
සභාපති

මාධ්‍ය ක්ෂේත්‍රයේ ගැඹුරු අත්දැකීම් ඇති කුරේ මහතා ව්‍යාපාරික විධායක නිලධාරිවරයෙකු වන අතර රිචඩ් පීරිස් සහ සමාගම, සෙලින්කෝ සමූහය සහ කැපිටල් මහාරාජා සංවිධානය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රමුඛස්ථානය දිනාගත් ශ්‍රී ලාංකික සමාගම් කිහිපයකට ඉහළ මට්ටමේ දායකත්වයක් ලබාදී ඇත. ඔහු මිඩ්ල්සෙක්ස් විශ්ව විද්‍යාලයෙන් දේශපාලන විද්‍යාව හා නීතිය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා ඇත.

උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු ක්‍රිෂාන්ත කුරේ සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේ විදේශ රටවල ජීවත් වන ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් සතිපතා පුවත්පතක් ප්‍රකාශයට පත් කළ මාධ්‍ය ආයතනයක් වන ලංකා ලින්ක්හිය. ඉන් පසුව ඔහු සෙලින්කෝ සමූහයට සම්බන්ධ විය. ඉන්පසු ඔහු රිචඩ් පීරිස් සහ සමාගමේ ව්‍යාපාර සංවර්ධන සමූහ ප්‍රධානියා බවට පත්විය. කුරේ මහතා රිවිර මාධ්‍ය ආයතනයේ ආරම්භය සනිටුහන් කළ අතර එහිදී ඔහු ආරම්භක ප්‍රධාන විධායක නිලධාරියා ලෙස සේවය කළේය. මෙය ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයට අයත් ප්‍රථම ස්වාධීන මාධ්‍ය ආයතනය විය. ඔහුගේ භාරකාරත්වය යටතේ ප්‍රධාන පුවත්පත් දෙකක් වන ද නේෂන් සහ රිවිර එළිදක්වන ලද අතර එම පුවත්පත් පුළුල් විශ්වසනීයත්වයක් දිනාගෙන සහ ඉහළ මට්ටමේ අලෙවියක් වාර්තා කරන ලදී.

කැපිටල් මහාරාජා සංවිධානයේ දී ඔහු සමාගම විසින් මෙහෙයවනු ලබන රූපවාහිනී සහ ගුවන් විදුලි මධ්‍යස්ථාන කිහිපයක් හරහා සිදුකරනු ලැබූ ප්‍රවෘත්ති විකාශය ඒකාබද්ධ කිරීම හා සම්බන්ධීකරණය කිරීම සඳහා ආයතනික ක්‍රියාදාමයන් සහ යහ භාවිතයන් සකස් කළේය.

ශ්‍රී ලංකා ටෙලිකොම්හි හිටපු අධ්‍යක්ෂවරයෙකු වන කුරේ මහතා ඇසෝසියේටඩ් නිව්ස්පේපර් සිලෝන් ලිමිටඩ් සීමිත සමාගමේ ("ලේක් හවුස්") වත්මන් සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා වන අතර ඔහු ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් සේවය කරයි.

චතුරි රණසිංහ මහත්මිය
අධ්‍යක්ෂ

චතුරි රණසිංහ මහත්මිය නීතිඥවරියක් සහ ප්‍රසිද්ධ නොතාරිස්වරියක් වේ. ඇය 1980 සැප්තැම්බර් මාසයේදී ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරියක ලෙස බැඳුණු අතර 1989 දී එක්සත් රාජධානියේ සොලිසිටර් විභාගය සම්පූර්ණ කළාය. ඇය 1992 සිට 2015 දක්වා ගුණවර්ධන සහ රණසිංහ ඇසෝසියේට්ස් නමැති නීති ආයතනයේ පාර්ශ්වකාරිනියක් ලෙස කටයුතු කරනු ලැබූ අතර වර්තමානයේ චතුරි රණසිංහ ඇසෝසියේට්ස් නමැති නීතිඥ සමාගමක් පවත්වාගෙන යනු ලබයි.

ඇය, කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලයේ සභාපතිනිය, ශ්‍රී ලංකාවේ ජාතික සමඵ මණ්ඩලයේ ප්‍රධානියා, 1990 අංක 46 දරන කාර්මික ප්‍රවර්ධන පනත යටතේ කාර්මිකකරණ කොමිෂන් සභාවේ සාමාජිකාවක, කාන්තා ව්‍යවසායකත්ව මණ්ඩලයේ සාර්ක් මණ්ඩලයේ උප සභාපතිනිය සහ තවත් සංවිධාන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් වශයෙන්ද සේවය කරනු ලබයි.

ධීෂණා අමරසේකර මෙනවිය
අධ්‍යක්ෂ

ධීෂණා අමරසේකර මෙනවිය ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩීසීහි ඇමරිකන් විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය (අන්තර්ජාතික අලෙවිකරණය පිළිබඳ විශේෂඥතාව සහිතව) පිළිබඳ විද්‍යාවේදී උපාධිය හිමිකරගෙන සිටින අතර ඇය ඇමරිකා එක්සත් ජනපදයේ හවායි විශ්වවිද්‍යාලයේ සංචාර කළමනාකරණය (හෝටල් කළමනාකරණය පිළිබඳ විශේෂඥතාව සහිතව) පිළිබඳ විද්‍යාවේදී උපාධියක් හිමි කරගෙන සිටී. ඇය වෘත්තිමය වශයෙන් හෝටල්කරුවෙකු වශයෙන් කටයුතු කරයි. සම්මානලාභී බුටීක් හෝටලයක් වන තේවා රෙසිඩන්සි හෝටලයේ සහ සම්මානලාභී අවන්හලක් වන මහනුවර පිහිටි තේවා කුසීන් අවන්හලේ කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් ඇය කටයුතු කරයි. තේවා රෙසිඩන්සි හෝටලය සහ තේවා කුසීන් වසර 10 ක් පුරා අඛණ්ඩව ජාත්‍යන්තර සම්මාන රාශියක් දිනා ගෙන ඇත. 2018 සඳහා නවතම සම්මාන - "ආසියාවේ වඩාත්ම සිත් ඇදගන්නාසුලු දසුන්" - එක්සත් රාජධානියේ බුටීක් හෝටල් සම්මානය, දකුණු ආසියානු සංචාරක සම්මාන උලෙළේදී "ආසියාවේ සහ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බුටීක් හෝටලය", ශ්‍රී ලංකා සංචාරක සම්මානය - "හොඳම හෝටල් වෙබ් අඩවිය" සම්මානයෙන් පිදුම් ලැබීය. අඛණ්ඩව වසර 9 ක් - තේවා රෙසිඩන්සි සහ අවුරුදු 5 - තේවා කුසීන් "සංචාර උපදේශක සේවා විශිෂ්ටතා සම්මානය" යන සම්මාන දිනාගෙන ඇත.

ඇය හතා යෝගා ගුරුවරියක (RYT 200) මෙන්ම යෝගී ජීවන රටා උපදේශකවරියකි.

අතුල සේනානායක මහතා
අධ්‍යක්ෂ

ඕස්ට්‍රියාවේ සැල්ස්බර්ග්හි ලෝක ප්‍රසිද්ධ හෝටල් කළමනාකරණ හා සංචාරක ආයතනයෙන් සිය වෘත්තීය අධ්‍යාපනය සම්මාන සාමර්ථ්‍යයක් ද සමගින් නිමකළ අතුල සේනානායක මහතා ආගන්තුක සත්කාර පිළිබඳ වෘත්තීය වේදියෙකි. එක්සත් රාජධානියේ හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනයේ සේවයට එක්වූ ඒ මහතා, පාර්ක්ලේන්, කෙන්සිංටන් සහ ස්ට්‍රැට්ෆෝඩ් - ඔපෝන් - ඇවෝන් හෝටල්වල වසර පහක් සේවයකර ප්‍රණීත ආහාර පාන කලාවේ මෙහෙයුම් දක්වා වෘත්තීය උසස්වීම් ලැබුවෙකි. ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමෙන් අනතුරුව ලංකා ඔබරොයි (දැන් සිනමන් ග්‍රෑන්ඩ්) හෝටලයේ සහකාර ආහාර හා පාන කළමනාකරු වශයෙන් සේවයට එක්වූ ඔහු 1987 වර්ෂයේදී හිල්ටන් කළම්බු හෝටලයේ සමාරම්භක කාර්ය මණ්ඩලයට එක් වෙමින් එහි ආහාර හා පාන කළමනාකරු තනතුරට පත් විය. කොළඹ අගනගරයේ ප්‍රමුඛතම හෝටලය බවට පත්වූ හිල්ටන් හෝටලයේ සමාරම්භයට සහ පූර්ව හා පශ්චාත් සංවර්ධන කාර්යයන් හා සම්බන්ධව ඔහු කටයුතු කළේය.

ප්‍රණීත ආහාරපාන පිළිගැන්වීමේ විශේෂිත අවන්හල් මෙහෙයුම්, ස්ථානීය ආහාරපාන සැපයුම් හා සේවාලාභීන්ගේ අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සලසාදෙනු ලබන කේටරින් සේවා ක්ෂේත්‍රයේ විශේෂඥයන් වන දොන් ස්ටැන්ලීස් සමූහය සාර්ථකව ආරම්භ කිරීම පිණිස 1991 වර්ෂයේදී සේනානායක මහතා හිල්ටන් හෝටලයේ සේවයෙන් ඉවත් විය. මෙම ක්ෂේත්‍රයේ වසර 40ක් පුරා දිවෙන සිය සේවා කාලය තුළ ලැබූ අත්දැකීම තුළින් අත්කරගත් ජාත්‍යන්තර හෝටල් දාම මෙහෙයුම්කරුවන් සමග කටයුතු කිරීම පිළිබඳව තීක්ෂණ ඥානයක් සහ ආහාර හා පාන පිළිගැන්වීමේ සේවා අංශය විශේෂකොට හෝටල් මෙහෙයුම් ක්ෂේත්‍රයේ සියලු අංශ පිළිබඳ මනා අවබෝධයක් සේනානායක මහතා සතුවේ.

සංජීව් අලස් මහතා
අධ්‍යක්ෂ

සංජීව් අලස් මහතා ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්වවිද්‍යාලයෙන් නීතිය පිළිබඳව ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර එක්සත් රාජධානියේ වෝර්වික් ව්‍යාපාරික අධ්‍යයන පාසලෙන් ව්‍යාපාර අධ්‍යයන / නීතිය හා ව්‍යාපාර (බීඒ ගෞරව) උපාධිය ලබා ඇත. ඔහු ඩෙන්මාර්කය, ඕස්ට්‍රේලියාව සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල ව්‍යාපාරික කටයුතුවල යෙදෙන අයිඑස්ඕ 9001 - 2015 සහතික ලත් වෙබ් ජංගම හා මෘදුකාංග සේවා සපයන්නෙකු වන සේබරියන් (පුද්ගලික) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා වේ. ඔහු LED (විශාල පුළුල් තිර වීඩියෝ ප්‍රදර්ශන පුවරු) දේශීය මට්ටමෙන් නිෂ්පාදනය හා බෙදා හැරීම සිදුකරන ඇටෝම් ටෙක්නොලොජීස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරයා ද වේ. සංජීව් අලස් මහතා සුප්‍රසිද්ධ ලැයිස්තුගත සමාගම් වන M/s රේණුකා කැපිටල් පීඑල්සී, ඉන්දු මැලේ පීඑල්සී, M/s සෙලින්සින් පීඑල්සී සහ ගුඩ් හෝප් පීඑල්සී වැනි සමාගම්වල අධ්‍යක්ෂවරයෙක් ද වේ. මෙයට අමතරව ඔහු බාහිර ප්‍රචාරක ඩිජිටල් මාධ්‍ය අලෙවි ප්‍රවර්ධන සමාගමක් වන ඇටොමීඩියාහි අධ්‍යක්ෂවරයා ද වේ.

ප්‍රවීර් සමරසිංහ මහතා
අධ්‍යක්ෂ

කොළඹ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය හා හැව්ලොක් සිටි ආදිය නිර්මාණය කළ ප්‍රමුඛ පෙළේ දේපළ සංවර්ධන සමාගමක් වන ඕවර්සීස් රියල්ටි (ලංකා) පීඑල්සී සමාගමේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී ලෙස ප්‍රවීර් සමරසිංහ මහතා සේවය කරයි. වසර 30ක වෘත්තීය හා වාණිජමය කටයුතු පිළිබඳ අත්දැකීම් ලබා ඇති ඔහු පොදු ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවන සමාගම් කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩලවල සේවය කරයි. ලංකා වාණිජ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වන ඔහු ලංකාවේ සේව්‍යයන්ගේ සංගමයේ සභාපතිවරයා ලෙස ද කටයුතු කරයි. ශ්‍රී ලංකා සභාධිපත්‍ය සංවර්ධකයන්ගේ සංගමයේ, ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ, ශ්‍රී ලංකා කර්මාන්තකරුවන්ගේ සංගමයේ හිටපු සභාපතිවරයෙකු වන ඒ මහතා වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ ශ්‍රී ලංකා අංශයේ හිටපු සභාපතිවරයෙකු මෙන්ම CIMA ග්ලෝබල්හි හිටපු පාලක සභා සාමාජිකයෙක් ද වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සහ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ අධි සාමාජිකයෙකු වන සමරසිංහ මහතා ව්‍යාපාර පරිපාලනපති උපාධිධාරියෙකි.

ධනුක සමරසිංහ මහතා
අධ්‍යක්ෂ

මූලෝපායික ව්‍යාපාර කළමනාකරණ පසුබිමකින් හෙබි ධනුක සමරසිංහ මහතා උපායමාර්ග පිළිබඳ විශේෂඥයෙකු වන අතර 2015 සිට හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී හි සේවය කරයි. ඕස්ට්‍රේලියාවේ ඩෙකින් විශ්ව විද්‍යාලයේ සිය අධ්‍යාපන කටයුතු නිමකිරීමෙන් පසුව පෙරළා තම මව්රටට පැමිණි ධනුක සමරසිංහ මහතා සිය පවුලේ වැව්ලි හා රබර් නිෂ්පාදන ව්‍යාපාරික කටයුතුවල නිරත විය. ඉන්පසුව ශ්‍රී ලංකාවේ වේගයෙන් වර්ධනය වන විවිධ ක්ෂේත්‍රයන්හි ව්‍යාපාරික කටයුතුවල නියැලෙන ඒකාබද්ධිත සමාගමක් වන සීමාසහිත ටීඒඩී හොල්ඩිංග්ස් (පෞද්ගලික) සමාගමේ මූලාරම්භක සම සභාපතිවරයා ලෙස ඔහු ක්‍රියා කළේය. ටීඒඩී හොල්ඩිංග්ස් සමාගම මේ වන විට බලශක්ති, වැව්ලි, දේපළ, ආගන්තුක සත්කාර, හා වෙළඳභාණ්ඩ තැරැව්කරණය ආදී ක්ෂේත්‍රවල සිය ව්‍යාපාරික කටයුතු සිදු කරයි. සමාගම් සමූහයේ සමස්ත මෙහෙයුම් සඳහා උපායමාර්ගික විශේෂඥයෙකු ලෙස කාර්යභාරයක් ඉටු කරමින් සභාපතිවරයා ලෙස ඔහු කටයුතු කරන අතර උප සමාගම් 27 කට අධික සංඛ්‍යාවක් සමූහය සතුව ඇත. ඔහු ශ්‍රී ලංකාවේ 4 වන විශාලතම තේ තැරැව්කාර සමාගම වන මර්කන්ටයිල් ප්‍රොඩක්ට් බ්‍රෝකර්ස්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ද සේවය කරයි. ඔහු ශ්‍රී ලංකාවේ පිහිටි ඉතා සුවිශේෂී හෝටලයක් වන හූන්නස් ෆෝල්ස් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක්ද වේ.

නිසි බලධාරි සහ අධ්‍යක්ෂ මණ්ඩලය

ජේ.එම්.ය්‍ූ.පී. ජයමහ මහතා
අධ්‍යක්ෂ

මහාභාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කරන ජයමහ මහතා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ සහ මූලික අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ද වේ. ශ්‍රී ලංකා රජයේ ගණකාධිකරණ සේවයේ නිලධාරියෙකු වන ඒ මහතා මූල්‍ය හා ගණකාධිකරණ ක්ෂේත්‍රයේ වසර 25 කට ආසන්න සිය සේවා කාලය තුළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළු රජයේ ප්‍රමුඛ ආයතන රැසක සේවය කර ඇති දක්ෂ නිලධාරියෙකි. ඔහු ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකු වන අතර රාජ්‍ය මූල්‍ය හා සංවර්ධන ගණකාධිකාරි ආයතනයේ සහකාර සාමාජිකයෙකි. කොළඹ විශ්ව විද්‍යාලයේ සංවර්ධන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකු වන ජයමහ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ බලපත්‍රධාරී සහතිකය ද හිමිකරගෙන සිටී.

ඔහු ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සහ ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකි.

සී. රාමචන්ද්‍රන් මහතා
නිසි බලධාරි

රාමචන්ද්‍රන් මහතා ඒසියා ඇසට් මැනේජ්මන්ට් ආයතනයේ සහ එන් වෛත්‍යලිංගම් සහ සමාගමේ සභාපතිවරයා ලෙස කටයුතු කරනු ලබයි. ඔහු යූබී ෆිනෑන්ස් ලිමිටඩ්හි විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස ද ටින්පැක් (පුද්ගලික) සමාගමේ සහ ලංකාවේ ගැල්වනින් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්හි ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස ද සේවය කරයි. විගණනය, තේ අපනයනය, මූල්‍ය සේවා සහ ඇසුරුම්කරණය යන ක්ෂේත්‍රවල වසර 40 කට වැඩි පළපුරුද්දක් ඔහු සතුව ඇත. ඔහු ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (ICASL) සාමාජිකයෙකි. 1975-78 දක්වා සමරසිංහ සහ සමාගමේ, මෙසස් හුලුගල්ලේ හවුල්කරුවෙකු ලෙස සේවය කළ ඔහු 1978 දී ලිප්ටන් සිලෝන් සමාගමට බැඳී 1992 දී එයින් ඉවත්ව එක්සත් රාජධානියේ ලිප්ටන් ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි / සමාගම් ලේකම් ලෙස මාස හයක් සේවය කළේය. පසුව ඔහු ලංකා කොමර්ෂල් බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ සාමාන්‍යාධිකාරි ලෙස කටයුතු කළේය. වර්නා ලිමිටඩ්හි මූල්‍ය කළමනාකරු / සමාගම් ලේකම්; සහ යුනි වෝකර්ස් සමූහයේ ප්‍රධාන මූල්‍ය නිලධාරිවරයා ලෙස ද කටයුතු කළේය. ඔහු 2005-2015 දක්වා යුනි වෝකර් ඇසුරුම් සමාගමේ විධායක අධ්‍යක්ෂවරයා විය. ඔහු 2003 දී සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ පෞද්ගලීකරණයට ලක්කරන ලද සතොස සිල්ලර සමාගමේ අධ්‍යක්ෂවරයෙකි.

සොනාලි ලියනමාන මහත්මිය
අධ්‍යක්ෂ

දේශීය මෙන්ම විදේශීය සමාගම්වල සේවය කරමින් වසර 25කට අධික සේවා පළපුරුද්දක් ලබා ඇති සොනාලි ලියනමාන මහත්මිය චාරිකා හා සංචාරක කර්මාන්තයේ ජ්‍යෙෂ්ඨ විශේෂඥ නිලධාරිනියකි. ලාභාලාභ ප්‍රකාශ, කාර්ය මණ්ඩල කළමනාකරණය, අලාභ පාලනය, ගුවන්සේවා දිරි දීමනා සම්මුති සාකච්ඡා හා නිෂ්පාදන සංවර්ධනය ආදිය තුළින් කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ප්‍රශස්ත කිරීම ඇතුළුව සමාගම් ප්‍රතිපත්ති හා උපායමාර්ග රැසක් ඇය විසින් ක්‍රියාවට නංවා ඇත. නිෂ්පාදන සංවර්ධනය හා ජාත්‍යන්තර ගමනාන්ත අලෙවිකරණය, කණ්ඩායම්හි විනෝදාස්වාද පූර්ණ නිදහස් සංචාරක චාරිකා සැලසුම්කරණය පිළිබඳ විශේෂඥතාව ප්‍රගුණකොට ඇති සොනාලි ලියනමාන මහත්මිය මේ වනවිට වර්ල්ඩ්ලින්ක් සමාගම් සමූහයේ සාමාජික සමාගමක් වන ඉන්ටර්ග්ලෝබ් ට්‍රැවල් (පෞද්ගලික) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිනිය ලෙස සේවය කරයි. තවද, ශ්‍රී ලංකාවේ ඉතාලි ව්‍යාපාරික සභාවේ උප-සභාපතිනිය ලෙස ද ඇය කටයුතු කරයි.

ටෙහානි මැතිව් මහත්මිය
අධ්‍යක්ෂ

එක්සත් ජනපදයේ නිව් යෝර්ක්හි කොළොම්බියා විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිධාරිනියක වන ටෙහානි මැතිව් මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යවහාරික මනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය හිමි කර ගත්තාය. මොරටුව එක්ස්පෝ 80 පදනමේ (ටිරෝන් ප්‍රනාන්දු පදනම) ප්‍රධාන භාරකාරිය වන ඇය, විෂන් පැකේජිං (පෞද්ගලික) සමාගම, පැක්වෙල් ලංකා (පෞද්ගලික) සමාගම, සහ සීමාසහිත එල්ජේඑම් පීරිස් සහ සමාගම යන සමාගම්වල අධ්‍යක්ෂිකාවක් ද වේ. 1990 - 1993 දක්වා ප්‍රවෘත්ති හා ගුවන්විදුලි අමාත්‍යාංශයේ සහ 2001 - 2004 දක්වා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවා වනිතා ඒකකවල සභාපතිනිය වශයෙන් සේවය කළ ටෙහානි මහත්මිය 1996 -2003 දක්වා කාන්තා පිහිට ආයතනයේ ස්වේච්ඡා උපදේශිකාවක ලෙස ද ක්‍රියා කළාය. ශ්‍රී ලංකා ඇමරිකන් ඇලුම්නි ඇසෝසියේෂන්හි සාමාජිකාවක වන ඇය ශ්‍රී ලංකා කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලයේ සාමාජිකාවක් ද වේ.

කළමනාකාර කණ්ඩායම



වමේ සිට දකුණට : වී. කනකසබාපති මහතා, සුදර්ශන් ශ්‍රී රායන් මහතා, ශමාහිල් මොහිදීන් මහතා, ජූඩ් වික්‍රමරත්න මහතා

කළමනාකාර කණ්ඩායම

වී. කනකසබාපති මහතා
MPA (HARVARD), CPFA (LONDON) FCA, FPFA, FCMA
අධ්‍යක්ෂ මණ්ඩල උපදේශක

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික අධ්‍යක්ෂ ජනරාල් වී. කනකසබාපති මහතා, දැනට ශ්‍රී ලංකා මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස ද, යාපනය විශ්ව විද්‍යාලයේ පාලක සභාවේ සාමාජිකයෙකු ලෙස ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ රාජ්‍ය අංශයේ ශාඛාව වන රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ සභාපති ලෙස ද, රාජ්‍ය අංශයේ ගණකාධිකරණ ප්‍රමිති කමිටුවේ සභාපති ලෙස ද, ගණකාධිකාරිවරුන්ගේ දකුණු ආසියානු ෆෙඩරේෂණයේ රජයේ හා රාජ්‍ය අංශයේ ව්‍යවසාය ගණකාධිකරණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි. රාජ්‍ය අංශයේ වසර 40කට අධික සේවා කාලයක් සම්පූර්ණකර ඇති කනකසබාපති මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධීකාරක වශයෙන් ද සේවය කළේය. හාවර්ඩ් විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනපති උපාධිය හිමිකරගත් ඒ මහතා ලන්ඩනයේ වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරයෙක් ද වේ. ඔහු ශ්‍රී ලංකා ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ තාක්ෂණවේදීන්ගේ සංගමයේ අධි සාමාජිකයෙක් වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය හා සංවර්ධන ගණකාධිකරණ ආයතනයේ මූල්‍ය කළමනාකරණ උපදේශකවරයෙකු ලෙස සේවය කළ කනකසබාපති මහතා, මූල්‍ය අධ්‍යයන ඇකඩමියේ ජ්‍යෙෂ්ඨ මූල්‍ය උපදේශකයෙක් ද විය. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කළ ඒ මහතා මහජන බැංකුවේ, ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවේ, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ, සහ රාජ්‍ය අංශයේ ආයතන කිහිපයකම අධ්‍යක්ෂවරයෙකු ලෙස ද සේවය කළේය. ලංකා එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගමේ අධ්‍යක්ෂ / මූල්‍ය උපදේශක වශයෙන් ද ඔහු ක්‍රියා කළේය.

සුදර්ශන් ශ්‍රී රායන් මහතා
MBA, B.SC (HONS), FCCA, ACMA
ප්‍රධාන මූල්‍ය නිලධාරී

සුදර්ශන් ශ්‍රී රායන් මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා විද්‍යාවේදී (ගෞරව) උපාධිය හිමිකරගෙන සිටියි. ඔහු එක්සත් රාජධානියේ වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු මෙන්ම එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙක් ද වේ. 1987 වර්ෂයේ දෙසැම්බර් මාසයේ පටන් ඒ මහතා අප සමාගමේ සේවයේ නියුතුව සිටී.

ශමාහිල් මොහිදීන් මහතා
ACMA - UK
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී

ඔහු වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ (CIMA UK) සාමාජිකයෙකි. දේශීය හා විදේශීය ප්‍රමුඛපෙළේ ආයතන රැසක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු දරමින් වසර 20ක් ඉක්මවූ සේවා කාලයක් සම්පූර්ණකර ඇත. හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමට එක් වීමට පෙර එයිටිකන් ස්පෙන්ස් සමූහ සමාගමට අයත් එයිටිකන් ස්පෙන්ස් පවර් සමාගමේ අධ්‍යක්ෂ/උප-සභාපති වශයෙන් සේවය කළේය.

ජූඩ් වික්‍රමරත්න මහතා
ACMA -UK
ගණකාධිකාරී

එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙක් වන ජූඩ් වික්‍රමරත්න මහතා දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිය හදාරමින් සිටී. 2012 වර්ෂයේ දී අප සමාගමේ සේවයට එක්වූ ජූඩ් මහතා සතුව ගණකාධිකාරී ක්ෂේත්‍රයේ වසර 10 ක සේවා පළපුරුද්දක් සපුරා ඇත.

කළමනාකරණ සමාලෝචනය හා විශ්ලේෂණය

අප ගැන බිඳක්

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර සේවා ව්‍යාපාරයේ නියැලී සිටී. හිල්ටන් කළම්බු හෝටලයේ හිමිකාරිත්වය දරන අප සමාගම වර්ෂ 1983 දී සංස්ථාපනය කරන ලදී.

2018 වසරේ අපගේ ව්‍යාපාරික ක්‍රමෝපාය ප්‍රවේශ

පසුගිය වර්ෂය තුළ, හෝටලයේ උත්සව අවස්ථාවන් සඳහා යොදාගත හැකි පහසුකම් පුළුල් කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබාදීම, බහුවිධ උපාය මාර්ගික විධික්‍රම සමාගම විසින් ක්‍රියාවට නංවන ලදී. උත්සව සඳහා යොදාගත හැකි අවකාශයන් පුළුල් කිරීම මගින් MICE ව්‍යාපාර (සංචාරකයින් ලංකාවට ගෙන්වා ගැනීම) සඳහා කලාපීය වෙළඳපොළට සාර්ථකව මුහුණ දීමට අවස්ථාව ලබා දුන්නේය. නවීකරණය කරන ලද පොදු ස්ථානවලින් ලබා දෙන සන්නාම වටිනාකම සහ පිරිනමන සේවාවේ ගුණාත්මකභාවය සමගින්, නව පාරිභෝගිකයින්ගේ සිට ජාත්‍යන්තර මෙහෙයුම් කරුවන්ගේ වෙළඳපොළ දක්වා ඇති දැඩි තරගකාරිත්වයට සාර්ථකව මුහුණදෙමින් වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස එහි තත්ත්වය තවදුරටත් ඉදිරියට ගෙනයාමට හෝටලයට පහසුකම් සපයන ලදී.

අපගේ හෝටලයේ සේවාවේ ගුණාත්මකභාවය අපගේ සාර්ථකත්වයේ සාරය වූ අතර එය තවමත් අසමසම තත්ත්වයකින් පවතී. මෙම තත්ත්වය ස්ථාවරව පවත්වා ගැනීම සඳහා සමාගම අඛණ්ඩව තම සේවාවන්හි ගුණාත්මකභාවය පවත්වාගැනීම සඳහා ආයෝජන සිදුකරන අතර එය නොකඩවා පසුගිය වසරවල අඛණ්ඩවම හෝටලයේ මනා ක්‍රියාකාරිත්වයට පසුබිම සකස් කරන ලදී.

නව පෙනුමකින් යුත් උත්සව ශාලා නැවත විවෘත කිරීමත් සමගින් 2018 වසරේ සංචාරකයින් වැඩි වශයෙන් පැමිණෙන කාලසීමාවේදී වාර්තාගත සංචාරකයින් ප්‍රමාණයක් ආකර්ෂණය කරගැනීමට හෝටලය සමත් විය. 2018 වසරේ ඔක්තෝබර් මාසයේ සිට රටේ පැවති අස්ථාවර දේශපාලනික වාතාවරණය නිසා සමාගමට අපේක්ෂාකළ අන්දමින් කටයුතු කිරීමට නොහැකි වූ අතර හෝටලය පෙනෙන තෙක් මානයේ නිතර මහජන උද්ඝෝෂණ නිරන්තරයෙන් පැවැත්විණි.

සාර්ව ආර්ථික වටපිටාව

පහළ උද්ධමන වාතාවරණයක් මධ්‍යයේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2018 දී 3.2% දක්වා සුළු වර්ධනයක් පෙන්නුම් කළ අතර එයට විශාල වශයෙන් සහාය වූයේ 4.7% කින් ව්‍යාප්ත වූ සේවා අංශයේ ක්‍රියාකාරකම් සහ කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල 4.8% ක වර්ධනයයි. ප්‍රධාන වශයෙන් ඉදිකිරීම්වල පසුබෑමේ ප්‍රතිඵලයක් ලෙස කර්මාන්ත ක්‍රියාකාරකම් වර්ෂය තුළ 0.9% දක්වා සැලකිය යුතු ලෙස මන්දගාමී විය.

ගෝලීය හා දේශීය සාධක හේතුවෙන් බාහිර ආර්ථිකය මෙම වර්ෂය තුළ අස්ථාවර බවක් දක්නට ලැබිණි. ගෝලීය වශයෙන්, විශේෂයෙන් එක්සත් ජනපදයේ මූල්‍ය ප්‍රතිපත්ති සාමාන්‍යකරණය හේතුවෙන් ගෝලීය මූල්‍ය තත්ත්වයන් දැඩි වී ඇති අතර එමගින් නැගී එන වෙළඳපළ ආර්ථිකයන්ගෙන් ප්‍රාග්ධනය ඉවතට ගලා යාම සහ විශේෂයෙන්ම ද්විත්ව හිඟ ආර්ථිකයන්ගේ විනිමය අනුපාත කෙරෙහි දැඩි පීඩනයක් ඇති විය.

2018 අප්‍රේල් මස මැද භාගයේ සිට ශ්‍රී ලංකාව ද මෙම අහිතකර බලපෑමට මුහුණ දුන් අතර දේශපාලනික අවිනිශ්චිතතාවන් සහ වසරේ සිව්වන කාර්තුවේදී රටේ ස්ථෛර්‍ය අනුපාතිකයන් පහත වැටීම හේතුවෙන් මෙහි බලපෑම තවදුරටත් උග්‍ර විය. දේශීය වශයෙන්, වෙළඳ හිඟය ඉතිහාසයේ පළමු වතාවට ඇමරිකානු ඩොලර් බිලියන 10 ඉක්මවා ගිය අතර ඉතා සුළු මට්ටමක පැවති අපනයන ආදායම ආනයන වියදම් ඉහළ යාමත් සමග අපනයන ඉපැයීම්වල වර්ධනය අභිභවා ගියේය. සේවා අපනයන සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇතත්, වෙළඳාමේ වෙළඳ ශේෂයේ හිඟය, කම්කරු ප්‍රේෂණ ඒකාකාරීතත්ත්වයක පැවතීම සහ විදේශ පොළී ගෙවීම් ඉහළ යාම හේතුවෙන් වර්ෂය තුළ දළ දේශීය නිෂ්පාදිතයේ ජංගම ගිණුම් හිඟය 3.2% කින් වැඩි විය.

විනිමය අනුපාතය තීරණය කිරීම සඳහා මහ බැංකුව වෙළඳපළ පදනම් කරගත් විනිමය අනුපාත ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. විනිමය අනුපාතය 2018 මුල් මාස හතර තුළ සාපේක්ෂව ස්ථාවරව පැවති අතර ඉන් පසුව දේශීය හා බාහිර සාධක හේතුවෙන් එයට සැලකිය යුතු බලපෑමක් එල්ල විය. විනිමය අනුපාතය තීරණය කිරීමේදී මහ බැංකුව වැඩි නම්‍යතාවක් ලබා දෙන අතර අනවශ්‍ය අධික අස්ථාවරත්වය මැඩපැවැත්වීමට පමණක් මැදිහත් විය. අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම සහ දේශපාලන ස්ථාවරත්වයක් වැඩි කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, බාහිර අංශයේ ඔරොත්තු දීමේ හැකියාව 2018 අවසානයේ හා 2019 පළමු කාර්තුවේ තරමක් දියුණු විය.

මෑත වසරවල දී යටපත් වී ඇති ආර්ථිකයේ වර්ධන වේගය මධ්‍ය කාලීනව ක්‍රමයෙන් දියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2018 දී 3.2% ක පමණ මට්ටමක පැවති සැබෑ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 2023 වන විට ක්‍රම ක්‍රමයෙන් 5.0% දක්වා වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. රජයේ ප්‍රතිපත්ති මත සැලසුම් කරන ලද ආර්ථික සංවර්ධන වැඩසටහන් සාර්ථකව ක්‍රියාවට නැංවීම සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඉහළ නැංවීම මත අපේක්ෂා කරනු ලබන වර්ධන අනුපාතිකය ළඟාකරගැනීම රඳාපවතිනු ඇත.

නිරන්තර සංශෝධනයකින් තොරව ස්ථාවර ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම මගින් දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් ආයෝජන ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කෙරේ.

ගෝලීය සංචාරක කර්මාන්තයේ කාර්යසාධනය

2010 දී නිකුත් කරන ලද එක්සත් ජාතීන්ගේ ලෝක වෙළඳ සංවිධානය (UNWTO) හි දිගුකාලීන පුරෝකථනය පෙන්නුම් කළේ 2020 දී බිලියන 1.4 සීමාව කරා ළඟා වනු ඇති බවයි. එහෙත් මෑත වසරවල දී ජාත්‍යන්තර සංචාරකයින්ගේ ආගමනයන්ගේ ඇතිවූ කැපී පෙනෙන වර්ධනය නිසා මෙම තත්ත්වය අපේක්ෂිත කාලසීමාවට වසර දෙකකට පෙර ළඟාකර ගැනීමට හැකිවී ඇත. ගෝලීය ආර්ථිකයේ දක්නට ලැබෙන 3.7% ක වර්ධනයට වඩා පුරෝකථනය කරන ලද වර්ධනය ඉහළ අගයක් ගනී. සාපේක්ෂව ගත් කල, මැද පෙරදිග (+10%), අප්‍රිකාව (+7%), ආසියාව සහ පැසිෆික් හා යුරෝපය (දෙකම +6%) 2018 හි වර්ධනයට දායකත්වය ලබා දුන්නේය. ඇමරිකාවට සංචාරකයින් පැමිණීම ලෝකයේ සාමාන්‍යයට වඩා අඩු අගයක් ගත්තේය (+3%).

වඩා ශක්තිමත් ආර්ථික වර්ධනය, දැරිය හැකි ගුවන් ගමන් ගාස්තු, තාක්ෂණික වෙනස්කම්, නව ව්‍යාපාර ආකෘති සහ ලෝකය පුරා වීසා පහසුකම් සැපයීම වැඩිදියුණුවීම් මත මෑත වසරවල සංචාරක ව්‍යාපාරයේ වර්ධනය වේගවත් කර ඇත.

කලාප අනුව වර්ධනය

යුරෝපයේ ජාත්‍යන්තර සංචාරකයින්ගේ පැමිණීම 2018 දී මිලියන 713 ක් වූ අතර එය යහපත් ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලද 2017 වසරට වඩා 6% ක සුවිශේෂී වැඩි වීමකි. මෙම වර්ධනයට ගාමක බලවේගය සපයන ලද්දේ දකුණු සහ මෙඩිටේරියානු යුරෝපය (+7%) මධ්‍යම සහ නැගෙනහිර යුරෝපය (+6%) සහ බටහිර යුරෝපයයි (+6%).

කළමනාකරණ සමාලෝචනය හා විශ්ලේෂණය

එක්සත් රාජධානියට පැමිණි සංචාරකයින්ගේ ප්‍රමාණය අඩුවීම නිසා උතුරු යුරෝපයේ ප්‍රතිඵල එතරම් සාර්ථක වූයේ නැත. ආසියානු සහ පැසිෆික් කලාපයට (+6%) ජාත්‍යන්තර සංචාරකයින් මිලියන 343 ක් පැමිණියේය. දකුණු සහ නැගෙනහිර ආසියාව 7% ක වර්ධනයක් පෙන්නුම් කළ අතර උතුරුනැගෙනහිර ආසියාව (+6%) ක්ද දකුණු ආසියාව (+5%) ක්ද වාර්තා කළේය. ඕසනියාව (+3%) යම් ප්‍රමාණයක වර්ධනයක් පෙන්නුම් කළේය.

2018 ඇමරිකාවට (+3%) සංචාරකයින් මිලියන 217 ක් පැමිණියේය. මෙම වර්ධනයට වැඩිම දායකත්වය ලබාදුන්නේ උතුරු ඇමරිකාව (+4%) වන අතර මීළඟ ස්ථානය දකුණු ඇමරිකාවට (+3%) හිමි විය. මධ්‍යම ඇමරිකාව සහ කැරිබියන් කලාපය (දෙකම -2%) මිශ්‍ර ප්‍රතිඵල ලබාගත් අතර මෙම කලාපයට 2017 ඇතිවූ සුළි කුණාටු වන ඉර්මා සහ මාරියා මගින් බලපෑමක් ඇති කළේය. අප්‍රිකාවෙන් ලබා ගත් දත්ත අනුව එහි 7% ක වර්ධනයක් පෙන්නුම් කරන අතර (උතුරු අප්‍රිකාව +10% සහ උප සහරානු කලාපය+6%) එය ඇස්තමේන්තු කරන ලද සංචාරකයින් මිලියන 67 ළඟාකර ගත්තේය. මැද පෙරදිග කලාපයට පසුගිය වසරේ යහපත් ප්‍රතිඵල පෙන්නුම් කළ අතර 2017 වසරේ දී ලබාගත් ප්‍රගතිය ඉදිරියට ගෙන යමින් අන්තර්ජාතික සංචාරකයින් මිලියන 64 පැමිණි බව වාර්තා කළේය.

වර්තමානයේ දක්නට ලැබෙන ප්‍රවණතා, ආර්ථික තත්ත්වයන් සහ එක්සත් ජාතීන්ගේ ලෝක වෙළඳ සංවිධානයේ විශ්වසනීය දර්ශකය මත පදනම්ව ලබන වසරේදී ජාත්‍යන්තර සංචාරකයින්ගේ පැමිණීම 3% සිට 4% දක්වා වර්ධනය වනු ඇති බවට එක්සත් ජාතීන්ගේ ලෝක වෙළඳ සංවිධානය අනාවැකි පළකරනු ලබයි. ඒ අතරම, ගෝලීය ආර්ථිකයේ මන්දගාමී ස්වභාවය, බ්‍රෙක්සිට් හා සම්බන්ධ අවිනිශ්චිතතාව මෙන්ම දේශපාලනික හා වෙළඳ ආතතීන් ආයෝජකයින් සහ සංචාරකයින් අතර "තව ටිකක් සිතා බලමු" ("wait and see") වැනි ආකල්පයක් ඇති කළ හැකිය.

සමස්තයක් ලෙස ගත් කල 2019 වසරේදී ප්‍රජාවිද්‍යාත්මක හා වඩාත් වගකීමෙන් යුත් සංචාර කෙරෙහි වැඩි අවධානය යොමු කිරීම මත, 'වෙනස් තත්ත්වයන් අත්දැකීමට හා ප්‍රදර්ශනය සඳහා සහ ඇවිදීම, ශාරීරික සුවතාව සහ ක්‍රීඩා සංචාරක ව්‍යාපාරය වැනි 'සෞඛ්‍ය සම්පන්න විකල්පයන් තොරාගැනීම', 'බහුකාර්ය සංචාර' වැනි ක්ෂේත්‍රයන්හි වර්ධනයවීමක් අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය

2018 වර්ෂය තුළ සංචාරක හා සංචාරක කර්මාන්තය මගින් ලද ආදායම රට තුළ විදේශ විනිමය ගෙනදෙන ප්‍රධාන ප්‍රභවයක් ලෙස පැවති අතර මෙම වසරේදී සංචාරකයින්ගේ පැමිණීමෙහි අඛණ්ඩ වර්ධනයක් පැවතුණි. 2018 දී සංචාරකයින්ගේ පැමිණීම 10.3% කින් වර්ධනය වී සමස්ත අගය 2,333,796 ක් වී ඇති අතර මෙය එක් වසරක් තුළ වැඩිම සංචාරකයින් සංඛ්‍යාවක් පැමිණි අවස්ථාව බවට වාර්තාවී තිබේ. කීර්තිමත් ජාත්‍යන්තර සංචාරක සංවිධාන වලින් ලැබුණු සහතික කිරීම්, ආකර්ෂණීය ප්‍රවර්ධන ව්‍යාපාර, සංචාරක කර්මාන්තයේ ආයෝජනවල සැලකිය යුතු වැඩි වීම, සේවා සැපයීමේ ගුණාත්මකභාවය සහ ගුවන් හා මුහුදු මාර්ග හරහා වඩා හොඳ සම්බන්ධතාවක් ලබා ගැනීම, 2018 දී සංචාරක කර්මාන්තයේ වැඩිදියුණු කළ කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය.

නැගෙනහිර ආසියාව සහ මැදපෙරදිග හැර අනෙකුත් සියලුම ප්‍රධාන කලාපවලින් සංචාරකයින්ගේ පැමිණීම 2018 දී වැඩිවිය. බටහිර යුරෝපය ශ්‍රී ලංකාවේ විශාලතම සංචාරක මූලාශ්‍රය වන අතර එම කලාපයෙන් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව 840,956 වූ අතර එය 23.5% ක වර්ධනයකි. එය සමස්ත සංචාරකයින්ගෙන් 36% කි. ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම වෙළඳපොළ වන දකුණු ආසියාවෙන් සංචාරකයින්ගේ පැමිණීම 4.8% කින් වර්ධනය වූ අතර එම කලාපයෙන් පැමිණි සංඛ්‍යාව 543,160 ක් විය. කෙසේ වෙතත්, දකුණු ආසියාවෙන් පැමිණෙන සංචාරකයින්ගේ සංඛ්‍යාව සමස්ත සංචාරකයින්ගෙන් කොටසක් ලෙස 2018 දී 23.3% දක්වා පහත වැටී ඇති අතර එය 2017 දී 24.5% ක් විය.

ප්‍රධාන වශයෙන් 2016 දක්වා චීනයෙන් පැමිණීම ආකර්ෂණීය ලෙස වර්ධනය වීම හේතු කොට ගෙන 2011 සිට ක්‍රමානුකූලව ඉහළ ගිය නැගෙනහිර ආසියා සංචාරකයින්ගේ පැමිණීම 18.1% දක්වා පහත වැටී ඇති අතර, එම නිසා සමස්ත පැමිණීම්වල ප්‍රමාණය 4.7% කින් අඩුවී තිබේ.

කෙසේ වෙතත්, ඕස්ට්‍රේලියාවේ සිට සංචාරකයින්ගේ පැමිණීම 35.9% ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ අතර, සමස්ත සංචාරකයින්ගෙන් ඔවුන්ගේ කොටස 2017 දී 4.3% සිට 2018 දී 5.4% දක්වා ඉහළ නැංවීය. එවැනි වර්ධනයක් සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඕස්ට්‍රේලියාවෙන් පැමිණීම වැඩි වීමයි. එයට හේතුව ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර සෘජු ගුවන් ගමන් ආරම්භ කිරීමයි.

2018 දී රටවල් අනුව පැමිණි සංචාරකයින් පිළිබඳව සලකා බැලීමේදී ඉහළින්ම සිටින්නේ ඉන්දියාව වන අතර එම රටෙන් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව 424887 කි. දෙවන ස්ථානය ගත්තේ චීනය වන අතර එහි පැමිණීම් ස්වල්ප වශයෙන් අඩුවී තිබේ. මීලඟ ස්ථාන ගනු ලබන්නේ එක්සත් රාජධානිය, ජර්මනිය සහ ඕස්ට්‍රේලියාවයි. මෙම ප්‍රධාන රටවල් පහ ශ්‍රී ලංකාවට පැමිණි මුළු සංචාරකයින්ගෙන් සියයට 52.0 ක් සාමූහිකව දායක වී ඇත.

සංචාරයේ අරමුණ අනුව සංචාරකයින්ගෙන් බහුතරයක් (84.8%) විනෝදය සඳහා විදේශ ගත වූ අතර, මිතුරන් හා නෑදෑයින් හමුවීම, ආගමික හා සංස්කෘතික අරමුණු, සෞඛ්‍යය, අධ්‍යාපනය සහ ක්‍රීඩා වැනි වෙනත් අරමුණු සඳහා සංචාරකයින්ගේ පැමිණීම 2018 දීපැමිණි මුළු සංචාරකයින්ගෙන් 12.1% කි.

සංචාරකයින්ගේ ඉපැයීම් වර්ෂය තුළ සෞඛ්‍ය සම්පන්න වර්ධනයක් වාර්තා කළ අතර ඉහළ සංචාරකයින්ගේ පැමිණීම සහ සංචාරකයින් විසින් සිදුකරනු ලබන සාමාන්‍ය වියදම් ඉහළ යාම වාර්තා කළේය. 2017 දී එක්සත් ජනපද ඩොලර් මිලියන 3925 ට සාපේක්ෂව සංචාරක ව්‍යාපාරයේ ඉපැයීම් 2018 දී ඇමරිකානු ඩොලර් මිලියන 4381 දක්වා 11.6% කින් ඉහළ ගොස් තිබේ.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) විසින් පවත්වන ලද සංචාරකයින් විසින් සිදුකරන වියදම් සහ රැඳී සිටින කාලය පිළිබඳ නවතම වාර්ෂික සමීක්ෂණයට අනුව, 2018 දී සංචාරකයෙකුගේ සාමාන්‍ය වියදම් 2017 දී දිනකට ඇමරිකානු ඩොලර් 170.1 සිට ඇමරිකානු ඩොලර් 173.8 දක්වා ඉහළ ගොස් තිබේ. තවද, 2017 දී දින 10.9 ට සාපේක්ෂව සංචාරකයෙකුගේ සාමාන්‍යයෙන් දිවයිනේ රැඳී සිටින කාලය 2018 දී දින 10.8 ක් ලෙස ගණන් බලා ඇත.

සංචාරක අංශයේ ආයෝජන 2018 දී තවදුරටත් පුළුල් විය. 2018 දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 919 ක් වටිනා හෝටල් ව්‍යාපෘති 141 ක් සඳහා යෝජනා ලබා ගත් අතර, ව්‍යාපෘති 95 ක් හා සසඳන විට 2017 දී ඇමරිකානු ඩොලර් මිලියන 314 ක් ආයෝජනය කර ඇත. හෝටල් කාමර සංඛ්‍යාව 1302 කින් වැඩි කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 210 ක ආයෝජනයක් අනුමත කර ඇත. දිවයින පුරා හෝටල් ව්‍යාපෘති 35 ක් සම්පූර්ණ කරමින් 2018 දී කාමර 1125 ක් අලුතින් එක්වී ඇත.

මේ අතර, ජනප්‍රිය සංචාරක ආකර්ෂණීය ස්ථානවල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා පළාත් සභා සමග එක්ව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. කර්මාන්තයට අදාළ ව්‍යාපාර සහ ආයෝජන සඳහා වන පෙර වියදම් අඩු කිරීම සහ සංචාරක ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම පහසු කිරීම සඳහා 2019 අයවැය මගින් බදු දිරිගැන්වීම් කිහිපයක් හඳුන්වා දෙන ලදී.

2019 අයවැයෙන් සංචාරක හෝටල් විසින් විදේශ මුදල් ලැබීම් සඳහා වන ජාතිය ගොඩනැගීමේ බද්ද (එන්බීටී) ඉවත් කිරීමට යෝජනා කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන ආයතනයේ හෝටල් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම තුළින් සංචාරක කර්මාන්තයේ අවිධිමත් අංශය ප්‍රධාන ධාරාවේ කොටසක් වීමට දිරිගැන්වීම සිදු කෙරේ.

ඉදිරියට යන විට සංචාරක කර්මාන්තයේ ප්‍රධාන ප්‍රමුඛතා වනුයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සහ කර්මාන්ත හවුල්කරුවන්ගේ සහයෝගිතාවෙන් යටිතල පහසුකම් සහ අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම සහ ශ්‍රම බලකායේ නිපුණතා මට්ටම ඉහළ නැංවීමයි.

මෙම ප්‍රවර්ධන කටයුතු සඳහා සහාය දක්වමින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2018 නොවැම්බර් මාසයේදී "So Sri Lanka - ශ්‍රී ලංකාව" නමින් නව වෙළඳ නාම අනන්‍යතාවක් හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සිදුකරන ඵලදායී හා අඛණ්ඩ ප්‍රවර්ධනයන්හි ප්‍රතිඵලයක් ලෙස ලෝන්ලි ප්ලැනට්, නැෂනල් ජියෝග්‍රැෆික් ඇතුළු සංචාරක ආශ්‍රිත බොහෝ ආයතන 2019 දී සංචාරය කළ හැකි හොඳම ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව අනුමත කර තිබේ.

මේ අතර, සුඛෝපභෝගී මගී නෞකා 50 කින් මගීන් 86,000 ක් පමණ කොළඹ වරායට පැමිණියහ. තවද, ශ්‍රී ලංකාව කලාපයේ විවිධ සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් සංවිධානය කරන ලද අයන්මන් 70.3 සහ රයිඩ් ඇමසන් වැනි ජාත්‍යන්තර ජනප්‍රිය ත්‍රාසජනක ක්‍රීඩා ඉසව් කිහිපයක් 2018 දී ශ්‍රී ලංකාවේදී පැවැත්විණි. මේ අතර, සංචාරකයින්ගේ ආරක්ෂාව සහ සුවපහසුව ඉහළ නැංවීම, නව ජීවිතාරක්ෂක ඒකක පිහිටුවීම සහ ජංගම සංචාරක පොලිස් කොට්ඨාස 2018 දී ආරම්භ කරන ලදී.

ගෝලීය සංචාරක වෙළඳපොළ ආකර්ෂණය කරගැනීම සඳහා වූ ශ්‍රී ලංකාවේ ශක්‍යතාව ප්‍රමාණවත් ලෙස භාවිතයට ගෙන නොමැත. කලාපීය කුඩා දූපත් ජාතීන් හා සසඳන විට පුළුල් සංචාරක වෙළඳපොළක් සපුරාලීමේ හැකියාව ශ්‍රී ලංකාවට ඇත.

මූල්‍ය සමාලෝචනය

සමාලෝචනයට භාජන වූ වර්ෂය තුළ, 2018 ඔක්තෝබර්/ නොවැම්බර් මාසවල මාස 2 කට ආසන්න කාලයක් පැවති දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් පදිංචිය සහ එෆ් ඇන්ඩ් බී අලෙවියට ඇති අභියෝග හේතුවෙන් සමාගම ව්‍යාපාරයේ සියලුම ප්‍රධාන අංශයන්හි ක්‍රියාකාරකම්හි සුළු අඩුවීමක් දක්නට හැකිවිය.

ආදායම

වර්ෂය තුළ ආදායම රු. බිලියන 3.02 සිට රුපියල් බිලියන 2.91 දක්වා 3% කින් අඩු විය. කාමර ආදායම සමස්තයක් ලෙස 7% කින් පහත වැටුණි. කාමර කුලියට ගැනීම 57% සිට 48% දක්වා අඩු වූ අතර කාමරවල සාමාන්‍ය මිල 2017 දිරුපියල් 21,077.00 සිට රුපියල් 22,944.00 දක්වා ඉහළ ගියේය. සංචාරකයින් පැමිණීම උපරිම වන කාලපරිච්ඡේදය තුළ ඇති වූ පසුබෑම නොතකා ආහාර හා පාන අංශය ඉතා හොඳ ප්‍රතිඵල ලබා ඇති අතර ඔවුන්ගේ ආදායම පෙර වසරට වඩා රුපියල් බිලියන 1.6 ක් ලෙස පවත්වා ගෙන යනු ලැබිය. නවීකරණය කරන ලද එෆ් ඇන්ඩ් බී අලෙවිසල් විවෘත කිරීමත් සමග හෝටලයේ විවිධ ආහාර හා පාන ගැනීමේ අවස්ථාවන් ගණනාවක් උදාවීම අමුත්තන් සඳහා ප්‍රබල ආකර්ෂණයක් පෙන්නුම් කරයි.

බදුවලට පෙර ලාභය

විකුණුම් පිරිවැය 2%කින් සුළු වශයෙන් ඉහළ යාම හේතුවෙන් දළ මෙහෙයුම් ලාභය 2017 දී 82% සිට 80% දක්වා සුළු වශයෙන් පහත වැටුණි. වර්ෂය තුළ විනිමය අනුපාතය ඉහළ යාම නිසා විකුණුම් පිරිවැය බොහෝ දුරට බලපා ඇති අතර, පහළ මට්ටමට වන බලපෑම අවම කිරීම සඳහා පිරිවැය අඩු කිරීමේ මූලපිරීම් කිහිපයක් සමග මෙය තරමක් සීමා කරන ලදී. ආදායම රුපියල් මිලියන 105 කින් පහත වැටීම දළ මෙහෙයුම් ලාභයෙහි වටිනාකම රුපියල් මිලියන 147 කින් පහත වැටීමට හේතු වේ.

වර්ෂය තුළ මෙහෙයුම් ආරම්භ කළ නව හෝටල්වල තරගකාරිත්වය මැඩපැවැත්වීම සඳහා වර්ෂය තුළ විවිධ ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලදී. ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා මානව සම්පත් පුහුණුව හා සංවර්ධනය සඳහා ද ආයෝජනය කරන ලදී. වෙළඳපොළට අලුතින් පිවිසෙන්නන් විසින් නිර්මාණය කරන ලද ඉහළ නිපුණතා ඉල්ලුම හේතුවෙන් ඉහළ පුහුණුව ලත් කාර්ය මණ්ඩලයක් රඳවා ගැනීම සඳහා ආදායම අඩුවීමේ කාල සීමාව තුළ අවම සේවා ගාස්තු ගෙවීම ක්‍රියාත්මක කරන ලදී. නවීකරණය කරන ලද වත්කම් ප්‍රාග්ධනීකරණය කිරීමෙන් පැන නගින අතිරේක ක්ෂය කිරීම් (රු. මිලියන 39) ද පහළ මට්ටමට බලපෑවේය. ඉහත ප්‍රතිඵලයක් ලෙස, 2017 වර්ෂයේදී රුපියල් මිලියන 173 ක බදු ගෙවීමට පෙර ලාභයට සාපේක්ෂව සමාගමට රුපියල් මිලියන 126 ක බදු ගෙවීමට පෙර අලාභයක් සිදුවිය.

සිදුවීම් බහුල වසරක් ලෙස

වර්ෂය තුළ කර්මාන්තයේ අභියෝගාත්මක තත්ත්වයන් තිබියදීත්, සමාගම අත්විඳින්නේ ආදායමේ සුළු අඩුවීමක් පමණි. මයිස් බිස්නස්හි ශක්තිමත් ක්‍රියාකාරිත්වය නිසා කලාපීය සමාගම්වල ඉල්ලුමත් සමග ආයතනික හා භෝජන සංග්‍රහ සඳහා වඩාත්ම කැමති තරු 5 හෝටලය ලෙස කලාපීය ව්‍යාපාරික සමාගම්වල ඉල්ලුමක් පවතී.

වසර පුරා ඇති උත්සව අවස්ථා ජනප්‍රිය වී ඇති අතර, හිල්ටන් එම සංස්කෘතික උත්සව ඉතා අලංකාර ලෙස හා උත්සවයේ සැබෑ ස්වරූපයෙන් සමරනු ලබයි.

මෙම ක්‍රියාකාරකම් දෙසැම්බරයේ උත්සව සමයට සමගාමීව උත්සව සිදුවීම් මාලාවකින් අවසන් වූ අතර එම කාලය තුළ හෝටලයට සංචාරකයින්ගේ ගමනාගමනය එහි උපරිමය කරා ළඟා වේ. හෝටලයේ ආහාර නිමැවුම් අංශය අනෙකුත් හෝටල් අතරින් කැපීපෙනෙන ආකාරයට අවන්හල් තුනක් පවත්වාගෙන යනු ලබයි.

අනාගත දැක්ම

නව පෙනුමක් ඇති උත්සව ශාලා සහ අවකාශයන් විවෘත කිරීමත් සමග එහි අමුත්තන්ගේ අභිලාෂයන් සැබවින්ම වටහා ගන්නා විශ්වාසදායක ආගන්තුක සත්කාර සන්නාමයක් ලෙස හිල්ටන් කළම්බු හෝටලය කර්මාන්තයේ ඉදිරියෙන්ම සිටියි. ඉහළ වෘත්තීය හා ආචාරශීලී කාර්ය මණ්ඩලයේ කණ්ඩායමක සහාය ඇතිව එයට අසීමිත ශක්තියක් හිමිවී ඇත. කෙසේ වෙතත්, පාස්කු ඉරිදා ප්‍රහාරයන් දෙස බලන විට, සංචාරක කර්මාන්තය කෙටිකාලීනව යම් පසුබැසීමක් අපේක්ෂා කරන නමුත් සියලු පාර්ශ්වකරුවන් එක් කිරීම මගින් පෙරට වඩා ශක්තිමත්ව වෙළඳපළට මුහුණ දීමත් අභියෝග ජයගැනීමටත් හැකිවේ. එහෙත් සංචාරක කර්මාන්තයේ දියුණුවේ ධනාත්මක ප්‍රවණතාව මගින් පැහැදිලිව සටහන් වන්නේ රටේ සාමාන්‍ය තත්ත්වය පැමිණීමත් සමග මෙම ක්ෂේත්‍රයේ ස්ථාවර වර්ධනයක් අපේක්ෂා කළහැකි බවයි. අප සමාගම ජාතියේ සංචාරක සහ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පෙරමුණගෙන කටයුතු කරනු ඇති බවට අපි සුභවාදී අපේක්ෂාවෙන් පසුවන්නෙමු.

උත්සව අවස්ථා සපිරුණු වසරක්



Christmas @ The Lobby Lounge


CAFE KAI
GRAZE KITCHEN
Home For Christmas

Eat Drink Hilton - Ice Cream Challenge @ Café Kai





Oktoberfest @ The Poolside




The
Germans
are here.
Hilton
COLOMBO
music

Strawberry High Tea
@ The Lab




STRAWBERRY &
MINT DETOX

Celebrating The Valentines Day @ Hilton





සංයුක්ත පාලනය

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය කොළඹ කොටස් හුවමාරුවේ සංයුක්ත පාලන රීති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ "සංයුක්ත පාලනය පිළිබඳ මනා පරිචය සංග්‍රහයේ" විධිවිධාන අනුව සංයුක්ත පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිති පවත්වා ගැනීමට කැපවී සිටින අතර එම ප්‍රමිති පවත්වා ගැනීම සම්බන්ධ වගකීම භාර ගනියි. සිය සියලු කටයුතුවලදී ව්‍යාපාරික අවංක භාවය, ආචාර ධර්මාත්මක සාරධර්ම, විනිවිද භාවය හා වෘත්තීයවේදී භාවය පිළිබඳ ඉහළම ප්‍රමිති පවත්වා ගැනීමට සමාගම සතු වගකීම නොපිරිහෙළා ඉටු කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමට සිය පාර්ශ්වකරුවන් කෙරෙහි පවත්නා බැඳීම් ඉටු කිරීමට හැකි වන පරිදි සමාගමට ව්‍යවසායික නායකත්වය සම්පාදනය කිරීම, සංයුක්ත ක්‍රමෝපායාත්මක අරමුණු, සාරධර්ම හා ප්‍රමිති සූත්‍රගත කිරීම සහ කාර්යසාධනය සමාලෝචනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. 2018 දෙසැම්බර් මස 31 දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි විය:

ක්‍රිෂාන්ත ප්‍රසාද් කුරේ මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ධීෂණා එස්. අමරසේකර මෙනවිය - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ජේ.එම්.යූ.පී. ජයමහ මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
අතුල සේනානායක මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ටෙහානි එස්.ඒ. මැතිව් මහත්මිය - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
දිනුක් කොළඹගේ මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
එම්. ශෙස්මින් මන්සූර් මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ඩබ්ලිව්.එස්.එල්.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
සොනාලි ලියනමාන මහත්මිය - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ප්‍රවීර් ධනෝෂ් සමරසිංහ මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

සටහන:

අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වීම්

දිනුක් කොළඹගේ මහතා - 19.04.01 දින සිට
එම්. ශෙස්මින් මන්සූර් මහතා - 19.04.03 දින සිට

අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම්

සී.පී.ආර්. රණසිංහ මහත්මිය - 19.04.09 දින සිට
එස්.එන්. අලස් මහතා - 19.04.09 දින සිට

ඉහත සඳහන් අධ්‍යක්ෂවරුන් සතුව සමාගමේ කොටස් නොමැත.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නවයක් (09) පැවැත්වුණු අතර එම රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගිත්වය පහත සඳහන් පරිදි විය:

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව
කේ.පී. කුරේ මහතා (2016.04.08 දින සිට පත්කරන ලදි)	06
ඩී.එස්. අමරසේකර මෙනවිය (2015.04.07 දින සිට පත්කරන ලදි)	04
ජේ.එම්.යූ.පී. ජයමහ මහතා (2016.03.01 දින සිට පත්කරන ලදි)	06
ඒ. සේනානායක මහතා (2016.04.08 දින සිට පත්කරන ලදි)	06
ටී.එස්.ඒ. මැතිව් මහත්මිය (2016.04.08 දින සිට පත්කරන ලදි)	05
ඩී. කොළඹගේ මහතා (2016.04.08 දින සිට පත්කරන ලදි)	04
එම්.එස්. මන්සූර් මහතා (2016.04.08 දින සිට පත්කරන ලදි)	06
ඩබ්ලිව්.එස්.එල්.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා (2016.04.08 දින සිට පත්කරන ලදි)	04
එස්. ලියනමාන මහත්මිය (2016.04.08 දින සිට පත්කරන ලදි)	06
පී.ඩී. සමරසිංහ මහතා (2016.07.29 දින සිට පත්කරන ලදි)	05

මාසික ගිණුම් සහ ව්‍යවස්ථාපිත අනුකූලතා ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත ලබාදෙනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සියලුම වැදගත් කරුණු සාකච්ඡාවට ලක්කර තීරණ ගනු ලැබේ. එමෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂිත අනුමැතිය අවශ්‍ය කරන කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර කල්වේලා ඇතිව ඉදිරිපත් කරනු ලැබේ. සමාගම් ලේකම්වරුන් විසින් සියලු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා නිසි පරිදි සටහන් කර පවත්වාගනු ලැබේ.

අභ්‍යන්තර පාලන පද්ධති සහ අවදානම් කළමනාකරණය

සමාගමේ කොටස් හිමියන්ගේ ආයෝජන සහ සමාගමේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධති සහ අවදානම් කළමනාකරණ පද්ධති හඳුන්වා දෙනු ලැබ ඇත. අභ්‍යන්තර පාලන පද්ධති ඊටම ආවේණික වූ සීමාවන් සහිත බව සහ වංචා හා වැරදි සිදු නොවන බවට ඒකාන්ත සහතිකයක් ලබාදීමට ඒවාට නොහැකි බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මැනවින් අවබෝධ කරගන්නා ලද කාරණයකි.

අධ්‍යක්ෂ මණ්ඩලය, නිත්‍ය පදනමක් මත, අනුමත අයවැයවල් සමග සසඳමින් සමාගමේ මාසික ගිණුම් සහ කාර්යසාධනය සමාලෝචනය කරයි.

විගණන කමිටුව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විගණන කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි විය:

අධ්‍යක්ෂවරුන්ගේ නම්

ප්‍රවීර් ධනෝෂ් සමරසිංහ මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (සභාපති)
ජේ.එම්.යූ.පී. ජයමහ මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (සාමාජික)
එම්. ශෙස්මින් මන්සූර් මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (සාමාජික)

2019 මැයි 29 දින සිට බලාත්මක වන අයුරින් පහත සඳහන් පරිදි කමිටුව ප්‍රතිනිර්මාණය කරනු ලැබිණ:

ප්‍රවීර් සමරසිංහ මහතා - (සභාපති) ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
චතුරි රණසිංහ මහත්මිය - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ඩබ්ලිව්.එස්.එල්.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

විගණන කමිටුව සමාගමේ අභ්‍යන්තර විගණකයන් වන අර්නස්ට් ඇන්ඩ් යංග් ආයතනය විසින් සකස්කරනු ලබන හෝටලයේ මෙහෙයුම්වලට අදාළ අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ වාර්තාව සියුම් ලෙස පරීක්ෂා කොට විශ්ලේෂණය කරන අතර හෝටලයේ හා සමාගමේ කටයුතු සම්බන්ධයෙන් දැඩි පාලනයක් පවත්නා බව සහතික කරයි. හෝටලයේ/සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධති සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් පිළිබඳව විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරයි. කොළඹ කොටස් හුවමාරුව වෙත යවනු ලබන ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කිරීමට පෙර සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා නිකුත් කිරීමට පෙර සමාලෝචනය කිරීම ද විගණන කමිටුව විසින් කරනු ලැබේ.

විගණන කමිටුවේ වාර්තාව මෙම වාර්තාවේ 52 වන පිටුවෙහි දක්වා ඇත.

වැටුප් කමිටුව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ වැටුප් කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි විය:

අධ්‍යක්ෂවරුන්ගේ නම්

අතුල සේනානායක මහතා (සභාපති, ස්වාධීන විධායක නොවන)
දිනුක් කොළඹගේ මහතා (ස්වාධීන විධායක නොවන)
ඩබ්ලිව්.එස්.එල්.ඩී.ඒ.ආර්. සමරසිංහ මහතා (ස්වාධීන විධායක නොවන)
ක්‍රිෂාන්ත කුරේ මහතා (ස්වාධීන විධායක නොවන)

වැටුප් කමිටුව වැටුප් කාරණා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරයි.

<u>අදාළ පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුව</u>

අදාළ පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ උපකමිටුවක් ලෙස නිර්මාණය කරනු ලැබිණ. කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීතීන්ට අනුකූලව සියලු අදාළ පාර්ශ්වීය ගනුදෙනු පිළිබඳව ස්වාධීන සමාලෝචන හා අධීක්ෂණ සම්පාදනය කිරීම කමිටුවේ අරමුණයි.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අදාළ පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි විය:

අධ්‍යක්ෂවරුන්ගේ නම්

අතුල සේනානායක මහතා (සභාපති, ස්වාධීන විධායක නොවන)
දිනුක් කොළඹගේ මහතා (සාමාජික, ස්වාධීන විධායක නොවන)
ඩබ්ලිව්.එස්.එල්.ඩී.ඒ.ආර්. සමරසිංහ මහතා (සාමාජික, ස්වාධීන විධායක නොවන)

අධ්‍යක්ෂ මණ්ඩලය අදාළ පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර කමිටුව අදාළ පාර්ශවීය ගනුදෙනු හඳුනාගැනීම හා සමාලෝචනය කිරීම සඳහා ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සම්පාදනය කර ඇත.

<u>කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති අංක 7.6 **(vii)** අනුව අනුකූලතා අවශ්‍යතා</u>

ආයතනයේ සේවකයන් හා කාර්මික සම්බන්ධතාවලට අදාළව අනාවරණය කළ යුතු වැදගත් ගැටලු කිසිවක් නොමැති බව අධ්‍යක්ෂවරු තහවුරු කර සිටිති.

සමාගම් ලේකම්වරු

අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටු විසින් ප්‍රශස්ත පාලන පරිචයන් යොදාගන්නා බව සහතික කිරීම පිණිස සමාගම් ලේකම්වරුන් විසින් සමාගම් පනතට හා කොළඹ කොටස් හුවමාරුවේ රෙගුලාසිවලට අදාළ කාරණා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත උපදෙස් සම්පාදනය කරනු ලැබේ.

නෛතික අවශ්‍යතාවන්ට අනුකූලතාව

සියලු අධ්‍යක්ෂවරුන්ට සමාගමේ මූල්‍ය හා කළමනාකරණ තොරතුරු වෙත ප්‍රවේශය ඇත. සමාගම නීති හා රෙගුලාසි අනුව කටයුතු කරන බවත්, සමාගමේ කටයුතු හැසිරවීමේදී නිසි සම්ප්‍රජන්‍යතාවෙන් යුතුව ක්‍රියා කරන බවත් සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සෑම පරිශ්‍රමයක්ම දරයි. ඊට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කරන බව සහතික කිරීම සඳහා පිරික්සුම් හා පාලන පද්ධති ස්ථාපිත කර ඇත.

සංයුක්ත පාලනය

සමාලෝචිත වර්ෂය තුළදී කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති සංග්‍රහයේ අංක 7.10 වගන්තිය අනුව සහ සමායතන පාලන රීතිවලට අනුකූලව කරනලද අනාවරණයන් පහත වගුවේ දක්වා ඇත:

රීති අංකය	විෂය	අදාළ අවශ්‍යතාව	අනුකූලතා මට්ටම	විස්තර
7.10.1	විධායක නොවන අධ්‍යක්ෂවරු	යටත් පිරිසෙයින් සමස්ත අධ්‍යක්ෂ වරුන් සංඛ්‍යාවෙන් 1/3ක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතුය.	අනුකූලව ක්‍රියාකර ඇත.	අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයෝ විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති.
7.10.2 (a) & (b)	ස්වාධීන අධ්‍යක්ෂවරු	විධායක නොවන අධ්‍යක්ෂවරුන් ගෙන් දෙදෙනෙකු හෝ 1/3ක් ස්වාධීන විය යුතුය. සෑම ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුම තමා ස්වාධීන/ස්වාධීන නොවන බවට නියමිත ආකෘති පත්‍රය තුළ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.	අනුකූලව ක්‍රියාකර ඇත. අනුකූලව ක්‍රියාකර ඇත.	
7.10.3	අධ්‍යක්ෂ වරුන්ට අදාළ අනාවරණ	(අ) ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ නම් වාර්ෂික වාර්තාවේදී අනාවරණය කළ යුතුය.	අනුකූලව ක්‍රියාකර ඇත.	කරුණාකර වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවලට අදාළව දක්වා ඇති තොරතුරු බලන්න.
7.10.5	වැටුප් කමිටුව	(අ) අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වැටුප් කමිටුවක් තිබිය යුතුය.	අනුකූලව ක්‍රියාකර ඇත.	කරුණාකර වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වලට අදාළව දක්වා ඇති තොරතුරු බලන්න.

සෙසු ප්‍රතිපත්ති හා පරිචයන්

ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම

අධ්‍යක්ෂ මණ්ඩලය සිය කාර්යයන් ඉටු කිරීමේදී අවශ්‍ය පරිදි බාහිර පාර්ශ්වයන්ගෙන් සහ සමාගමේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගනී.

සමාගමේ සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු වෙනුවෙන් කැපවීම

සමාගම සම්බන්ධයෙන් වන සිය යුතුකම් ඉටුකිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් කාලයක් කැපකරයි. සමාගමේ දෛනික මෙහෙයුම් කාර්යයන් සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි සහ ප්‍රධාන මූල්‍ය නිලධාරි වෙත පවරාදීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත.

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

.....
ධනුක රංජිත් සමරසිංහ
අධ්‍යක්ෂ

.....
ටෙහානි මැතිව්
අධ්‍යක්ෂ

2019 සැප්තැම්බර් 17 දින
කොළඹදීය.

අවදානම් කළමනාකරණය

විවිධ අභියෝග හමුවේ විවිධාංගීකෘත වෙළඳපොළවල් ආකර්ෂණය කරගැනීමට සහ නොවෙනස්ව පවත්වා ගැනීමට පවතින ඉල්ලුම නින්නාද දෙන ඉහළ තරඟකාරිත්වයකින් යුත් කර්මාන්තයක ඉදිරියෙන්ම සිටින හිල්ටන් කළමිබු හෝටලය එය සිය පාර්ශ්වකරුවන් සඳහා දීර්ඝ කාලීන වටිනාකම් අත්කරදීමට දරන ප්‍රයත්නයේ එක් අනුකලනීය ක්‍රියාවලියක් ලෙස අවදානම් කළමනාකරණය සලකයි. වෙනස්වීම ප්‍රතිමානය බවට පත්ව ඇති වත්මන් ව්‍යාපාරික වටපිටාව තුළ ක්‍රමෝපායාත්මක සැලසුම්කරණය සහ ව්‍යාපාරික කටයුතු ඉටුකිරීම හා නෛතික අවශ්‍යතාවන්ට අනුකූලවීම අතර සමබරතාවක් පවත්වා ගැනීම සඳහා තමන් ඉටු කරන අතිශය වැදගත් කාර්යභාරය පිළිබඳව හෝටලය නිරන්තර අවබෝධයකින් පසුවේ. එමගින් දැනුවත් තීරණ ගැනීමට සහ අවස්ථා හා ඒවායේ නෛසර්ගික අවදානම් තක්සේරු කිරීමට පහසුකම් සැලසෙන අතර තම ප්‍රධාන වත්කම් නිසි පරිදි ආරක්ෂා කර ගැනීමට හෝ වැඩිදියුණු කරගැනීමට හෝටලයට හැකියාව ලැබේ.

අපගේ අවදානම් කළමනාකරණ වේදිකාව සමාගම අවදානම්වලට පාත්‍ර විය හැකි ආකාරයන් හඳුනාගෙන, ඇතිවිය හැකි අවදානම් තක්සේරු කොට, ඒවා අවම කිරීමේ හා පාලනය කිරීමේ ක්‍රමෝපායන් සකස් කිරීම සඳහා සැලසුම් කරන ලද්දකි. අවදානම් කළමනාකරණය අපගේ සංයුක්ත පාලන ව්‍යූහයේ සහ ක්‍රමෝපායාත්මක සංවර්ධන ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංගයක් වන අතර, ප්‍රමාණවත්බව හා අනුකූලතාව සහතික කිරීම සඳහා කරනු ලබන කාලීන සමාලෝචන සහිත සාර්ථක ලෙස හා ක්‍රමෝපායාත්මක වශයෙන් ව්‍යූහගත කරන ලද යෝග්‍ය පද්ධති, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි හෝටලයේ සෑම මෙහෙයුම් ක්ෂේත්‍රයක් තුළම පවතී.

මෙහෙයුම් පරිසරය තුළ වෙනස් වන ගතිකයන් නිරතුරුව පිළිබිඹු කරන අපගේ අවදානම් කළමනාකරණ රාමුව අපගේ ප්‍රතිපත්ති රාමුවලට සහ අදාළ පරිදි ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන්ට අනුගත වන ලෙස සම්පාදනය කරනු ලැබ ඇත.

හිල්ටන් කළම්බු හෝටලයේ අවදානම් කළමනාකරණ රාමුව අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳ අවසන් වගකීම කළමනාකාරිත්වය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සමස්තයක් ලෙස ක්‍රියාත්මක කිරීම අවදානම් කළමනාකරණ කණ්ඩායමේ වගකීම වේ.

අවදානම් කළමනාකරණ රාමුව

සාමාන්‍යාධිකාරිවරයා හිල්ටන් කළම්බු හෝටලයේ අවදානම් කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධානත්වය උසුලන අතර මැනවින් සකස් කරන ලද අවදානම් කළමනාකරණ රාමුවක් ඇතුළත ස්වකීය ව්‍යවස්ථාපිත, විශ්වසනීයතා හා නියාමන වගකීම් ඉටුකිරීමේදී හිල්ටන් වර්ල්ඩ්වයිඩ් මව් සමාගමේ කලාපීය කාර්යාලයේ උපදෙස් ලබාගනිමින් අවදානම් ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීමද ඔහු විසින් ඉටුකළයුතු වගකීමකි. සාමාන්‍යාධිකාරිවරයා සහ හෝටලයේ කාර්ය ප්‍රධානීන්ගෙන් අවදානම් කළමනාකරණ කණ්ඩායම සමන්විත වේ. බුද්ධි තොරතුරු රැස්කිරීම, තත්ත්ව විගණන, ආරක්ෂක විගණන, අභ්‍යන්තර විගණන සහ සේවාලාභී ප්‍රතිපෝෂණ හා සිදුවීම් වැනි ක්‍රමවේද උපයෝගී කර ගනිමින් අදාළ සියලු අභ්‍යන්තර හා බාහිර අවදානම් හඳුනා ගනු ලබන බව ක්‍රමවේදී ක්‍රියාවලියක් මගින් තහවුරු කරනු ලැබේ. මෙසේ හඳුනා ගනු ලබන අවදානම් ඉන් අනතුරුව ව්‍යාපාරික බලපෑම, සිදු වීමේ භව්‍යතාව හා ප්‍රවේගය යන සාධක අනුව තක්සේරු කරනු ලැබේ. අවදානම් ඒවායේ බලපෑම හා සම්භාවිතාව අනුව සිතියම්ගත කොට ප්‍රධාන අවදානම් තත්ත්ව ප්‍රමුඛතාකරණය කිරීමට පහසුකම් සලසනු ලැබේ.

මෙම අවදානම් ශ්‍රේණිගත කිරීම්වල ප්‍රතිඵල 'ඉහළම අවදානමේ සිට නොවැදගත් අවදානම' දක්වා පිළිවෙළින් අවදානම් කොටු සැලැස්මක වගුගත කෙරෙන අතර එමගින් හෝටලයට අවදානම් ප්‍රමුඛතාකරණය කිරීමටත්, නිවාරණ, විමර්ශක හා විශෝධක යන කාර්ය සැලසුම් වර්ගීකරණය යටතේ අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායන් සැලසුම් කිරීමටත් හැකියාව ලබා දෙනු ලැබේ.

මෙසේ හඳුනා ගත් අවදානම් හෝටලයේ අවදානම් කළමනාකරණ කණ්ඩායම විසින් මාසික පදනමකින් සමාලෝචනය කෙරෙන අතර, කවර හෝ අවම කිරීමේ පියවරක් ක්‍රියාත්මක කිරීම සහ සාමාන්‍යාධිකාරිවරයා මාර්ගයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඒ පිළිබඳව වාර්තා කිරීම පිළිබඳ වගකීම ඒ ඒ අවදානමේ හිමිකාරත්වය පවරා දී ඇති පුද්ගලයා සතුවේ. ඒකාබද්ධ මූල්‍ය හා මෙහෙයුම් අනුකූලතා වාර්තාව කළමනාකාරිත්වය වෙත භාරදෙනු ලැබේ. අවදානම් සමාලෝචනය අවදානම් කළමනාකරණ රැස්වීම්වල න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමටද අවදානම් කළමනාකරණ කණ්ඩායම කටයුතු කර ඇත.

අවදානම් කාණ්ඩය හා විස්තරය	අවදානම් අවම කිරීමේ පාලන ක්‍රියාමාර්ග හා ක්‍රියාකාරී සැලසුම්
තාක්ෂණික හා තොරතුරු අවදානම විද්‍යුත් පද්ධති අක්‍රිය වීම සහ තොරතුරු පද්ධති ප්‍රමාණවත් නොවීම පිළිබඳ අවදානම	කිසිදු බිඳවැටීමකින් තොර තොරතුරු ප්‍රවාහයක් හා කාර්යක්ෂම මෙහෙයුම් ක්‍රියාවලියක් පවත්නා බව සහතික කරමින් පූර්ණ වශයෙන් සමෝධානිත දේපළ කළමනාකරණ, ද්‍රව්‍ය කළමනාකරණ, විකුණුම් ස්ථාන හා මූල්‍ය තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. පද්ධතියේ කිසියම් බිඳවැටීමක් සිදුවුවහොත් උපයෝගී කර ගැනීම සඳහා ආපදා යථාතත්ත්වයට පත් කිරීමේ සැලැස්මක් පැවතීම හා එය අඛණ්ඩව වැඩිදියුණුකිරීම. ඇනහිටින කාලය අවම කිරීම හා මෙහෙයුම්වල අඛණ්ඩතාව සහතිකකිරීම සඳහා හෝටලයේ පරිගණක ස්ථාපිතයන්හි ආරක්ෂාව පිණිස හෝටලයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් පාලන ක්‍රමවේදයන් ක්‍රියාවට නංවනු ලැබ ඇත. තොරතුරු ආරක්ෂාව හා සමෝධානය සහතික කිරීම සඳහා ජාල ආරක්ෂණ ක්‍රියාවලිය අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ.

අවදානම් කළමනාකරණය

අවදානම් කාණ්ඩය හා විස්තරය	අවදානම් අවම කිරීමේ පාලන ක්‍රියාමාර්ග හා ක්‍රියාකාරී සැලසුම්
අභ්‍යන්තර ක්‍රියාවලිය හා ක්‍රියා පටිපාටි මූල්‍ය අලාභ හා ව්‍යාපාර බිඳවැටීම සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේද බිඳවැටීම පිළිබඳ අවදානම	අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ට අනුකූලතාව සහතික කිරීම පිණිස පැහැදිලිව අර්ථනිරූපිත පද්ධති හා පටිපාටි ක්‍රියාත්මක කර ඇති අතර ඒවායේ අඛණ්ඩ ඵලදායකත්වය පවත්වා ගැනීම සඳහා වාරික පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. සමාගම විසින් වාරික පදනමකින් අභ්‍යන්තර විගණන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කෙරෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන විගණන කමිටුව වෙත සමාගම එහි ප්‍රතිඵල සෘජුව වාර්තා කරයි. මෙම පද්ධතිවල ප්‍රමාණවත්බව හා ඵලදායකත්වය සහ අනුකූලතා මට්ටම පිළිබඳ වාරික වාර්තා සමාලෝචනය කිරීම හා විශෝධන පියවරයන් ගැනීම සඳහා විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
ආරක්ෂක අවදානම	හෝටල් කර්මාන්තයේ ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලමින් කාර්යසාධක නිරීක්ෂණාත්මක සුපරීක්ෂණ පද්ධති ස්ථාපනය කරනු ලැබ ඇත. අමුත්තන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා වන ආරක්ෂණ උපකරණ හා සුපරීක්ෂණ පද්ධති සංඛ්‍යාව වැඩි කිරීම සඳහා මුදල් ආයෝජනය කරනු ලැබ ඇත. සාර්ථක ලෙස ආරක්ෂාව පවත්වා ගෙන යන බව සහතික කිරීම සඳහා පුහුණු නිපුණ ආරක්ෂක කාර්ය මණ්ඩලයක් යොදවා ඇති අතර ඔවුන්ට අඛණ්ඩව පුහුණුව ලබා දෙනු ලැබේ.
ස්වාභාවික හෝ මිනිසා විසින් නිර්මාණය කරන ලද ආපදා දේපළ හා උපකරණ අහිමිවීම නිසා සිදුවන සැලකිය යුතු අලාභ	රක්ෂණාවරණවල ප්‍රමාණවත්බව නිරන්තරයෙන් සමාලෝචනය කර අවශ්‍ය පරිදි යාවත්කාලීන කරනු ලැබේ. වත්කම් ආරක්ෂා කිරීම හා කඩිනමින් යථාවත් කිරීම සඳහා අර්බුද කළමනාකරණ හා ව්‍යාපාර යථාවත් කිරීමේ සැලසුම් යොදා ගනු ලැබ ඇත. මේවා කාලීනව සමාලෝචනය කරනු ලැබේ. ගිනි අවදානම අවම කිරීම සඳහා හෝටලයේ මුදුන් තලයේ නව දියවිදුම් පද්ධතියක් ස්ථාපනය කර ඇත.
ණය අවදානම ණයගැතියන් ණය බේරුම් නොකිරීම නිසා ඇතිවන අවදානම් පාත්‍රතාව හා අලාභ	ණය ආපසු ගෙවීම පැහැරහැරීමේ බලපෑම අවම කිරීම සඳහා ණය ප්‍රතිපත්තියක් හා දැඩි පාලන ක්‍රමවේද ක්‍රියාවට නංවා ඇත. නව ණයකරුවන්ට අදාළ ණය සීමාවන් හා අනුමත කිරීමේ ක්‍රියාවලිය නිරන්තර පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. කඩිනම් පියවර ගැනීම සඳහා ණය කල් කිරීම පිළිබඳ වාර්තා මාසිකව නිරීක්ෂණය කර කළමනාකාරිත්වය වෙත වාර්තා කරනු ලැබේ.
ද්‍රවශීලතා අවදානම නියමිත දින වකවානු තුළ මූල්‍ය වගකීම් ඉටුකිරීමට නොහැකිවීම.	මුදල් කළමනාකරණය හා සැපයුම්කරුවන්ගෙන් ලැබෙන ණය පහසුකම් සමීපව නිරීක්ෂණය කිරීම සඳහා පද්ධති ක්‍රියාවට නංවා ඇත. මෙහෙයුම් මුදල් සඳහා බැංකු පහසුකම් ලබාගැනීම සිදුවන්නේ ඒ සඳහා අරමුදල් සම්පාදනය කිරීමේ හැකියාව සමාගමට තිබෙන බව සහතික කිරීම සඳහා සමීපව සමාලෝචනය කිරීමේ හා අනුමත කිරීමේ ක්‍රියාවලියක් මගිනි. ප්‍රාග්ධන ආයෝජනය කළමනාකාරිත්වය විසින් සමාලෝචනය කෙරෙන අතර තිරසරත්වය උදෙසා යථාර්ථවාදී මුදල් ප්‍රක්ෂේපණයන් සහිතව අරමුදල් සම්පාදනය කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයන් පැවතීම පදනම් කර ගෙන අනුමත කරනු ලැබේ.

ඇමරිකා එක්සත් ජනපදයේ හිල්ටන් වර්ල්ඩ්වයිඩ් ආයතනය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව සමාගම විසින් වර්ෂය පුරා මෙහෙයුම් අනතුරෙහි හෙළන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා කළමනාකරණය කිරීම සඳහා හෝටලය විසින් ක්‍රියාත්මක කෙරෙන ක්‍රියාවලීන් අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලැබේ. අවදානම් කළමනාකරණය අධීක්ෂණය කිරීමට කලාපීය කාර්යාලය විසින් වාරික සමාලෝචන සිදු කෙරෙන අතර විශෝධන පියවරයන් ගැනීම සඳහා වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවදානම් ලේඛනයේ ඇතුළත් කර ඇති ප්‍රධාන අයිතමයන් කිහිපයක් සහ ඒවායේ තත්ත්වය හා ඒවා වළක්වා ගැනීම සඳහා වන ක්‍රමෝපායන් පහත දක්වා ඇත:

අවදානම් කාණ්ඩය හා විස්තරය	අවදානම් අවම කිරීමේ පාලන ක්‍රියාමාර්ග හා ක්‍රියාකාරී සැලසුම්
මෙහෙයුම් අවදානම්	
තරඟකාරීත්ව අවදානම වෙළඳපොළ පංගුව අඩුවීම, ප්‍රතිසංස්කරණ වැඩසටහන නිසා තරඟකාරී වීමට අපොහොසත්වීම හේතුවෙන් හෝටල් කාමරවල පදිංචිය හා කාමර ගාස්තු පහළයාම	සේවා සම්පාදනයේ ඉහළම ගුණාත්මකත්වය හා ගෙවන මුදලට උපරිම තෘප්තිය සහතික කිරීම සඳහා සේවා ප්‍රමිතීන් දැඩි ලෙස අනුගමනය කිරීම. පහසුකම් හා සේවාවන් උසස් තත්ත්වයට පත්කිරීම හා වැඩිදියුණු කිරීම. සන්නාම ප්‍රමිතීන් හා ප්‍රමිතිගත මෙහෙයුම් ක්‍රියාපටිපාටිවලට (SOP) අනුකූලතාව සමාලෝචනය හා නිරීක්ෂණය කිරීම. තරඟකරුවන්ගේ ක්‍රමෝපායන් හා වෙළඳපොළට අලුතින් පැමිණෙන්නන් පූර්වාපේක්ෂා කිරීම හා ඒ අනුව ක්‍රමෝපායන් සකස් කිරීම. නිපැයුම් හා සේවාවන් ආශ්‍රිත අඛණ්ඩ නිර්මාණශීලිත්වය හා නවෝත්පාදනය. අමුත්තන්ගේ ප්‍රතිපෝෂණ අඛණ්ඩව සමාලෝචනය කිරීම හා අමුත්තන් තෘප්තියට පත්වන පරිදි මතුවන ගැටලු කඩිනමින් විසඳීම.
සන්නාම ප්‍රතිරූපය හා කීර්තිනාම අවදානම සමාගමේ සන්නාමයට හා කීර්තිනාමයට සැලකියයුතු හානියක් සිදුවිය හැකි ක්‍රියාවන් හෝ ක්‍රියාමාර්ග	පහසුකම් හා සේවාවන් ආවරණය වන පරිදි අමුත්තන්ගේ ප්‍රතිපෝෂණ සම්බන්ධයෙන් නිත්‍ය සන්නාම විගණන හා අප්‍රකාශිත විගණන සිදු කිරීම. HACCP සහ වෙනත් තත්ත්ව සහතික ප්‍රමිති සහතික ලබාගැනීම මගින් පාරිසරික, සෞඛ්‍ය හා ආරක්ෂක ප්‍රශස්ත පරිචයන්ට අනුකූලව කටයුතු කිරීම. ගෝලීය හිල්ටන් වර්ල්ඩ්වයිඩ් ප්‍රමිතීන් අනුව ආහාර සුරක්ෂිතතාව හා සනීපාරක්ෂාව පිළිබඳ ප්‍රමිතීන් නිරීක්ෂණය හා අධීක්ෂණය කිරීමට ආහාර සුරක්ෂිතතා හා සනීපාරක්ෂාව පිළිබඳ කළමනාකරුවෙකු පත් කිරීම. සුරක්ෂිතතා මට්ටම් හා අවශ්‍යතා නිරීක්ෂණය කිරීම සඳහා බලයලත් රසායනාගාරයක් විසින් පානීය ජලය, නාන තටාක ජලය, සිසිලන අටලු ජලය, අමුත්තන්ගේ කාමරවල ජලය හා ආහාර සැකසුම් ජලය පිළිබඳ නිත්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාත්මක හා රසායනික විශ්ලේෂණ සිදු කිරීම. ගෘහස්ථ වාතයේ ගුණාත්මකත්වය (IAQ) පිළිබඳ පරාමිතීන්ට අනුකූල වීම සඳහා හෝටලය තුළ වාතයේ ගුණාත්මකත්වය නිත්‍ය පදනමකින් පරීක්ෂා කිරීම. සියලු ආහාර සැකසුම්/ගබඩා උපකරණ ප්‍රශස්ත මට්ටම්වලින් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා ඉහළම ප්‍රමිතීන්ට අනුව නිවාරණ නඩත්තු වැඩසටහන් නිත්‍ය පදනමකින් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම. නිපැයුම් හා සේවාවන් සම්බන්ධයෙන් කර්මාන්තයේ ප්‍රශස්ත පරිච මිනුම් දඬු අනුගමනය කිරීම. හෝටල් ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් පළපුරුද්දක් සහිත, නිසි පරිදි සුදුසුකම් සපුරා ඇති, පුහුණු කාර්ය මණ්ඩලයක් ප්‍රධාන කළමනාකරණ තනතුරු දරන බව සහතික කිරීම. සන්නාම ප්‍රතිඥාවට අනුකූලව නවෝත්පාදක ආකාරයෙන් සේවා සම්පාදනය කිරීම. සමායතනික සමාජ වගකීම් මුල පිරීම් මගින් වගකිව යුතු සමායතන පුරවැසි භාවය ගොඩ නැගීම.
මානව සම්පත් අවදානම ප්‍රධාන කාර්ය මාණ්ඩලිකයන් හා පුහුණු කාර්ය මණ්ඩල සාමාජිකයන් අහිමි වීමේ අවදානම, අයෝග්‍ය කම්කරු ක්‍රියාකාරකම් අනතුරුදායක සේවා තත්ත්වයන්ට/රසායනික ද්‍රව්‍යයන්ට සේවකයන් නිරාවරණය වීම හේතුවෙන් තුවාල/සෞඛ්‍ය උවදුරු හටගැනීම	කාර්යසාධන තක්සේරු ක්‍රියාවලිය උපයෝගී කර ගනිමින් ව්‍යූහගත පුහුණු වැඩසටහන්, අන්තර් ක්‍රියාකාරී පාත්‍රතා පුහුණු අවස්ථා නිර්මාණය කිරීම. දෙපාර්ශ්වයට ම ජයග්‍රහණය හිමි වන ප්‍රතිඵල අත් කර ගැනීම සඳහා යහපත් සේවා-සේවක සබඳතාව, සේවක සුභසාධනය සහ වෘත්තීය සමිති සමග ඵලදායක හා විවෘත සන්නිවේදනය අවධාරණය කිරීම. මිතුරු හමු, විනෝද චාරිකා, පවුල් සුහද හමු සහ ආගමික උත්සව මගින් සමස්ත ආයතනය තුළ ඒකීයත්වය හා ස්වසන්තක භාවය පිළිබඳ හැඟීමක් පෝෂණය කිරීම. වෙළඳපොළ තුළ වැඩි තරඟකාරීත්වයක් අත්කරගැනීම පිණිස ප්‍රධාන කණ්ඩායම් සාමාජිකයන්ගේ වැටුප් මට්ටම් සීරුමාරු කිරීම. නියමිත ආරක්ෂක ප්‍රමිති හා පටිපාටි දැඩි ලෙස අනුගමනය කිරීම.

තිරසරකත්ව වාර්තාකරණය

හිල්ටන් කළමිබු හෝටලය කළමනාකරණය කරන හොටෙල් ඩිවෙලොපර්ස් පීඑල්සී (HDL) සමාගම තිරසර සත්කාරකත්වය පිළිබඳ සංකල්පයට නව අරුතක් ලබාදෙමින් සිය මෙහෙයුම් මගින් ඇතිවිය හැකි සමාජීය, පාරිසරික හා ආර්ථික බලපෑම් වලට තිරසර ආකාරයකින් විසඳුම් සෙවීම පිණිස දශක ගණනාවක් තිස්සේ එය ගොඩ නගා ගෙන ඇති කීර්තිනාමය හා සන්නාමීය ගෞරවය පදනම් කරගැනීමට අපේක්ෂා කරයි. සමාලෝචනයට ලක්වන වර්ෂය තුළදී සිය ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග කල්පවත්නා සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා දරන පරිශ්‍රමයන් සාර්ථක ලෙස තවදුරටත් පුළුල් කිරීමටද අමුත්තන්, කණ්ඩායම් සාමාජිකයන්, සැපයුම්කරුවන් හා ව්‍යාපාරික හවුල්කරුවන් යන ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතාවන් ප්‍රායෝගිකව සැපිරෙන පරිදි සිය මෙහෙයුම්වල පාරිසරික බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිවල නිරතවීමටද ඒ අතර දේශීය ප්‍රජාවන් කෙරෙහි ධනාත්මක බලපෑම් ඇතිකිරීමට හා කොටස්හිමියන්ට අඛණ්ඩ මූල්‍ය වටිනාකමක් අත්කරදීමටද හෝටලය සමත් වී ඇත.

අපගේ සාරධර්ම

H	HOSPITALITY **සත්කාරකත්වය**	– අමුත්තන්ට සුවිශේෂී අත්දැකීමක් ලබාදීම අපගේ අභිලාෂය යි.
I	INTEGRITY **අවංකභාවය**	– අපි හැමවිටම නිවැරදි දෙය කරන්නෙමු.
L	LEADERSHIP **නායකත්වය**	– අපි අපගේ ක්ෂේත්‍රය තුළත් අපගේ ප්‍රජාවන් තුළත් නායකයෝ වන්නෙමු.
T	TEAMWORK **සහයෝගය**	– අප කරන හැමදෙයකදීම කණ්ඩායමක් ලෙස කටයුතු කරන්නෙමු.
O	OWNERSHIP **හිමිකම**	– අපගේ ක්‍රියාව හා තීරණ අපගේමය.
N	NOW **දැන්**	– අපි හදිසිභාවය පිළිබඳ හැඟීමකින් හා විනයගතව කටයුතු කරන්නෙමු.

ගුණාත්මකත්වය, සේවාව හා මහජනතාව අපගේ සාර්ථකත්වයට හා සන්නාමීය ගෞරවයට තුඩුදෙන ප්‍රධාන පදනම් තුන වේ.

හෘදයංගම හා ආචාරශීලී වූත් සේවා විශිෂ්ටත්වය හා අමුත්තන් සමග උසස් තත්ත්වයෙන් කටයුතු කිරීම මූර්තිමත් කරන්නා වූත් අපගේ වෘත්තියවේදී කණ්ඩායම සම්බන්ධයෙන් හිල්ටන් කළම්බු හෝටලය සුප්‍රකටය. මෙවැනි උසස් තත්ත්වයේ කණ්ඩායමක් ගොඩනගා ගැනීමට හැකිවූයේ බඳවා ගැනීම, පුහුණුව හා නිපුණතා සංවර්ධනය සම්බන්ධයෙන් පුළුල් ක්‍රියාවලියක් අනුගමනය කිරීමෙත්, කණ්ඩායම් ගොඩ නැගීම හා තම රැකියාව කෙරෙහි ඇල්ම ඇතිකිරීම අරමුණු කරගත් සුහසාධන වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කිරීමෙත්, හිල්ටන් ගෝලීය සන්නාමයේ තානාපතිවරයෙකු වීමේ වැදගත්කම ඔවුන් විසින් අවබෝධ කරගනු ලැබීමෙත් ප්‍රතිඵලයක් ලෙස යි.

හරිත බලශක්ති වර්ධනය

හරිත බලශක්තිය යනු අපගේ සාරධර්ම, ප්‍රතිඥාවන් ඉටුකිරීම හා අපගේ කතාපුවත් සැමරීම සඳහා හිල්ටන් සමාගමේ අපට පවත්නා ඉමහත් ඇල්ම සංකේතවත් කරන්නකි. එය වනාහි අපගේ අමුත්තන්, අපගේ ප්‍රජාවන් සහ හිල්ටන් කණ්ඩායමේ සාමාජිකයන් ලෙස අප එකිනෙකා හමුවේ අප විසින් පෙන්නුම් කෙරෙන අසමසම ජීවගුණයේ ප්‍රකාශනයකි. හරිත බලශක්තිය අපගේ සංස්කෘතිය පෝෂණය කරන අතර ධනාත්මක හැඟීමකින්, ශක්තියකින් හා ඉමහත් ඇල්මකින් යුතුව සේවාවන් සම්පාදනය කිරීමට අපට හැකියාව ලබා දෙයි.

හරිත බලශක්ති කමිටුව

හරිත බලශක්ති කමිටුව අපගේ හිල්ටන් හෝටල් හා රෙසෝට් සංස්කෘතියේ ආරක්ෂකයා වේ. අපගේ සෑම හෝටලයක්ම උදෙයිගිමත් හිල්ටන් හරිත බලශක්ති සංස්කෘතියක් නිර්මාණය කරයි. මෙම කමිටුව විසින් හෝටලයේ කණ්ඩායම හිල්ටන් සාරධර්ම අනුව ජීවත් වන බවත්, හිල්ටන් ප්‍රතිඥාව ඉටු කරනබව හා අපගේ කතාපුවත් ස්මරණය කරන බවත්, ඒ අතරම අමුත්තන්, කණ්ඩායම් සාමාජිකයන්, ප්‍රජාව සහ තිරසරභාවය සඳහා දරන පරිශ්‍රමයන් කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරන බවත් සහතික කරයි. කමිටුවේ සේවය කරන කණ්ඩායම් සාමාජිකයෝ අපගේ සාරවත් හිල්ටන් සංස්කෘතියේ ගෝලීය තානාපතිවරුන් වන අතර ලොවවටා අපගේ සන්නාමයේ සාර්ථකත්වය පෙරට ගෙනයන්නෝ වෙති. තමන් ගැන සැලකිලිමත් වන බව, තමන් අගය කරන බව හා තමන්ට ගෞරව කරනබව සෑම අමුත්තෙකුටම හැඟෙනබව සහතික කිරීම සඳහා අපගේ හිල්ටන් සාරධර්ම හා අපගේ සන්නාමීය ප්‍රතිඥාව අඛණ්ඩව ප්‍රදර්ශනය වන සිත් ගන්නාසුලු ස්ථානයක් බවට සේවා ස්ථානය පත් කිරීම කමිටුවේ කාර්යභාරයයි. මෙම කමිටුව අපගේ කණ්ඩායම් සාමාජිකයන්ගේ සහ අපගේ හෝටලයේ හා ලොවවටා පිහිටි හිල්ටන් හෝටල් හා රෙසෝට්වල සාර්ථකත්වය සඳහා සෘජුව දායකවනු ඇත. හිල්ටන් හෝටලයේ අප "සත්කාරකත්වයේ ආලෝකයෙන් හා උණුසුමින් මිහිතලය පුරවාලීම" සඳහා එක්ව වැඩ කරන ගෝලීය කණ්ඩායමක් බව ලෝකයාට පෙන්නුම් කිරීම අපගේ අවශ්‍යතාවයි.

හරිත බලශක්ති කමිටුව යනු හෝටලයේ ඒ ඒ අංශයට අයත් කණ්ඩායම් සාමාජිකයන් 10ත් 20ත් අතර සංඛ්‍යාවකින් සැදුම්ලත් ස්වේච්ඡා කණ්ඩායමකි. කමිටුව මාසයකට වරක් මුණගැසී අරමුණු නියම කරගනියි, ප්‍රධාන පියවරයන් හඳුනාගනියි, අමුත්තන්, කණ්ඩායම් සාමාජිකයන් හා ප්‍රජාව සමග අඛණ්ඩව හරිත බලශක්තිය බෙදාහදා ගැනීම සඳහා අවශ්‍ය කරන පියවරයන් ගනියි. සාමාජිකයන්ගෙන් හෝටලයේ කණ්ඩායමේ හරස්කඩක් නියෝජනය වන බැවින් මේ සෑම රැස්වීමක්ම විවිධ මත, අදහස් හා දැක්මවල් හුවමාරු කරගැනෙන සාරවත් අත්දැකීමක් බවට පත්වන අතර විශිෂ්ට ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා අවශ්‍ය කරන සාමූහික ප්‍රවිෂ්ටය ගොඩනැගී ඒම එහි අනර්ඝ ප්‍රතිඵලය වේ. හිල්ටන් හෝටලයේ අප ගෝලීය කණ්ඩායමක කොටස්කරුවන් වන අතර අමුත්තා, කණ්ඩායම් සාමාජිකයා සහ ප්‍රජාව දක්වන අදහස් සාර්ථකත්වයේ නව ඉසව් කරා අප කැඳවාගෙන යයි.

අමුත්තන්ගේ අපේක්ෂාවන් ඉක්මවා යන ආකාරයකින් සේවය කිරීම සඳහා අපගේ කණ්ඩායම කරන ඉමහත් කැපවීම හිල්ටන් සන්නාමයට ළෙන්ගතු සේවාලාභීන් පිරිසක් බිහිවීමට හේතු වී ඇත. හිල්ටන් කළම්බු හෝටලය 'තෘප්තිය හා ළෙන්ගතුකම සොයා බැලීම' (SALT) සඳහා වූ ඔන්ලයින් සමීක්ෂණ වැඩසටහන යොදා ගනිමින් නිතිපතා සේවාලාභීන්ගෙන් ප්‍රතිපෝෂණ ඉල්ලා සිටියි. ලකුණු 10ක ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයකින් සමන්විත මෙම වැඩසටහන සේවාලාභීන්ගේ අත්දැකීම් නිරීක්ෂණය කරන අතර සේවාව හා අගය කිරීම අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය වන ප්‍රතිපෝෂණය උත්පාදනය කර ගැනීම සඳහා එම අත්දැකීම් පිළිබඳව තක්සේරුවක නිරත වෙයි.

අපගේ කණ්ඩායම

එකමුතුකම ඇති කිරීමේත්, ප්‍රබල කණ්ඩායම් හැඟීමක් පවත්වාගෙන යාමේත් පරිශ්‍රමයක් ලෙස වාර්ෂිකව කණ්ඩායම් සාමාජිකයන් උදෙසා පහත විස්තර කෙරෙන ආකාරයේ විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබේ.

වසර 25 කට වැඩි සේවාකාලයක් සහිත කණ්ඩායම් සාමාජිකයෝ



හිල්ටන් කණ්ඩායම් සාමාජිකයන් භුක්ති විඳින්නේ තම දායකත්වය අභ්‍යන්තර වශයෙන් හඳුනාගෙන සම්මානයට පාත්‍රකර තමන් සවිබලගන්වන සේවා සංස්කෘතියකි. කණ්ඩායම් සාමාජිකයන් උදෙසාවූ හරිත බලශක්ති සම්මාන ප්‍රදානය මාසිකව පවත්වනු ලැබේ. දෙපාර්තමේන්තු උදෙසා ජාත්‍යන්තර ගෘහපාලන සතිය වැනි විශේෂ හඳුනා ගැනීමේ වැඩසටහන් සංවිධානය කරන ලදි. ඒ යටතේ සතියේ සෑම දිනකම විවිධ උත්සව හා ක්‍රියාකාරකම් සංවිධානය කෙරෙන අතර අවසන් දිනයේ කණ්ඩායම් සාමාජිකයන් උදෙසා කුසලතා දැක්මක් සංවිධානය කර තිබිණ. F&B සතියේ උත්සවශ්‍රීයට කණ්ඩායම් භෝජනා ගාරයේදී කණ්ඩායම් සාමාජිකයන්ට සංග්‍රහ කිරීමෙන්ද සමන්විත විය. විකුණුම් හා අලෙවිකරණ කණ්ඩායම සඳහාවූ හඳුනාගැනීමේ දිනයක්ද සමාලෝචිත වර්ෂය තුළදී සංවිධානය කරනු ලැබිණ.

හිල්ටන් කළම්බු 31 වන සංවත්සර උත්සවයද උත්කර්ෂවත් අයුරින් පවත්වන ලද අතර වාසනාවන්ත කණ්ඩායම් සාමාජිකයෝ 31 දෙනෙක් සිත්ගන්නාසුලු ත්‍යාග දිනාගත්හ.

සමාලෝචිත වර්ෂය තුළදී සම්ප්‍රදාය අනුව යමින් පවත්වන ලද වාර්ෂික කණ්ඩායම් සාදය කණ්ඩායම් සාමාජිකයන්ගේ සේවා සංවත්සර සැමරීමේත් 2018 වසරේ කණ්ඩායම් සාමාජිකයා හඳුනාගෙන ගෞරවයට පාත්‍ර කිරීමේත් අවස්ථාවක් විය. එහිදී තම පවුලේ සාමාජිකයන් සමග බෙදාහදා ගැනීම සඳහා කණ්ඩායම් සාමාජිකයන්ට ත්‍යාග පාර්සලයක්ද තිළිණ කෙරිණ.

කණ්ඩායම් සාමාජිකයන්ගේ පරිශ්‍රමයන් දැනුවත්ව හඳුනාගැනීම මගින් හිල්ටන් කළම්බු හෝටලය තුළ ඔවුන් සවිබල ගැන්වෙන වාතාවරණයක් නිර්මාණය කරනු ලැබේ. CEO Light & Warmth Award ප්‍රධාන ගෝලීය සම්මාන වැඩසටහන් අතරින් එකකි (මෙය හිල්ටන් සමාගම විසින් කණ්ඩායම් සාමාජිකයන් ගෞරවයට පාත්‍ර කෙරෙන ඉහළම අවස්ථාවයි. මෙම ගෞරවාන්විත සම්මාන ප්‍රදානය අඛණ්ඩව අපේක්ෂිත කාර්යසාධන මට්ටම් ඉක්මවා යන සහ අපගේ දැක්ම, මෙහෙවර හා සාරධර්ම ඇතුළු අපගේ පොදු අභිමතාර්ථය මූර්තිමත් කරන පුද්ගලයන් තෝරා ගනියි.) 2018 වසරේ දී හිල්ටන් කළම්බු හෝටලයේ ද්විතීය ප්‍රධාන අරක්කැමියෙකු විසින් මෙම සම්මානය දිනා ගන්නා ලදී. Spirit Award, Team Member Appreciation Week, High Five iy Catch Me At My Best අනෙක් සම්මාන අතරට ඇතුළත් විය. මේ සෑම අවස්ථාවකදීම කණ්ඩායම් සාමාජිකයන්ගෙන් ප්‍රකාශයට පත්වන හිල්ටන් හැඟීම ප්‍රශංසාවට බඳුන් කරනු ලැබිණ.

කළමනාකරණ සංවර්ධන වැඩසටහන

අපගේ කළමනාකරණ සංවර්ධන වැඩසටහන විශේෂිත අදියර තුනකින් සමන්විත මාස 18ක ව්‍යූහගත සැලැස්මක් සහිත වැඩසටහනකි. විශිෂ්ට හෝටලයක් පවත්වාගෙන යාමේදී දැනසිටිය යුතු මූලික කරුණු අවබෝධ කරගැනීමට අවස්ථාව සලසා දෙමින් ආධුනික කළමනාකරුවන් උදෙසා කඩිනම් හෝටල් දිශානති වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබේ. එහි අවසන් අදියරේදී ආධුනිකයන් ශ්‍රී ලංකාවේ හෝ ගිනිකොනදිග ආසියාවේ වෙනත් හිල්ටන් හෝටලයක සේවයට යැවෙන අතර තමන්ට අයත් නායකත්ව කාර්යභාරයන් ඉටුකිරීමට ඔහුට/ඇයට මගපෙන්වනු ලැබේ. ඔහු/ඇය විසින් ව්‍යාපාරික අගය එකතු කිරීමේ ව්‍යාපෘතියක්ද සම්පූර්ණ කළයුතුය. මෙම වැඩසටහන ශ්‍රී ලංකාව තුළ පදනම් වීමට නියමිතව තිබෙන අතර එවිට හිල්ටන් හෝටලය තුළ ජාත්‍යන්තර වෘත්තියක් සඳහා දොර විවර වනු ඇත.

තිරසරකත්ව වාර්තාකරණය



රෙහාන් ප්‍රනාන්දු - *ගිනිකොනදිග ආසියා කළමනාකරණ ආධුනික*

"හිල්ටන් හෝටලයේ දී මා ලබාගත් අත්දැකීමෙන් හෝටල් ක්ෂේත්‍රය කෙබඳු තැනක්ද කියන අවබෝධය මට ලැබුණා. මේ මගේ මුල්ම රැකියා අත්දැකීම නිසාත්, ගිනිකොනදිග ආසියා කළමනාකරණ ආධුනිකයෙකු ලෙස මා තැබූ පළමු පියවර නිසාත් ඒ අත්දැකීම හරිම වැදගත් වුණා. හෝටල් කළමනාකරණයේ සෑම පැතිකඩක් ගැනම ඉගෙනගන්නත් නායකත්ව ගුණාංග සහිත වෘත්තීයවේදියෙකු බවට පත් වෙන්නත් එමගින් හිල්ටන් සන්ධිස්ථාන කරා ළඟා වීමට දායක වෙන්නත් ඒ අතර පරිසරයට හා ප්‍රජාවන්ට බලපෑමක් ඇති කිරීම සඳහා අප දරන පරිශ්‍රමයන්හි කොටස්කරුවෙකු වෙන්නත් මා උනන්දුවෙන් මග බලා සිටිනවා. ප්‍රශස්තයන්ගේ ප්‍රශස්තයාගෙන් ඉගෙනීම නිසා සාර්ථක හෝටල්කරුවෙකු වෙන්නත් සෑම අමුත්තෙකුටම ලෝක තත්ත්වයේ සත්කාරක අත්දැකීමක් ලැබෙනබව සහතික කරන්නත් මට හැකියාව ලැබේවි."

කුසලතා පූර්ණ සාමාජිකයන් අත් නොහැර රඳවා ගැනීම

සමාගම විසින් බඳවාගනු ලබන්නේ අමුත්තන්ගේ අත්දැකීමට අගයක් එකතු වන නිසි ආකල්ප හා නිපුණතා සහිත අපේක්ෂකයන්ය. හිල්ටන් සමාගම විසින් අනුගමනය කරනු ලබන සමානාත්මතා ප්‍රතිපත්තිය ආගම, ජාතිය හා ජනවාර්ගිකත්වය පදනම් කරගෙන වෙනස්කම් කිරීමට කිසිදු ඉඩක් නොතැබෙන බව සහතික කරයි. කණ්ඩායම් සාමාජිකයන්ගෙන් වැඩිදෙනෙක් ආධුනිකයන් ලෙස බඳවාගනු ලැබ ඉන් අනතුරුව අපේක්ෂිත හිල්ටන් සේවා මට්ටම් කරා ළඟා වීම සඳහා කඩිනම් සේවාස්ථ පුහුණුවක් ලබාදෙන ලද අය වෙති. මෙම ප්‍රතිපත්තිය නිසා පසුගිය දශක තුනකට වැඩි කාලය තුළදී ඉතා වැදගත් ප්‍රතිලාභ අත්වී ඇත. හෝටලයට බඳවා ගන්නා ලද අයගෙන් වැඩිදෙනෙකු හිල්ටන් හෝටලය විසින් ක්‍රියාවට නැංවෙන සංවර්ධන හා වෘත්තීය ප්‍රගතිය පිළිබඳ ලෝක තත්ත්වයේ මූලපිරීම් වලින් සහාය ලැබ නායකත්ව තනතුරු කරා ළඟා වන, ක්‍රියාකාරී ක්‍රියාකාරකයන් ලෙස ඉස්මත්තට පැමිණ ඇත.

ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛස්ථානයට පත්වෙමින් හිල්ටන් කළම්බු හෝටලය ලබා ඇති සාර්ථකත්වයට හේතුවී ඇත්තේ සමාගම යෝග්‍ය ක්ෂය මට්ටමක පවත්නාබව සහතික වන කණ්ඩායම් සාමාජිකයන්ගේ දැඩි ළෙන්ගතුකම බව කිවහැකිය. නිරන්තරයෙන් ක්‍රියාත්මක කෙරෙන අභ්‍යන්තර වැඩසටහන් සහ හිල්ටන් සමාගමේ ගෝලීය විස්තීර්ණ ඔන්ලයින් නිපුණතා සංවර්ධන වැඩසටහන් පදනම් කරගෙන වර්තමාන කණ්ඩායම් සාමාජිකයන්ට තාක්ෂණික නිපුණතා, විවිධ තත්ත්ව හා සුරක්ෂිතතා ප්‍රමිතීන්ට අදාළ පුහුණු සහ මෘදු නිපුණතා හා නායකත්ව සංවර්ධන පුහුණු පිරිනමනු ලැබේ.

සම්මාන හා විශේෂ ගෞරව

- 2018 වසරේ හිල්ටන් ගිනිකොනදිග ආසියා කලාපීය කාර්යාලය විසින් හිල්ටන් කළම්බු හෝටලයට 'මානව සම්පත් විශිෂ්ටතා සම්මානය' ප්‍රදානය කරනු ලැබිණ. මෙම සම්මානය පිරිනමන ලද්දේ සංස්කෘතිය, මහජනතාව හා නවෝත්පාදනය සම්බන්ධයෙන් මානව සම්පත් කණ්ඩායම විසින් සාක්ෂාත් කර ගන්නා ලද සාර්ථකත්වය හා ජයග්‍රහණය වෙනුවෙනි.
- හිල්ටන් බලපෑම වඩාත්ම ප්‍රශස්ත අන්දමින් ජීවමාන කිරීම නිසා 2018 වසරේදී හිල්ටන් APAC කලාපීය කාර්යාලය විසින් හිල්ටන් කළම්බු හෝටලයට 'හිල්ටන් බලපෑම් සම්මානය' ප්‍රදානය කරනු ලැබිණ.

THRIVE @ HILTON

Thrive@Hilton (හිල්ටන් සමග දියුණු වන්න) යනු අපගේ නව කණ්ඩායම් සාමාජික හර යෝජනාවයි. ශාරීරිකව, මානසිකව හා ආධ්‍යාත්මිකව වර්ධනය වීමට හා සමෘද්ධි වීමට අපගේ කණ්ඩායම් සාමාජිකයන්ට හැකියාව ලබාදීම කෙරෙහි එමගින් අවධානය යොමු කරනු ලැබේ. අපි අපගේ කණ්ඩායම් සාමාජිකයන්ගේ යහපැවැත්ම සඳහා අඛණ්ඩව ආයෝජනය කරන අතර අනුප්‍රාණය, නිර්මාණශීලිත්වය හා අර්ථාන්විත සම්බන්ධකම් යන වඩාත්ම වැදගත් දේවලට ඉඩ සලසා දීම සඳහා අප විසින් ඔවුන් වැඩ කරන හා නායකත්වය ගන්නා ආකාරය ක්‍රමයෙන් වැඩි දියුණු කරන්නෙමු.

මනස - ජීවිත කාලීන ඉගෙනීම හා දැනුවත් නායකත්වය සාක්ෂාත් කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු.

අධ්‍යාත්මය - අපි අරමුණක් ඇතිව සිහින මැවීමට හා සම්බන්ධකම් ඇති කරගැනීමට නිර්භය වන්නෙමු.

- වර්ෂය තුළදී අපගේ සියලුම කණ්ඩායම් සාමාජිකයන්ට, දෙපාර්තමේන්තු වලට Thrive මූලපිරීම් නැවත හඳුන්වාදෙන ලදි.
- සෘජුවම කණ්ඩායම් සාමාජිකයන්, කණ්ඩායම හා ඒ ඒ දෙපාර්තමේන්තු වෙත ළඟාවෙමින් ඉගෙනුම් හා සංවර්ධන කණ්ඩායමේ සහාය ඇතිව මානව සම්පත් අධ්‍යක්ෂවරයා විසින් Thrive වැඩසටහන නැවත දියත් කිරීමේ වැඩමුළු 14ක් පවත්වනු ලැබිණ. කණ්ඩායම් සාමාජිකයන්ගේ නිපුණතාවන් හා නව දැනුම යළි පණ ගැන්වීම හා වැඩි දියුණු කිරීම යනු රට තුළ සිටින හොඳම කණ්ඩායම් වලින් එකක් ලෙස හිල්ටන් කණ්ඩායම මතුවී ඒමට තුඩු දී ඇති ප්‍රධාන පදනම් දෙකයි. තමන්ගේ නිපුණතාවන් වැඩිදියුණු කරගැනීම හා දැනුම වර්ධනය කරගැනීම සඳහා සියලු කණ්ඩායම් සාමාජිකයන්ට අවස්ථාව ලැබෙන බව සහතික කරමින් ඒවා ඔවුන්ගේ වෘත්තීය වර්ධනය සඳහා මග පාදයි.
- වැඩි දියුණු කළ සලාද කෝනරයක්, නැවුම් පලතුරු හා විවිධ වාරික

ප්‍රවර්ධනයන් එක් කරමින් 2018 ඔක්තෝබර් මාසයේදී කණ්ඩායම් ආපනශාලාව වැඩි දියුණු කර ඊට නව පෙනුමක් ලබාදෙනු ලැබිණ. අපගේ කණ්ඩායම් සාමාජිකයන්ට සෞඛ්‍ය සම්පන්න හා ගැළපෙන ගුණාත්මක ආහාර ලැබෙන බව සහතික කිරීම සඳහා කණ්ඩායම් මුළුතැන්ගෙයට සංවේදී උදුනක් සම්පාදනය කරනු ලැබිණ. කණ්ඩායම් මුළුතැන්ගෙයෙහි තෙල් භාවිතය තවදුරටත් අඩු කරනු ලැබිණ.

- කණ්ඩායම් සාමාජික සඳහා වෙන් කර ඇති ලොකර වැඩි දියුණු කෙරුණු අතර එම ව්‍යාපෘතිය මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතින්නකි.
- අපි අපගේ කණ්ඩායම් සාමාජිකයන් පිළිබඳව වාරික පදනමකින් BMI පරීක්ෂාවන් සිදු කරන්නෙමු. බර පාලනය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් අවශ්‍ය කරන අය කෙරෙහි මානව සම්පත් අධ්‍යක්ෂවරයා සහ සාමාන්‍යාධිකාරිවරයා විසින් විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් පිළිබඳ දැනුවත්කම වර්ධනය කිරීම වඩාත් සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවන් තෝරා ගැනීම මගින් වඩාත් සතුටුදායක හා සෞඛ්‍ය සම්පන්න වීමට අවස්ථාව සලසා දී කණ්ඩායම් සාමාජිකයන්ට ප්‍රතිලාභ අත් කර දී ඇත.
- සියලු කණ්ඩායම් සාමාජිකයන් 'BeaGuestAtCurryLeaf' වැඩසටහනේ විශේෂ පියවරක් දියත් කරන ලදී; Thrive වැඩසටහන යටතේ කණ්ඩායම් සාමාජිකයන් උදෙසා 'WalkAsOneWalk' වැඩසටහන සංවිධානය කරන ලදී.
- සියලු කණ්ඩායම් සාමාජිකයන් උදෙසා සංවිධානය කරන ලද 'PopUpSpa' වැඩසටහන ශීර්ෂ හා ග්‍රීව සම්බාහනයක් ලබා ගැනීමට ඔවුන්ට අවස්ථාව සලසා දුන් අතර නැවතත් ශාරීරික තාරුණ්‍යයක් අත් කර ගැනීමට උදව් විය.
- අපගේ කණ්ඩායම් සාමාජිකයන්ගේ අධ්‍යාත්මික යහපැවැත්ම උදෙසා සර්ව ආගමික පූජකවරුන්ගේ සහභාගිත්වයෙන් හෝටලය තුළ ආගමික උත්සව සංවිධානය කරන ලදී.

තරුණ පරපුර සවිබලගැන්වීමේ අභ්‍යාසලාභී පුහුණු

හෝටලය විසින් තරුණ පරපුර ක්ෂේත්‍රයට ආකර්ෂණය කර ගැනීම හා රඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන වැඩසටහන් ක්‍රියාත්මක කරයි. ප්‍රමුඛ සත්කාරකත්ව අධ්‍යාපන ආයතන සමග හවුල්කාරිත්වයෙන් සංවිධානය කරන ලද අභ්‍යාසලාභී පුහුණු, කාර්මික පුහුණු හා ආධුනිකත්ව පුහුණු සඳහා අවස්ථා විවෘත කර දීම මෙම මුලපිරීම් අතරට ඇතුළත් විය. වර්තමානයේදී හිල්ටන් කළම්බු හෝටලය නිපුණතා රැකියා සඳහා තරුණයන් පුහුණු කිරීම සඳහා පිහිටුවන ලද රජයේ ආයතනයක් වන ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ (NAITA) සහාය ඇතිව හෝටලයේ විවිධ දෙපාර්තමේන්තු තුළ ආධුනිකත්ව වැඩසටහන් පහක් පවත්වා ගෙන යයි. වර්තමානයේ ක්‍රියාත්මක ආධුනිකත්ව වැඩසටහන් අතරට මේවා ඇතුළත් වේ:

- මුළුතැන්ගේ ආධුනිකත්ව වැඩසටහන (කාලය: මාස 30)
- ඉංජිනේරු ආධුනිකත්ව වැඩසටහන (කාලය: මාස 24)
- ගෘහපාලන ආධුනිකත්ව වැඩසටහන (කාලය: මාස 12)
- ආහාරපාන ආධුනිකත්ව වැඩසටහන (කාලය: මාස 18)
- මුළුතැන්ගේ භාරකාරත්ව ආධුනිකත්ව වැඩසටහන (කාලය: මාස 12).

CAREERS@HILTON

Careers@Hilton (හිල්ටන් රැකියා අවස්ථා) යනු සත්කාරකත්ව රැකියා අවස්ථා සහ ප්‍රතිලාභ පෙන්වා දෙමින් දේශීය තරුණ පරපුර හා රැකියා සොයන වෙනත් අය දිරිගැන්වීම හා අධ්‍යාපනය ලබාදීම සඳහා සෑම වසරකම මැයි මාසයේ ලොව පුරා සියලු හිල්ටන් හෝටල් හා කාර්යාල විසින් සත්කාරකත්වය සැපයෙන වැඩසටහනකි. 2014 වසරේදී ප්‍රථම වරට හිල්ටන් ප්‍රධාන විධායක නිලධාරි ක්‍රිස් නැසේටා විසින් ආරම්භ කරන ලද Careers@Hilton වැඩසටහනට සියලු හිල්ටන් ආයතනවලින් ගෝලීය අනුග්‍රහයක් ලැබෙන අතර 2019 වන විට දසලක්ෂයක් සම්බන්ධ කිරීම, සූදානම් කිරීම හා සේවයෙහි යෙදවීම සඳහා හිල්ටන් සමාගම කරන කැප වීමට සහාය දීම සඳහා ලැබෙන අගනා අවස්ථාවක් බවට එය පත්ව ඇත.





තිරසරකත්ව වාර්තාකරණය

හෝටලය සිය සමාජ බලපෑම් ව්‍යාපෘති මඟින් අඛණ්ඩව තරුණ පරපුරට දොර විවර කර ඇත:

- විවිධ ආධුනිකත්ව වැඩසටහන් පහක් - 2018 වසරේදී සමස්තයක් ලෙස ආධුනිකයෝ 103 දෙනෙක් සම්බන්ධ කර ගැනුණහ.
- කාර්මික පුහුණුව (මාස 6) - හෝටල් පාසලේ සිසුන් උදෙසා 2018 වසරේදී සමස්තයක් ලෙස කාර්මික අභ්‍යාසලාභිත්ව අවස්ථා 121ක් පිරිනමන ලදී.
- අභ්‍යාසලාභී පුහුණුව - 2018 වසරේදී අභ්‍යාසලාභී අවස්ථා 23ක් පිරිනමනු ලැබිණ.

Careers@Hilton 2018 - පැය 576ක් පුරා රටේ විවිධ කොටස්වල තරුණ තරුණියන් 5,200කට ධනාත්මක බලපෑමක් කිරීමට සමත් විය.

කාන්තාවන් සවිබලගැන්වීම සඳහා පෙරමුණ ගැනීම

2014 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ කාන්තාවෝ සංවිධානයේ සවිබලගැන්වීමේ මූලධර්ම සඳහා සහාය පළ කිරීමේ ප්‍රධාන විධායක නිලධාරි ප්‍රකාශයට අත්සන් තබා ඇති හිල්ටන් හෝටලය කාන්තාවන්ගේ නායකත්වය ප්‍රවර්ධනය කිරීම, ව්‍යාපාරික හවුල්කරුවන් ලෙස කාන්තාවන් සම්බන්ධ කර ගැනීම සහ අධ්‍යාපනය, පුහුණුව හා වෘත්තීය සංවර්ධනය ඔස්සේ කාන්තාවන් හා ගැහැණු ළමයින් උදෙසා ආයෝජනය කරන ප්‍රජා හවුල්කාරිත්වයන් පෝෂණය කිරීම කෙරෙහි ඉමහත් අවධානයක් යොමු කර ඇත. '2018 වර්ෂයේ හිල්ටන් කාන්තා සතිය' පැය 449 කට වැඩි ප්‍රමාණයක් පුරා දිගහැරුණු වැඩසටහන් 4ක් සහිතව කාන්තාවන් 435 දෙනෙකුගේ ජීවිත කෙරෙහි ධනාත්මක බලපෑමක් කරමින් සමරනු ලැබිණ.

ජාත්‍යන්තර කාන්තා දිනය

මාර්තු 8 දින පැවැත්වෙන ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව රූම් ටු රීඩ් සංවිධානයේ හවුල්කාරිත්වය ඇතිව හිල්ටන් කළමිබු හෝටලය රැයක් නතර වීමට හා 2019 ජනවාරි 28 හා 29 දෙදින පැවැත්වෙන රැකියා සඳහා මග පෙන්වීමේ වැඩසටහනක් සඳහා සහභාගි වීමට ශ්‍රී ලංකාව මධ්‍යයේ පිහිටි පිටිසර ගම්මානයක් වන හේවාහැට ප්‍රදේශයේ සිසුන් 15 දෙනෙකුට හිල්ටන් හෝටලයට පැමිණෙන ලෙස ආරාධනා කළේය. නැවතී සිටි කාලය තුළදී ඔවුන්ට සැබෑ ආගන්තුක සත්කාර අත්දැකීමක් ලබාදෙන ලද අතර ප්‍රවේශ ශාලාවේදී පිළිගැනීමෙන් පසුව අමුත්තන්ගේ කාමරවල මනා පහසුකම් පිළිබඳව මග පෙන්වීමක් කරන ලද අතර අනතුරුව රාත්‍රී ආහාරය සඳහා ශ්‍රී ලංකන් අවන්හල වෙත කැඳවාගෙන යන ලදී. පසුවදා උදෑසන ආහාරයෙන් පසුව රැකියා සඳහා මග පෙන්වීමේ චාරිකාව ආරම්භ විය. ආහාර වර්ග රැසකින් සමන්විත අවන්හලකදී දිවා ආහාරය පිළිගන්වනු ලැබිණ. අනතුරුව මානව සම්පත් අධ්‍යක්ෂවරයා කතා කරමින් සත්කාරක ක්ෂේත්‍රය තුළ පවත්නා වෘත්තීය අවස්ථා සහ කාන්තාවක ලෙස පවුල හා වෘත්තිය සමබර කර ගන්නා ආකාරය ඔවුන්ට පහදා දුන්නේය. සිසුවියන් හෝටලයෙන් පිටව යද්දී සිය නිවෙස් වෙත රැගෙන යාම සඳහා සුළු කෑම පාර්සලයක් ඔවුන්ට තිළිණ කරන ලදී. මෙම දෙදින තුළදී මෙම සිසුවියන්ට හිල්ටන් කළමිබු කණ්ඩායම් සාමාජිකයන් සමග අදහස් හුවමාරු කර ගැනීමටත් ඉගෙනීමටත් අවස්ථාව ලැබිණ.

අපගේ ප්‍රජාව

හිල්ටන් කළමිබු හෝටලය දශක තුනකට අධික කාලයක් පුරා දේශීය ප්‍රජාව සමග කටයුතු කර ඇති අතර සිය සාර්ථකත්වයට තුඩුදී තිබෙන්නේ හෝටලයේ තිරසරත්ව ප්‍රවිෂ්ටය අවබෝධ කර ගැනීමෙන් පසුව ඔවුන්ගෙන් ලද සහාය හා හොඳහිත බව හඳුනා ගනියි. 'හරිත බලශක්ති ප්‍රජා කණ්ඩායමේ' සෙවණැල්ල යටතේ ස්වේච්ඡා සේවයෙහි නිරත වීමට හෝටල් කණ්ඩායම් සාමාජිකයන් දිරි ගැන්වෙන අතර එය හෝටලයේ ප්‍රජා කටයුතු ක්‍රමෝපායේ වැදගත් අංගයකි. සියලුම ප්‍රජා කාර්යයන්හි දී ස්වේච්ඡාවෙන් සම්බන්ධ වීමට උනන්දු වෙමින් අප කාර්ය මණ්ඩල සාමාජිකත්වය දක්වන සහාය නිසා එම කාර්යයන් මැනවින් ඉටු කර ගැනීමට හැකිවී ඇත. හිල්ටන් කළමිබු ස්වේච්ඡා ජාලය තම දෛනික රාජකාරියෙන් ඔබ්බට ගොස් ප්‍රජා හා පාරිසරික යහපත උදෙසා තම දායකත්වය ලබා දීමට කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ලැබෙන මහඟු අවස්ථාවකි. මෙම බහුවිධ මුලපිරීම් සැලසුම් කරනු ලබන්නේ දිගුකාලීන වර්ධනය සඳහා අවස්ථා සම්පාදනය කරමින් රුකුල් දීම අරමුණු කරගත් ඉලක්කගත වැඩසටහන් හරහා ශ්‍රී ලාංකික ප්‍රජාවන් සවිබලගැන්වීමේ අභිප්‍රාය ඇතිවය:



- සිය 30 වන සංවත්සර සැමරීමේ අංගයක් ලෙස ජාතික පිළිකා රෝහල සමග ඊට පවත්නා සම්බන්ධය තව දුරටත් පුළුල් කර ගැනීමට අපේක්ෂා කළ හිල්ටන් කළමිබු හෝටලය පිළිකා රෝහලේ රසායනික චිකිත්සා ව්‍යාපෘතිය සඳහා ආධාර වශයෙන් 'ආයුබෝ' චිත්‍ර ප්‍රදර්ශනය සංවිධානය කළේය. හෝටලය ප්‍රදර්ශනයේ ආරම්භක රාත්‍රියේදී සුළු කෑම සපයමින් නරඹන්නන්ට සංග්‍රහ කළේය.
- ආර්ථික වශයෙන් අවාසිදායක මට්ටමක පසු වන තරුණ තරුණියන් උදෙසා රැකියා අවස්ථාවන් රැසක් උදා කරන මෙවලමක් ලෙස තාක්ෂණය ඉටු කරන කාර්යභාරයේ වැදගත්කම දිනෙන් දින ඉහළ යමින් පවතින බැවින් හෝටලය තාක්ෂණ අංශය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යාපනයට ඉමහත් වටිනාකමක් ලබා දෙමින් කටයුතු කරයි. සමාලෝචිත වර්ෂය තුළ දී හිල්ටන් කළමිබු හෝටලය විසින්

උතුරු පළාතේ වැලිඔය ප්‍රදේශයේ කල්‍යාණීපුර විද්‍යාලයේ පරිගණක විද්‍යාගාරය සඳහා පරිගණක 6ක් හා ඊට අදාළ ගෘහභාණ්ඩ පිරිනමන ලද්දේ එම කැප වීම තව දුරටත් පෙරට ගෙන යාමේ ප්‍රයත්නයක් වශයෙනි.

- හිල්ටන් කළමිබු හෝටලය රොටරි සමාජය සමග සම්බන්ධ වෙමින් වයස අවුරුදු 10-21 අතරේ පසු වන විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෙනුවෙන් සංවිධානය කෙරුණු '2018 වසරේ සන්ෂයින් ගේම්ස්' ක්‍රීඩා තරගය සඳහා පහසුකම් සැපයුවේය. හෝටලය විසින් එම අවස්ථාව සඳහා දිවා ආහාර පාර්සල් 550ක් පිරිනමනු ලැබිණ.

- ශ්‍රී ලංකාවේ සාරවත් දිදුලන සංස්කෘතික සම්ප්‍රදායන් නැසී යාමට නොදී පවත්වා ගැනීමට හෝටලය අඛණ්ඩව දායක වෙයි. ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන වඩාත්ම විචිත්‍ර හා ගෞරවනීය බෞද්ධ සංස්කෘතික උත්සව අතරින් එකක් වන කොළඹ නවම් මහා පෙරහැරේ සහභාගිකයන්ට දිවා ආහාර පාර්සල් 550ක් සහ රාත්‍රී ආහාර පාර්සල් 550ක් ලබා දීමට කටයුතු කරන ලද්දේ එම අරමුණ ඇතිවය. සෑම වසරකම මෙම පෙරහැර දැක බලා ගැනීම සඳහා ලක්ෂ සංඛ්‍යාත මහජනකායක් එක් රොක් වන අතර නවම් මහා පෙරහැර උත්සවය සමයේදී ශ්‍රී ලංකාවට පැමිණෙන 10,000 කට ආසන්න විදේශීය සංචාරකයෝද එම ජනකායේ කොටසක් වෙති.

- හිල්ටන් කළමිබු හෝටලය විසින් පුණ්‍යාධාර රැස් කිරීම පිණිස "රොක් ද රනවේ" නමින් විලාසිතා දැක්මක් සංවිධානය කර ඒ සඳහා සත්කාරකත්වය ලද අතර එමගින් උපයා ගත් මුදල අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය ප්‍රදේශයේ ජල හිඟයෙන් පීඩා විඳින ප්‍රජාවන් උදෙසා ජලය රැස් කොට බෙදා හරින ව්‍යාපෘතියකට පරිත්‍යාග කරන ලදී.

- හිල්ටන් කළමිබු හෝටලය විසින් කඩවත රෝහලක තැලසීමියා ඒකකයට මුළුතැන්ගේ උපකරණ පරිත්‍යාග කෙරුණු අතර සාර්ථක ලේ දන් දීමේ වැඩසටහනක්ද සංවිධානය කෙරිණ. කණ්ඩායම් සාමාජිකයෝ 69 දෙනෙක් එහිදී නිර්ලෝභීව සිය රුධිරය පරිත්‍යාග කළහ. තැලසීමියා රෝගීන් සඳහා පවත්නා එකම ප්‍රතිකාරය නිත්‍ය රුධිර පාරවිලයනය පමණකි. තැලසීමියා ප්‍රතිකාර ඒකකයට හා වෙනත් රෝහල්වලට බෙදා හැරීම සඳහා රාගම රෝහලේ ලේ බැංකුවට සමස්තයක් ලෙස ලේ පයින්ට් 69ක් පරිත්‍යාග කරනු ලැබිණ.

- කොළඹ කළණ මිතුරු සමාජය (ලාභ නොලබන සංවිධානයකි) වෙනස් හැකියාවන් සහිත ජනයා උදෙසා සිය වාර්ෂික ක්‍රීඩා දිනය පැවැත්වූයේ ආබාධිත වූවන්ට උපකාර කිරීමේ අරමුණ ඇතිවය. කණ්ඩායමික ක්‍රීඩා, පාපැදි තරග, දුනු ශිල්පය හා විශේෂ ළමා අංග වැනි ක්‍රීඩා අංශ සඳහා 500 කට ආසන්න ප්‍රමාණයක් සහභාගිවී සිටියහ. හිල්ටන් කළමිබු හෝටලය සහභාගිකයන් සඳහා මාළු රෝල් 400ක් හා මාළු පැටිස් 400ක් සම්පාදනය කරමින් එම අවස්ථාව සඳහා දායක වූයේය.

- හිල්ටන් කළමිබු හෝටලය 'එරවුන්ඩ් ද පර්ල්' මුල පිරීම සමග එක්ව අනිතා දොරායි විසින් ඉදිරිපත් කරන ලද 'යුගයේ ඇඟලුම්' විචිත්‍ර විලාසිතා දැක්මට සත්කාරකත්වය සැපයූ අතර එහිදී සිංගප්පූරුවේ ස්ටයිල්මාර්ට් ආයතනයේ කවිතා තුලසිදාස්ගේ ඇඳුම් නිර්මාණ ප්‍රදර්ශනය කරන ලදී. විලාසිතා දැක්මෙන් උපයා ගත් ආදායම ශ්‍රී ලංකාවේ ළමයින් 40,000කට වැඩි සංඛ්‍යාවක් පීඩා විඳින මස්තිෂ්ක පක්ෂාඝාතය





පිළිබඳව දැනුවත්කම ඇති කිරීමේ සහ රෝද පුටු 100ක් පරිත්‍යාග කිරීමේ අරමුණ ඇතිව වීල්ස් ෆෝ වීල්ස් සංවිධානය විසින් දියත් කරනු ලැබ ඇති 'එරවුන්ඩ් ද පර්ල්' මුල පිරීමට පරිත්‍යාග කරනු ලැබිණ. හිල්ටන් කණ්ඩායම් සාමාජිකයන් මෙම අවස්ථාවට සහභාගිවූ අතර හෝටලය මෙරටට පැමිණි ඇඳුම් නිර්මාණ ශිල්පීන්ට හා නිරූපිකාවන් හෝටලයේ නවාතැන් සම්පාදනය කරමින් සහ විලාසිතා දක්ම සංවිධානය කිරීම සඳහා හෝටලයේ ග්‍රෑන්ඩ් බෝල්රූම් ශාලාව සහන මිලකට ලබා දෙමින් අනුග්‍රහ දැක්වූයේය.

- කොළඹ මහ නගර සභාවේ සහාය ඇතිව බහු දිස්ත්‍රික්ක 306 සහ නුගේගොඩ මධ්‍යම සිංහ සමාජය විසින් ළමා දිනය සංවිධානය කරන ලදී. ඊට දරුවන් 1,000 ක් සහභාගිවූ අතර ඔවුන්ගේ සතුට උදෙසා මැජික් සංදර්ශනයක්, සුළු කෑම වේලක් හා ත්‍යාග ලබා දීම් ඇතුළු ක්‍රියාකාරකම් ගණනාවක් සංවිධානය කර තිබිණ. හිල්ටන්

තිරසරකත්ව වාර්තාකරණය

කළම්බු හෝටලය මෙම උත්සව අවස්ථාව සඳහා සුළු කෑම සම්පාදනය කරමින් දායකත්වය ලබා දුන්නේය.

- හිල්ටන් කළම්බු හෝටලය අපගේ ප්‍රධාන නත්තල් ගස ආලෝකවත් කිරීම සඳහා රත්මලාන බිහිරි විද්‍යාලයේ දරුවන් 32 දෙනෙකුට සත්කාරත්වය සැපයීය. හෝටලය සිය නත්තල් ක්‍රියාකාරකම්වලට මුල පිරුවේ දෙසැම්බර් 1 දින පවත්වන ලද මෙම පුණ්‍ය වැඩසටහනත් සමගිනි. එදින ක්‍රියාත්මක කළ මැජික් සංදර්ශනය හා අනෙක් ක්‍රියාකාරකම් දරුවන්ගේ ඉමහත් සතුටට හේතු විය. දරුවන් උදෙසා සුළු කෑම සංග්‍රහයක්ද පවත්වන ලද අතර තෑගිද ලබා දෙන ලදී.
- අයිඩියා ටූ අරමුදල අනාගතයේ ව්‍යවසායකයන් වීමට අපේක්ෂා කරන තරුණ තරුණියන්ගේ ව්‍යාපාරික අදහස් හා සැලසුම් වැඩි දියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ/පුහුණු වැඩසටහන් සංවිධානය කරයි. හිල්ටන් කළම්බු හෝටලය ඒ සඳහා වසර පුරා රැස්වීම් අවකාශයක් ඇතුළුව කාමර 24ක් ලබා දීමටත් ඉදිරිපත් කරන්නන්ට සහන මිලකට ආහාර ලබා දීමටත් ප්‍රතිඥා දී ඇත.
- ලොව පුරා උත්සව 100කට වැඩි සංඛ්‍යාවක් පවත්වන එක්සත් රාජධානියේ පැරණි ම උත්සව ජාලය වන බ්‍රිතාන්‍ය කලා උලෙළ සංගමයේ සාමාජිකත්වය දරන '2018 වසරේ 'පසුබිම් කථන ප්‍රාසංගික කලා උත්සවය' සඳහා සහාය දෙනු ලැබිණ. පසුබිම් කථන උත්සවය යනු එක්සත් රාජධානිය තුළ ක්‍රියාත්මක, රට තුළ පවත්නා තුරුණු දක්ෂතා ඉලක්ක කර ගනිමින් ඔවුන්ට සහාය වීම සඳහා විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නංවන සංවිධානයකි. හිල්ටන් කළම්බු හෝටලය විසින් එහි ප්‍රධාන විනිසුරු වන ආචාර්ය ජෝන් බෙල්බි මහතාට අදාළ මුළු කාල සීමාව පුරා නවාතැන් පහසුකම් සම්පාදනය කරන ලදී.
- හිල්ටන් කළම්බු හෝටලය ජාතික රෝහලේ රෝගීන් 2,500කට වට්ටක්කා සුප් ලීටර් 750 කින් සංග්‍රහ කළේය. වට්ටක්කා ගොවීන්ගේ අතිරික්ත අස්වැන්න අලෙවි කර ගැනීමට උදව් වීමේ අභිප්‍රාය ඇතිව දියත් කරන ලද මෙම ව්‍යාපෘතිය උදෙසා වට්ටක්කා කිලෝග්‍රෑම් 350ක් මිල දී ගනු ලැබිණ.
- ජාතික රෝහලේ මුළුතැන්ගෙවල් සඳහා මූලික මුළුතැන්ගේ උපකරණ සමහරක් පරිත්‍යාග කරන ලදී.
- හිල්ටන් කළම්බු හෝටලයේ ආහාර හා පාන සහ මුළුතැන්ගේ/ආහාර සැපයුම් කණ්ඩායම් 'එෆ්ඇන්ඩ්බී ඉවුම් පිහුම් හැඳුනුම් මාසය' වෙනුවෙන් පුණ්‍ය ව්‍යාපෘතියක් සංවිධානය කළේය. මහරගම අපේක්ෂා රෝහලේ ප්‍රතිකාර ලබන පිළිකා රෝගයෙන් පීඩා විඳින ළමයින් 200 දෙනෙකුට පලතුරු, වියළි සලාක හා ලිපිද්‍රව්‍ය පරිත්‍යාග කරනු ලැබිණ.

අපගේ පරිසරය

හොටෙල් ඩිවෙලොපර්ස් පීඑල්සී සමාගම පාරිසරික සංවේදී භාවයෙන් යුතු සමාගමක් ලෙස පරිසර හිතකාමී මෙහෙයුම් ක්‍රියාත්මක කරමින් අපගෙන් පරිසරයට වන බලපෑම අවම කිරීමේ පියවරයන් කෙරෙහි අවධානය යොමු කරයි. පරිසරය හා තිරසර සංවර්ධනය පිළිබඳ අවධානය ප්‍රවර්ධනය කිරීම සඳහා අපි ක්‍රමෝපායාත්මක හරිත මුල පිරීම් උදෙසා ආයෝජනය කරන්නෙමු. පරිසරය සමග පවත්වන ධනාත්මක අන්තර් ක්‍රියාව සහ වර්තමාන හා අනාගත පරම්පරාවන්ගේ අවශ්‍යතාවන් සමබර කිරීම මත තිරසර සංවර්ධනය රඳා පවතින බව අපි අවබෝධ කර ගෙන සිටිමු. පරිසරය සුරැකීම සඳහා අපගේ කණ්ඩායම් සාමාජිකයන්, සේවාලාභීන්, ව්‍යාපාරික හවුල්කරුවන් හා පෞද්ගලික/රාජ්‍ය ආයතන සමග සහයෝගී වීමට සමාගම කැප වී සිටී. සමාලෝචිත වර්ෂය තුළ දී අප විසින් ක්‍රියාත්මක කරන ලද පාරිසරික භාරකාරත්ව ව්‍යාපෘති පහත විස්තර කරනු ලැබේ:

අවම බලශක්ති පරිභෝජනය දිරි ගන්වන 'ලයිට්ස්ටේ' වැඩසටහන මගින් බලශක්ති සංරක්ෂණය

'ලයිට්ස්ටේ' වැඩසටහන මගින් ජල හා බලශක්ති පරිභෝජනය ඇතුළු සිය තිරසර කාර්යසාධනය මැන බැලීමට ලොව පුරා විසිරුණු 4,440කට වැඩි හිල්ටන් හෝටල්වලට හැකියාව ලබා දෙමින් සිය පද්ධති හා තාක්ෂණය වැඩි දියුණු කිරීමට හිල්ටන් සමාගම උනන්දුවෙන් ක්‍රියා කර ඇත. 'ලයිට්ස්ටේ' වැඩසටහන යනු කාලගුණය, හෝටලයේ රැඳී සිටින අමුත්තන්ගේ සංඛ්‍යාව සහ වෙනත් තත්ත්වයන් පදනම් කර ගනිමින් ජල හා බලශක්ති පරිභෝජනය මැන බැලීම හා පුරෝකථනය කිරීම සඳහා ඒ ඒ හෝටලයට අවකාශ සලසන හෝටලය තුළදීම යොදා ගත හැකි අතිනවීන මිනුම් ක්‍රමවේදයකි. හෝටලයේ සමස්ත කාර්යසාධනය හා පරිභෝජනය පිළිබඳව කළමනාකාරිත්වයට අනතුරු ඇඟවීම් කිරීමත්, අනාගත කාර්යසාධනයට ධනාත්මකව බලපාන පරිදි ප්‍රතිශෝධන පියවරයන් ගන්නා බව සහතික කිරීම ඉලක්ක කර ගෙන දැනුවත් තීරණ ගැනීම උනන්දු කරවීම හා ඒ සඳහා සහාය වීමත් මෙමගින් ඉටු වේ.

පරිසර දූෂණය හා කසළ කළමනාකරණය

හිල්ටන් සමාගම පරිසරය සුරැකීම සඳහා ස්වාභාවික සම්පත් වගකීම් සහගත හා තිරසර ආකාරයෙන් ප්‍රයෝජනයට ගැනීම අවධාරණය කරන ප්‍රවිෂ්ටයක් අඛණ්ඩව යොදා ගනිමින් සිටියි. මෙම ප්‍රවිෂ්ටය ශ්‍රී ලාංකික සත්කාරක අංශය තුළ නායකයෙකු ලෙස සමාගම හිමි කර ගෙන තිබෙන තත්ත්වයටත්, දේශීය හෝටල් කර්මාන්තය තුළ තිරසරත්ව හා පාරිසරික බලපෑම වැදගත් ප්‍රමුඛතාවක් ලෙස නොසලකන ලද සමයක මින් දශක දෙකකට පමණ පෙර සමාගම විසින් තහවුරු කරන ලද සාරධර්මවලටත් අනුරූප වේ.

හෝටලයේ මෙහෙයුම් හේතුවෙන් විශාල කසළ ප්‍රමාණයක් උත්පාදනය වන අතර එම තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා කාර්යක්ෂම කසළ කළමනාකරණ තාක්ෂණයක් අවශ්‍ය වේ. කාබනික අපද්‍රව්‍ය රැස් කර කොම්පෝස්ට් පොහොර සකස් කිරීම හා සත්ත්ව ආහාර සඳහා ප්‍රයෝජනයට ගනු ලැබේ. ඉතිරි කසළ, වීදුරු හා ලෝහ අපද්‍රව්‍ය ලෙස වෙන් කර අනතුරුව වියළි හා තෙත අපද්‍රව්‍ය වශයෙන් ද වෙන් කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේ දී ඝන අපද්‍රව්‍ය ඒවා එකතු වන ස්ථානවලදීම - එනම්, මුළුතැන්ගෙය, ආපන ශාලාව හා බාරය, පිරිසුදු කිරීම්, ලිනන් කාමරය, නඩත්තු ඒකකය, ගබඩාව හා අමුත්තන්ගේ කාමර යනාදි සෑම දෙපාර්තමේන්තුවකදීම - ප්‍රායෝගිකව වෙන් කරනු ලැබේ. මෙම

කසළ වෙන් කිරීම දෙනිකව හෝටල් පරිශ්‍රයේදී සිදු කෙරේ. තෙවන පාර්ශ්වීය ප්‍රතිචක්‍රීකරණ සමාගමක් සමග එළඹී ඇති ගිවිසුම් ප්‍රකාරව PET ප්ලාස්ටික් බෝතල් ප්‍රතිචක්‍රීකරණය කරනු ලැබේ. උත්පාදනය වන සියලු ඝන අපද්‍රව්‍ය තව දුරටත් ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම් සඳහා මහ නගර සභාව විසින් එක්රැස් කෙරෙන බැවින් ඉඩම් ගොඩ කිරීම සඳහා යවනු ලබන්නේ අවම කසළ ප්‍රමාණයක් බව සහතික වේ. සියලු ආහාර/කාබනික අපද්‍රව්‍ය සත්ත්ව ආහාර ලෙස තෙවන පාර්ශ්වීය ගොවිපළකට පමණක් යවනු ලබන අතර ඉඩම් ගොඩ කිරීම සඳහා කිසිදු ආහාර අපද්‍රව්‍යයක් යවනු නොලැබේ.

එපමණක් නොව, හෝටලයේ සියලු මෙහෙයුම්වලදී අපද්‍රව්‍ය අවම කිරීම අරමුණු කර ගත් පුහුණු හා කළමනාකරණ මූල පිරිම් දියත් කරන අතර ආහාර අපතේ යාම පිළිබඳව කණ්ඩායම් සාමාජිකයන් දැනුවත් කිරීමද හෝටලය විසින් සිදු කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළදී හරිත පරිසරයක් ඇති කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කිහිපයක් පහත දැක්වේ:

- ප්‍රජා හා තිරසරත්ව කමිටුවල කණ්ඩායම් සාමාජිකයෝ 28 දෙනෙක් ලෝක සාගර දිනයට සමගාමීව සංවිධානය කරන ලද වෙරළ පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය සඳහා සහභාගි වූහ. එහිදී ප්ලාස්ටික් හා පොලිතීන් කිලෝග්‍රෑම් 50කට ආසන්න ප්‍රමාණයක් එක්රැස් කරන ලදී. එම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා දිස්ත්‍රික්කයේ මහ නගර සභාවට භාර දෙන ලදී. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන ලද වෙරළ පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියේදී අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 50කට ආසන්න ප්‍රමාණයක් එක්රැස් කරන ලදී.
- පරිසර දිනය සමරමින් හරිත ගොඩනැගිලි මණ්ඩලය විසින් හරිත පා ගමන සංවිධානය කරන ලද අතර හිල්ටන් කළම්බු හෝටලයේ කණ්ඩායම් සාමාජිකයන් ඇතුළු 3,000ක පමණ පිරිසක් කිලෝමීටර් 5කට ආසන්න දුරක් පා ගමනින් ගමන් කරමින් පැළ සිටුවීමෙහි නිරත වූහ.
- ජූලි මස 21 දින ක්‍රියාත්මක කරන ලද බේරේ වැව හා නගරය පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය සාර්ථක ලෙස නිමාවට පත් විය. හෝටලය වටා පිහිටි භූමි ප්‍රදේශය හා එහි නගර සීමාවන් සහ IIPonte අවන්හල ආසන්නයේ බේරේ වැව් ඉවුර පිරිසිදු කිරීම අප විසින් භාර ගන්නා ලදී. මෙම සියලු ප්‍රදේශවලින් පොලිතීන්/ප්ලාස්ටික් හා වෙනත් ස්වාභාවිකව නොදිරන අයිතම කිලෝග්‍රෑම් 15ක් පමණ එක්රැස් කිරීමට අපට හැකි විය. එපමණක් නොව අප විසින් බේරේ වැව තුළ සහ අපට ළඟා විය නොහැකි වෙනත් ප්‍රදේශවල පිරිසිදු කිරීමේ කටයුතු සිදු කිරීමට උදව් කළ අනෙක් කම්කරුවන්ට දිවා ආහාර පාර්සල් 500 ක් සම්පාදනය කිරීමද කරනු ලැබිණ.

ප්ලාස්ටික් භාවිතය අවම කිරීම

සිය මෙහෙයුම්වලදී ප්ලාස්ටික් භාවිතය අවම කිරීමේ මෙහෙයුමක යෙදෙමින් හෝටලය මේ වන විට සියලු F&B අවන්හල් හා කාමර සේවා සඳහා කඩදාසිවලින් නිම කළ බීම බට හඳුන්වාදී ඇති අතර ප්ලාස්ටික් බීම බට නිසා ඇති විශාලතම පාරිසරික දූෂණය හා තර්ජනය නතර කර ඇත. එපමණක් නොව සියලු F&B අවන්හල් මේ වන විට ප්ලාස්ටික් කොක්ටේල් බට භාවිතයද නතර කර ඇති අතර ඒ වෙනුවට බට ලීයෙන් නිම කළ බට ආදේශ කර ඇත. අමුත්තන් අතර ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය අවම කිරීම සඳහා හෝටලයෙන් බැහැර ගෙන යන සියලු ආහාර කේක් පෙට්ටි හා ඩිලිවරි බෑග් වැනි කඩදාසිවලින් නිම කළ බෑග්වල පමණක් අසුරනු ලැබේ. හෝටලය විසින් ප්‍රයෝජනයට ගනු ලබන ප්ලාස්ටික්/පොලිතීන් ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු වීමට මෙම පියවරයන් දායකවී ඇත. එපමණක් නොව හෝටලය මේ වන විට භාවිත කරන්නේ ස්වාභාවිකව දිරා යන කසළ මලු පමණකි.

වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික් පානීය ජල බෝතල් අනවශ්‍ය ලෙස උත්පාදනය වීමකින් තොරව ජලය පානය කිරීමට අවස්ථාව සලසා දෙමින් කණ්ඩායම් සාමාජිකයන්ට අයත් සියලු අංශ හා කාර්යාලවලට ලීටර් 20 ජල යන්ත්‍ර සපයා ඇත.

අරමුණක් සහිත චාරිකා ප්‍රවර්ධනය කිරීම සඳහා හෝටලයේ තිරසරත්ව කණ්ඩායම වෙරළ පිරිසිදු කිරීම වැනි මූල පිරිම් කිහිපයක් සංවිධානය කරයි. වාර්ෂික වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන ජූනි 8 දින පැවැත්වෙන ලෝක සාගර දිනයදා සංවිධානය කර තිබූ අතර පානදුර වෙරළ තීරයෙන් කසළ ප්ලාස්ටික් හා පොලිතීන් කිලෝග්‍රෑම් 50කට වැඩි ප්‍රමාණයක් එක් රැස් කොට ප්ලාස්ටික්/පොලිතීන් අපද්‍රව්‍ය තිරසර ආකාරයෙන් බැහැර කිරීම සඳහා පානදුර මහ නගර සභාවට භාර දෙන ලදී.

2018 ලෝක පරිසර දිනයදා හරිත ගොඩනැගිලි මණ්ඩලය විසින් කොළඹ සංවිධානය කරන ලද පැළ සිටුවීමේ ව්‍යාපෘතියකටද හිල්ටන් හෝටලය සහභාගි විය.

මිහිතල හෝරාව

මිහිතල හෝරාව සහ එක් සංකේතාත්මක පියවරක් පමණක් ගැනීම: ගෝලීය උණුසුමට මිනිසාගෙන් ඇති වන බලපෑම පිළිබඳ පණිවුඩයක් සහිත ආකර්ෂණීය අයිස් ප්‍රතිමාවකින් සමන්විත විදුලි පහන් නිවා දැමීමේ සම්ප්‍රදායික පිළිවෙත ක්‍රියාවට නැංවෙන මිහිතල හෝරාවද හිල්ටන් හෝටලය විසින් සමරන ලදී. හිල්ටන් ගෝලීය අලෙවි සතිය තුළදී හිල්ටන් කළම්බු හෝටලයේ කණ්ඩායම පැළ සිටුවීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ අතර 2018 ඔක්තෝබර් මාසයේ පැවති මෙම ගෝලීය අලෙවි සතියේදී හෝටල් උද්‍යානය තුළ පැළ කිහිපයක් සිටුවීම සඳහා අපගේ වැදගත් අමුත්තන් කිහිප දෙනෙකුටද ආරාධනා කරනු ලැබිණ.

ලිනන් නැවත භාවිත කිරීමේ වැඩසටහනට සහභාගි වෙමින් ජලය ඉතිරි කිරීමට අපගේ කාමරවල පදිංචි සියලුම අමුත්තන් නිරන්තරයෙන් දිරි ගැන්වෙන අතර ඒ සඳහා ඔවුන්ට ආරාධනා කරනු ලැබේ. අපගේ 'ආරක්ෂා කිරීමේ සිට සංරක්ෂණය කිරීම දක්වා' වැඩසටහන අපගේ රෙදි සෝදන ස්ථානවලදී ජලය හා බලශක්තිය ඉතිරි කිරීම මගින් පරිසරයට අපගෙන් ඇති වන බලපෑම අවම කරයි.

පුළුල් පරිසර ආරක්ෂණ මූල පිරිම් සඳහා පුරෝගාමීවී ඇති හිල්ටන් කළම්බු හෝටලය සම්පත් භාවිතය තව දුරටත් අවම කළ හැකි නව විධික්‍රම අඛණ්ඩව විමසා බලන අතර සිය පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගනිමින් බලශක්තිය ඉතිරි කිරීමේ තිරසර පරිවයන් සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීම මගින් කසළ කළමනාකරණය කිරීමෙහි නිරත වෙයි.

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ අධ්‍යක්ෂවරුන් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ස්වකීය වාර්තාව සහ සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

1 වර්ෂය පිළිබඳ සමාලෝචනය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සමාගමේ ව්‍යාපාරික කටයුතු හා එහි කාර්යසාධනය පිළිබඳව මූල්‍ය ප්‍රතිඵල හා අනාගත ක්‍රමෝපායාත්මක සංවර්ධනයන් පිළිබඳ අදහස් දැක්වීම්ද ඉදිරිපත් කරමින් කරන ලද සමාලෝචනය සභාපතිතුමාගේ ප්‍රකාශයේ ඇතුළත් කර ඇත. (පිටු අංක 19.)

2 ප්‍රධාන ක්‍රියාකාරකම

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ සමාගමේ හිමිකරුවන්ගේ හා මෙහෙයුම්කරුවන්ගේ ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සහ ඒ සඳහා ඉඩම්, ගොඩනැගිලි හා වෙනත් දේපළ ඉදි කිරීම, මිලදී ගැනීම, බදු ගැනීම හෝ වෙනත් ආකාරයකින් අත්පත් කර ගැනීම සහ ඒවා වැඩි දියුණු කිරීම හා ඒවාට අවශ්‍ය උපකරණ හා ගෘහභාණ්ඩ සම්පාදනය කිරීමයි.

3 මූල්‍ය ප්‍රකාශ

සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිටු අංක 59 සිට 85 දක්වා ඉදිරිපත් කර ඇත.

4 අඛණ්ඩ භාවය

පූර්වාපේක්ෂා කළ හැකි අනාගතයේදී සිය ව්‍යාපාරික මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගැනීමට ප්‍රමාණවත් සම්පත් සමාගම සතු බවට අධ්‍යක්ෂවරු සෑහීමට පත්ව සිටිති. ඒ අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩභාවය පදනම් කර ගනිමින් සකස් කරනු ලැබ ඇත.

5 විගණක වාර්තාව

සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණක වාර්තාව 55 වන පිටුවේ ඉදිරිපත් කර ඇත.

6 ගණකාධිකරණ ප්‍රතිපත්තිය

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී උපයෝගී කර ගත් වැදගත් ගණකාධිකරණ ප්‍රතිපත්ති 63 වන පිටුවේ 3 වන සටහනෙහි දක්වා ඇත.

7 බදුකරණය

මූල්‍ය ප්‍රකාශවල 26 වන සටහනෙහි දක්වා ඇති අනුපාතික මත බදු ප්‍රතිපාදන ගණනය කර ඇත.

8 ලාභාංශ

ඇමරිකන් ඩොලර් මිලියන 52ක ඇස්තමේන්තුගත පිරිවැයක් දරමින් සමාගම විසින් මේ වන විට ක්‍රියාත්මක කෙරෙමින් පවත්නා ප්‍රතිසංස්කරණ වැඩසටහන නිසා 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාන්‍ය කොටස් මත ලාභාංශ ගෙවීමක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ නොකෙරේ.

9 අධ්‍යක්ෂ මණ්ඩලය හා ඔවුන්ගේ කොටස් හිමිකාරත්වය

2018 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් අයගෙන් සමන්විත විය:

ක්‍රිෂාන්ත ප්‍රසාද් කුරේ මහතා	-	සභාපති
ධිෂණා අමරසේකර මෙනවිය	-	අධ්‍යක්ෂ
ජේ.එම්.ශ්‍රූ.පී. ජයමහ මහතා	-	අධ්‍යක්ෂ
අතුල සේනානායක මහතා	-	අධ්‍යක්ෂ
ටෙහානි එස්.ඒ. මැතිව් මහත්මිය	-	අධ්‍යක්ෂ
දිනුක් කොළඹගේ මහතා	-	අධ්‍යක්ෂ
එම්. ශෙස්මින් මන්සූර් මහතා	-	අධ්‍යක්ෂ
ඩබ්.එස්.එල්.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා	-	අධ්‍යක්ෂ
සොනාලි ලියනමාන මහත්මිය	-	අධ්‍යක්ෂ
ප්‍රවීර් ධනෝෂ් සමරසිංහ මහතා	-	අධ්‍යක්ෂ

සමාගමේ ඉහත සඳහන් කිසිදු අධ්‍යක්ෂවරයෙක් සමාගමේ කොටස් හිමිකරුවෙක් නොවේ.

සටහන:
අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස් වීම්

දිනුක් කොළඹගේ මහතා	-	19.04.01 දින සිට
එම්. ශෙස්මින් මන්සූර් මහතා	-	19.04.03 දින සිට

අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම්

සී.පී.ආර්. රණසිංහ මහත්මිය	-	19.04.09 දින සිට
එස්.එන්. අලස් මහතා	-	19.04.09 දින සිට

ඉහත සඳහන් අධ්‍යක්ෂවරු සමාගමේ කොටස් හිමිකරුවෝ නොවෙති.

10 පිළිබැඳියා ලේඛනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 192 (2) වගන්තියේ විධිවිධාන සලසා දී ඇති පරිදි අධ්‍යක්ෂවරුන් සාමාන්‍ය අනාවරණයන් සිදු කර ඇත. අධ්‍යක්ෂවරුන් සතුව යම් පිළිබැඳියාවක් ඇති කවර හෝ ගිවිසුමක් වෙතොත් මෙම විධිවිධානය පරිදි මූල්‍ය ප්‍රකාශවල 37.1 සටහන යටතේ ඒවා අනාවරණය කරනු ලැබේ.

11 අධ්‍යක්ෂවරුන්ගේ වැටුප්

ගණකාධිකරණ කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂවරුන්ගේ වැටුප් හා සෙසු වරප්‍රසාද පහත දක්වා ඇති පරිදි වේ:

අධ්‍යක්ෂවරයෙකුගේ මුළු වැටුප: රු. 4,853,000/-

12 අධ්‍යක්ෂවරුන්ගේ පිළිබැඳියා / අදාළ පාර්ශ්වීය ගනුදෙනු

ඉහත තොරතුරු මූල්‍ය ප්‍රකාශවල 34 වන සටහන යටතේ දක්වා ඇත. අනාවරණය කර ඇති බැඳීම් හැර සමාගම සමග ඇති කර ගෙන තිබෙන හෝ ඇති කර ගැනීමට යෝජිත කිසිදු කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් වෙනත් කිසිදු සෘජු හෝ වක්‍ර බැඳීමක් අධ්‍යක්ෂවරුන්ට නොමැත.

13 විගණකවරුන්ට ගෙවීම්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකවරුන්ට ගෙවූ හෝ ගෙවීමට ඇති මුදල රු. 2,469,000/- ක් වේ.

14 පරිත්‍යාග

සමාගම 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ කිසිදු පරිත්‍යාගයක් සිදු කර නොමැත.

15 සංයුක්ත පාලනය

සංයුක්ත පාලනය පිළිබඳ යහපත් මූලධර්ම ක්‍රියාත්මක කෙරෙන බව සහතික කිරීම සඳහා සමාගම විසින් පද්ධති හා ක්‍රියා පටිපාටි ක්‍රියාවට නංවා ඇත. සමාගම තුළ එසේ ක්‍රියාවට නංවා ඇති පරිචයන් පිළිබඳ සංක්ෂිප්ත විශ්ලේෂණයක් වාර්ෂික වාර්තාවේ පිටු අංක 34 සිට 36 දක්වා ඉදිරිපත් කර ඇත.

16 විගණන කමිටුව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විගණන කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ:

අධ්‍යක්ෂවරයාගේ නම

ප්‍රවීර් සමරසිංහ මහතා - (සභාපති) ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ජේ.එම්.ය්‍ූ.පී. ජයමහ මහතා - ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ
එම්. ශෙස්මින් මන්සූර් මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

2019 මැයි 29 දින සිට බලාත්මක වන අයුරින් පහත සඳහන් පරිදි කමිටුව ප්‍රතිනිර්මාණය කරනු ලැබිණ:

ප්‍රවීර් සමරසිංහ මහතා - (සභාපති) ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
චතුරි රණසිංහ මහත්මිය - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ඩබ්ලිව්.එස්.එල්.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

විගණන කමිටුවේ වාර්තාව වාර්ෂික වාර්තාවේ 52 වන පිටුවෙහි දක්වා ඇත.

17 වැටුප් කමිටුව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ වැටුප් කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි විය:

අධ්‍යක්ෂවරුන්ගේ නම්

අතුල සේනානායක මහතා - (සභාපති, ස්වාධීන විධායක නොවන)
දිනුක් කොළඹගේ මහතා - (ස්වාධීන විධායක නොවන)
ඩබ්ලිව්.එස්.එල්.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා - (ස්වාධීන විධායක නොවන)
ක්‍රිෂාන්ත කුරේ මහතා - (ස්වාධීන විධායක නොවන)

18 අදාළ පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අදාළ පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි විය:

අධ්‍යක්ෂවරුන්ගේ නම්

අතුල සේනානායක මහතා - (සභාපති, ස්වාධීන විධායක නොවන)
දිනුක් කොළඹගේ මහතා - (ස්වාධීන විධායක නොවන)
ඩබ්ලිව්.එස්.එල්.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා - (ස්වාධීන විධායක නොවන)

'අදාළ පාර්ශ්වීය අනාවරණ' පිළිබඳ LKAS 24 අනුව අදාළ පාර්ශ්වීය ගනුදෙනු ලෙස වර්ගීකරණය කළ හැකි ගනුදෙනු ඇත්නම් අධ්‍යක්ෂවරුන් ඒවා අනාවරණය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශවල 37 වන සටහන යටතේ ඉදිරිපත් කර ඇත.

19 ප්‍රාග්ධන වියදම

වැදගත් ප්‍රාග්ධන කැප වීම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශවල 34 වන සටහන යටතේ දක්වා ඇත.

20 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශවල 12 වන සටහන යටතේ දක්වා ඇත.

21 ප්‍රකාශිත ප්‍රාග්ධනය

2018 දෙසැම්බර් 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 20,466,456,858/-ක් වූ අතර එකක් රු. 10ක් වන සාමාන්‍ය කොටස් 2,046,645,686කින් එය සමන්විත විය.

22 මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සමාගමේ කටයුතු පිළිබඳ සැබෑ හා සාධාරණ අදහසක් ප්‍රකාශ වන පරිදි එහි මූල්‍ය ප්‍රකාශ සකස් කොට ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂවරුන් සතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට හා 2017 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව සකස් කරනු ලැබ ඇති බව අධ්‍යක්ෂවරු තහවුරු

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව

කරති. ඒ අනුව, මෙහි ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශ මගින් 2018 දෙසැම්බර් 31 දිනට සමාගමේ කටයුතු පිළිබඳවත්, එදිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභය පිළිබඳවත් සැබෑ හා සාධාරණ අදහසක් ප්‍රකාශ වන බවට අධ්‍යක්ෂවරු සෑහීමට පත්ව සිටිති.

23 ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට සහ සමාගමේ සේවකයන්ට මේ දක්වා ගෙවිය යුතු සියලු ම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කර ඇති බවට සිය අවබෝධය හා විශ්වාසය අනුව අධ්‍යක්ෂවරු සෑහීමට පත්ව සිටිති.

24 ශේෂ පත්‍ර සැකසීමට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශවල 30 වන සටහන යටතේ දක්වා ඇති සිදුවීම් හැර ශේෂ පත්‍ර දිනට පසුව අදාළ ගිණුම්වල ගැළපීම් කළ යුතු හෝ අනාවරණය කළ යුතු කිසිදු සිදුවීමක් සිදු වී නොමැත.

25 විගණකවරු

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය ප්‍රකාරව විගණකාධිපතිවරයා සමාගමේ විගණකවරයා වශයෙන් තව දුරටත් ක්‍රියා කරයි.

26 රැස්වීම් පිළිබඳ නිවේදන

සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ රැස්වීම් නිවේදනය වාර්ෂික වාර්තාවේ 86 වන පිටුවෙහි දක්වා ඇත.

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

.....	.....
ධනුක රන්ජිත් සමරසිංහ	**ටෙහානි මැතිව්**
අධ්‍යක්ෂ	*අධ්‍යක්ෂ*

සීමාසහිත එස්.එස්.පී. කෝපරේට් සර්විසස් (පෞද්ගලික) සමාගම
සමාගම් ලේකම්වරු

2019 සැප්තැම්බර් 17 දින
කොළඹදීය

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීතීන්ට සහ 2007 අංක 7 දරන සමාගම් පනතට අනුකූලව සකස් කොට ඉදිරිපත් කරනු ලැබ ඇත.

සමාලෝචනයට ලක් වන වර්ෂය තුළ සමාගමේ මෙහෙයුම් පිළිබඳවත්, සමාගමේ තත්ත්වය පිළිබඳවත්, සැබෑ හා සාධාරණ අදහසක් මෙම මූල්‍ය ප්‍රකාශ මගින් ඉදිරිපත් වේ.

ප්‍රමාණවත් තොරතුරු ලබා ගැනීම පිණිස සහ නිරවද්‍ය වාර්තා පවත්වා ගෙන යාමට පහසුකම් සැලසීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පද්ධති හා ක්‍රියා පටිපාටි ස්ථාපිත කරනු ලැබ ඇත.

යෝග්‍ය ගණකාධිකරණ ප්‍රතිපත්ති අනුගමනය කරනු ලැබ ඇත.

අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ක්‍රියාවට නංවනු ලැබ ඇත.

සමාගමේ වත්කම් ආරක්ෂා කිරීමට, අවංක භාවය හා නිරවද්‍ය භාවය සහ මෙහෙයුම් දත්තවල ආරක්ෂාව සහතික කිරීමට සහ වංචනික ක්‍රියා හා වෙනත් අක්‍රමිකතා වැළැක්වීමට හා අනාවරණය කර ගැනීමට සියලු යුක්ති සහගත පියවරයන් ගෙන ඇති බවට අධ්‍යක්ෂවරු විශ්වාසය පළ කරති.

සිය අවබෝධය අනුව, ශේෂ පත්‍ර දිනට සමාගම විසින් ගෙවිය යුතු සියලු බදු, තීරු බදු හා ගාස්තු ගෙවා නිම කර ඇති බව නැතහොත් අදාළ අවස්ථාවල ඒ සඳහා විධිවිධාන යොදා ඇති බවද අධ්‍යක්ෂවරු තහවුරු කර සිටිති.

සමාගමේ මූල්‍ය හා වෙනත් වාර්තා විගණකාධිපතිවරයා විසින් පරීක්ෂා කරනු ලැබ ඇත. විගණකවරුන්ගේ මතය ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවේ දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

ධනුක රන්ජිත් සමරසිංහ
අධ්‍යක්ෂ

ටෙහානි මැතිව්
අධ්‍යක්ෂ

2019 සැප්තැම්බර් මස 17 දින
කොළඹදීය

විගණන කමිටු වාර්තාව

විගණන කමිටු ප්‍රඥප්තිය

විගණන කමිටු ප්‍රඥප්තිය මගින් සම්පාදිත විධිනියෝග ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකමිටුවක් ලෙස ක්‍රියාත්මක වන විගණන කමිටුව, සමාගමේ මූල්‍ය කටයුතුවලට අදාළ සෑම කරුණක්ම පරීක්ෂා කර බැලීමත්, මූල්‍ය වාර්තාකරණය සමාලෝචනය කිරීම හා නිරීක්ෂණය කිරීමත් සිදු කරයි.

විගණන කමිටුවේ කාර්ය භාරය

තීරණ ගැනීම සඳහා සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට හා මූල්‍ය වාර්තාකරණයේ ගුණාත්මක භාවයට අදාළ මෙහෙයුම් සඳහා විධිමත් අභ්‍යන්තර පාලන පද්ධති පවත්නා බව තහවුරු කිරීම සම්බන්ධ වගකීම් ඉටු කිරීමේ දී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වන ඵලදායී අනුකමිටුවක් ලෙස විගණන කමිටුව ක්‍රියා කරයි:

- සමාගමේ මූල්‍ය ප්‍රකාශයේ සහ සමාගමේ අභ්‍යන්තර විගණන හා මූල්‍ය පාලන පද්ධතියේ අවංකභාවය
- අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්යසාධනය
- සමාගමේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ වාර්ෂික ස්වාධීන විගණනය
- අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා අපක්ෂපාතීව සමාලෝචනය කිරීම සහ සොයා ගැනීම් හා නිර්දේශ සලකා බැලීම
- ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට සමාගම දක්වන අනුකූලතාව
- කොළඹ කොටස් හුවමාරුව වෙත නිකුත් කිරීමට නියමිත විගණනය නොකරන ලද ත්‍රෛමාසික ගිණුම් සමාලෝචනය කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ දැඩිව පිළිපැදීම

විගණන කමිටුවේ සංයුතිය:

විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ:

- **ප්‍රවීර් සමරසිංහ මහතා** - (සභාපති) (ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ)
- **එම්. ශෙස්මින් මන්සූර් මහතා** - (ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ)
- **ප්‍රියන්ත ජයමහ මහතා** - (විධායක නොවන අධ්‍යක්ෂ සහ භාණ්ඩාගාර නියෝජිත)

විගණකාධිපතිවරයාගේ නියෝජිතයෝ නිරීක්ෂකයන් ලෙස රැස්වීමට සහභාගි වූහ. 2019 මැයි 29 දින සිට බලපවත්වන පරිදි සහ පහත සඳහන් පරිදි කමිටුව ප්‍රතිනිර්මාණය කරන ලදි:

- **ප්‍රවීර් සමරසිංහ මහතා** (සභාපති) (ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ)
- **චතුරි රණසිංහ මහත්මිය** (ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ)
- **ධනුක සමරසිංහ මහතා** (ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ)

ප්‍රවීර් සමරසිංහ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සහ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අධිසාමාජිකයෙකු වන අතර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකි; ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු දරමින් වසර 30කට අධික කාලයක් වෘත්තීය හා ව්‍යාපාරික අත්දැකීම් ලබා ඇත්තෙකි.

ජේ.එම්.ඌ.සී. ජයමහ මහතා ශ්‍රී ලංකා රජයේ ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු ලෙස රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳව වසර ගණනාවක අත්දැකීම් ලබා ඇත. කොළඹ විශ්වවිද්‍යාලයෙන් සංවර්ධන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ගත් ජයමහ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ගණකාධිකරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙන් බලපත්‍රලාභී සහතිකයද හිමි කර ගෙන සිටී.

ශෙස්මින් මන්සූර් මහතා සැපයුම් දාම කළමනාකරණය ප්‍රධාන විෂය ලෙස හදාරමින් එක්සත් ජනපදයේ ඇරිසෝනා ප්‍රාන්ත විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය ලබා ගත්තේය. උපාධිය හැදෑරීම සඳහා ඔහුට ශිෂ්‍යත්වයක්ද පිරිනමනු ලැබූ අතර අත් කර ගත් විශිෂ්ට අධ්‍යාපන ප්‍රතිඵල නිසා ඔහුගේ නම ගෞරවනීය 'පීඨාධිපති ලැයිස්තුවට'ද ඇතුළත් කරනු ලැබිණ.

ධනුක සමරසිංහ මහතා ඕස්ට්‍රේලියාවේ ඩිකින් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර ව්‍යාපාර හා අලෙවිකරණය පිළිබඳ උපාධිධාරියෙකු වන අතර යළි අලුත් කළ හැකි බලශක්තිය, වැවිලි, කුරුඳු, විවේකය හා තේ ඇතුළු විවිධ කර්මාන්ත ක්ෂේත්‍ර ගණනාවක ව්‍යාපාරික කටයුතුවල නිරත වෙමින් වේගයෙන් වර්ධනය වන සමායතනයක් වන TAD සමාගම් සමූහයේ සාඩම්බර සම-ආරම්භකයෙක්ද වේ. අනුබද්ධ සමාගම් 27කට අධික සංඛ්‍යාවකින් සමන්විත මෙම සමාගම් සමූහයේ සභාපති තනතුර දරන සමරසිංහ මහතා සමාගමේ සමස්ත මෙහෙයුම් පිළිබඳ ක්‍රමෝපායඥයෙකු ලෙස විශිෂ්ට කාර්යභාරයක් ඉටු කරමින් සිටී.

චතුරි රණසිංහ මහත්මිය නීතිඥවරියක සහ ප්‍රසිද්ධ නොතාරිස්වරියක ලෙස කටයුතු කරයි. 1980 සැප්තැම්බර් මාසයේ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරියක බවට පත්වූ ඇය 1989 වසරේදී එක්සත් රාජධානියේ සොලිසිටර් විභාගය සම්පූර්ණ කළාය. මේ වන විට "චතුරි රණසිංහ ඇසෝසියේට්ස්" නාමය හා අභිධානය යටතේ දේපළ පැවරුම් කටයුතු හා විශේෂිත නීති කටයුතුවල නිරතව සිටින ඇය ඊට පෙර 1992 වසරේ සිට 2015 වසර දක්වා "ගුණවර්ධන ඇන්ඩ් රණසිංහ ඇසෝසියේට්ස්" නීති සමාගමේ හවුල්කරුවෙකු ලෙස කටයුතු කළාය.

මේ හැරුණු විට ඇය, කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලයේ සභාපතිනිය ලෙසද ශ්‍රී ලංකා ජාතික බෙරුම්කරණ මධ්‍යස්ථානයේ ප්‍රධානියා ලෙසද 1990 අංක 46 දරන කාර්මික ප්‍රවර්ධන පනත යටතේ කාර්මීකරණ කොමිසමේ සාමාජිකාවක ලෙසද කාන්තා ව්‍යවසායික මණ්ඩලයේ සාක් සභාවේ උපසභාපතිනිය ලෙසද ඊට අමතරව තවත් ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙසද කටයුතු කරයි.

විගණන කමිටු රැස්වීම්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් 4ක් පවත්වනු ලැබිණ. නිසි බලධාරී, අධ්‍යක්ෂ මණ්ඩල උපදේශක, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී, හොටෙල් ඩිවෙලොපර්ස් සමාගමේ ගණකාධිකාරී, හිල්ටන් කළමිබු හෝටලයේ සාමාන්‍යාධිකාරී සහ මූල්‍ය අධ්‍යක්ෂ, අර්නස්ට් ඇන්ඩ් යංග් ආයතනයේ අභ්‍යන්තර විගණකවරුන්, විගණකාධිපතිවරයාගේ නියෝජිතයන් සහ හිල්ටන් කළමිබු හෝටලයේ කළමනාකරණ විගණකවරු ආරාධනාව මත විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගි වූහ.

බාහිර විගණකවරු

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය බලාත්මක කිරීමත් සමග 2016 වසරේ සිට විගණකාධිපතිවරයා සමාගමේ බාහිර විගණකවරයා බවට පත් විය. මේ අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශය විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලදී.

අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ සමාලෝචනය

සමාගමේ අභ්‍යන්තර විගණකවරුන් වශයෙන් කටයුතු කරන අර්නස්ට් ඇන්ඩ් යංග් ආයතනය, විගණන කමිටුව විසින් අනුමත කරනු ලබන විගණන සැලැස්ම පදනම් කර ගෙන, හෝටල් මෙහෙයුම් පිළිබඳව සවිස්තර විගණනයක් සිදු කරයි. අභ්‍යන්තර විගණනයේ අරමුණ කළමනාකාරිත්වය විසින් ස්ථාපනය කරන ලද අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳව ස්වාධීන සමාලෝචනයක් සිදු කිරීම සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට අදාළ කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දරන කාර්ය මණ්ඩලය කොතෙක් දුරට එකී පාලන පද්ධතිවලට අනුකූලව කටයුතු කරන්නේද යන්න තීරණය කිරීමයි. අභ්‍යන්තර විගණකවරුන්ගේ වාර්තාවේ සොයා ගැනීම් හා අන්තර්ගතය පිළිබඳව කළමනාකාරිත්වය සමග සාකච්ඡා කොට කාලීන පදනමකින් නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග ගනු ලබන අතර ඒ පිළිබඳ වාර්තා විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සමාලෝචනය

කොළඹ කොටස් හුවමාරුව (CSE) වෙත නිකුත් කිරීමට පෙර විගණන කමිටුව විසින් සමාගමේ ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කොට අනුමැතිය ලබා දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති/ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති **(IFRS/ SLFRS)** අනුගමනය කිරීම

මේ දක්වාවූ අදාළ සෑම කාල පරිච්ඡේදයකදීම සමාගම විසින් ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදී.

අනුකූලතා ප්‍රකාශ පිළිබඳ සමාලෝචනය

සමාගම අදාළ සියලු ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූල බව සහතික කිරීම සඳහා කමිටුව විසින් අනුකූලතා ප්‍රකාශ සමාලෝචනය කරනු ලැබිණ. ඊට අමතරව, සමාගම අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණවලට අනුව කටයුතු කරන බවට කමිටුව සෑහීමට පත්ව සිටී.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සමාලෝචනය

බාහිර විගණකවරුන්, අභ්‍යන්තර විගණකවරුන් සහ හිල්ටන් කළමිබුහෝටලයේ කළමනාකරණ විගණකවරුන් සමග එක්ව විගණන කමිටුව විසින් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සමාගමේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කරන ලදී. විගණන කමිටුවට අවශ්‍ය තහවුරු කිරීම් හා නිල ප්‍රකාශ ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයා විසින් සම්පාදනය කරන ලදී. විගණන කමිටු සමාලෝචනය, ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන සමාගම් පනතින් නියම කර ඇති තොරතුරු අවශ්‍යතාවන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා පහසුකම් සැලසූ අතර, එදිනට සමාගමේ තත්ත්වය පිළිබඳවත් සමාලෝචනයට ලක් වන වර්ෂය තුළ සමාගමේ කටයුතු පිළිබඳවත් සැබෑ හා සාධාරණ අදහසක් ඉදිරිපත් කළේය.

නිගමනය

සමාගමේ වත්කම් හා මූල්‍ය තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරනු ලැබ ඇති බවත්, විගණනය කරන ලද ගිණුම්වලින් අනාවරණය වන මූල්‍ය ප්‍රතිඵල සැලකිය යුතු අවප්‍රකාශවලින් තොර බවත්, විගණන කමිටුවේ අදහසයි.



ප්‍රවීර් සමරසිංහ
සභාපති
විගණන කමිටුව

දිනය: 2019 සැප්තැම්බර් 17

මූල්‍ය වාර්තා

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } MED/C/HDL/1/18/FA-01 මබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 10 June 2019

සභාපති
හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාව

1 මූල්‍ය ප්‍රකාශ

1.1 මතය

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගණකාධිකරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශයක් ඇතුළත් මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණනය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධාන සහ 2018 අංක 19 දරන ජාතික විගණන පණතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ සිදු කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරෙනු ඇත.

මාගේ මතය අනුව, මේ සමග ඇති මූල්‍ය ප්‍රකාශවලින්, 2018 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සහ එදිනට අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා එහි මූල්‍ය ප්‍රවාහ පිළිබඳව, ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව සැබෑ හා සාධාරණ අදහසක් ඉදිරිපත් වේ.

අවධාරණය කළ යුතු කරුණු

මාගේ මතය තත්ත්වාගණනය නොකරමින්, සමාගම විසින් අඛණ්ඩව භාවිත කරනු ලබන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද රු. 2,063,000,000ක පිරිවැයක් සහිත වත්කම් විස්තර කරන 12.3 මූල්‍ය ප්‍රකාශ සටහන වෙත අවධානය යොමු කරවමි. සමාගම විසින් වරලත් තක්සේරුකරුවෙකුගේ සහාය ඇතිව සෑම වත්කමක් සම්බන්ධයෙන්ම විස්තරාත්මක වත්කම් සත්‍යාපනයක් හා තක්සේරුවක් සිදු කරනු ලැබ ඇත. වත්කම්වල වෙළඳපොළ වටිනාකම පිළිබිඹු කරමින් 2019 ජනවාරි 01 දින සිට බලාත්මක වන පරිදි ප්‍රතිතක්සේරු ආකෘතිය යොදා ගැනීමට සමාගම අපේක්ෂා කරයි.

1.2 මතය සඳහා පදනම

මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මා හට ඇති වගකීම් මාගේ වාර්තාවේ 'මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම්' කොටස තුළ තව දුරටත් විස්තර කරනු ලැබේ. මා විසින් අත් කර ගනු ලැබ තිබෙන විගණන සාක්ෂි මාගේ මතය සඳහා පදනමක් සම්පාදනය කිරීමට ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

විගණකාධිපතිවරයාගේ වාර්තාව

1.3 ප්‍රධාන විගණන කරුණ

වෘත්තීයවේදී මතය අනුව, ප්‍රධාන විගණන කරුණ යනු, ප්‍රවර්තන කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේදී වඩාත් ම වැදගත් වන කරුණයි. මෙම කරුණ කෙරෙහි අවධානය යොමු කරන ලද්දේ සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේ සහ ඒ පිළිබඳ අපගේ මතය ගොඩ නැගීමේ සන්දර්භය තුළ වන අතර මෙම කරුණ සම්බන්ධයෙන් වෙන ම මතයක් සම්පාදනය කරනු නොලැබේ. විගණනයේදී මෙම කරුණ කෙරෙහි අවධානය යොමු කළ ආකාරය විස්තර කරනු ලබන්නේ මෙම සන්දර්භය තුළය.

ප්‍රධාන විගණන කරුණ අදාළ පාර්ශ්වයන් සමග කළ ගනුදෙනු (37 වන සටහන)	**විගණනයේදී කරුණ කෙරෙහි අවධානය යොමු කළ ආකාරය** විගණන ක්‍රියා පටිපාටි ඇතුළත් කරන ලද අතර පහත දැක්වෙන ක්‍රියා පටිපාටිද ඒ අතර වේ.
සමාගම, හෝටලයේ ප්‍රතිසංස්කරණ වැඩසටහනට අරමුදල් සම්පාදනය කිරීම සඳහා, සමාගමේ අදාළ පාර්ශ්වයක් වන DFCC බැංකුවෙන් ඇමරිකන් ඩොලර් මිලියන 30ක කෙටි කාලීන ණය පහසුකමක් සහ රු. මිලියන 500ක අයිරා පහසුකමක් ලබා ගෙන ඇත. මෙම ගනුදෙනු සමීප බැඳියාවකින් තොරව සිදු නොකිරීම සහ/හෝ මෙම ගනුදෙනුවල අයිතිවාසිකම් හා බැඳීම් පිළිබඳ ගණකාධිකරණ සලකා බැලීම නිවැරදි නොවීම සමාගමේ ප්‍රතිඵල කෙරෙහි බලපෑමට ඉඩ තිබීමෙන් ඇති විය හැකි අවදානම නිසා අදාළ පාර්ශ්වීය ගනුදෙනුව විගණනයට වැදගත් බව සලකන ලදී.	■ අදාළ පාර්ශ්වීය ගනුදෙනු හඳුනා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම. ■ අදාළ මට්ටමේ ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සම්බන්ධය ඇතුළු අභ්‍යන්තර ක්‍රියා පටිපාටිවලට අනුකූලව ගනුදෙනු අනුමත කෙරෙන බව සත්‍යාපනය කිරීම. ■ ගිවිසුම්, ගිවිසුම්වල සංශෝධන, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡා සමාලෝචනය කිරීම. ■ ගිවිසුම්වල නියමයන් හා කොන්දේසිවලට අනුකූලව අයිතිවාසිකම් හා බැඳීම් තක්සේරු කිරීම. ■ අධ්‍යක්ෂවරුන් විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් 550 ප්‍රමිතියට අනුකූලව සම්බන්ධතා සහ ගනුදෙනු අනාවරණය කරනු ලැබ ඇත්දැයි නිශ්චය කිරීම. ■ කළමනාකාරිත්වයෙන් සහ අදාළ අවස්ථාවලදී පාලනය භාර අයවලුන්ගෙන් ලිඛිත ප්‍රකාශ ලබා ගැනීම.

1.4 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ සහ පාලන අධිකාරියේ වගකීම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව සැබෑ හා සාධාරණ අදහසක් ලැබෙන පරිදි මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සම්බන්ධයෙන්, සහ වංචා හෝ දෝෂ නිසා ජනිත කිසිදු සැලකිය යුතු අවප්‍රකාශයකින් තොර මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට පහසුකම් සැලසීම සඳහා කළමනාකාරිත්වයේ තීරණය අවශ්‍ය බැවින් අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන්, කළමනාකාරිත්වය වගකීම දරයි.

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, අදාළ පරිදි අඛණ්ඩ භාවයට අදාළ කාරණා අනාවරණය කරමින්, සහ සමාගම ඈවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට කළමනාකාරිත්වය අදහස් කරන්නේ නම් හෝ එසේ කිරීම හැර වෙනත් යථාර්ථවාදී විකල්පයක් නැත් නම් මිස අඛණ්ඩ භාවය පිළිබඳ ගණකාධිකරණ පදනම යොදා ගනිමින්, අඛණ්ඩ භාවයෙන් යුතුව පෙරට යාමට සමාගමට තිබෙන හැකියාව තක්සේරු කිරීම කළමනාකාරිත්වයේ වගකීමකි.

පාලන අධිකාරිය, සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතුය.

සමාගමේ වාර්ෂික හා වාරික මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට පහසුකම් සැලසීම සඳහා, 2018 අංක 19 දරන ජාතික විගණන පණතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමාගම විසින් සිය සියලු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳව විධිමත් පොත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම්

සමස්තයක් ලෙස ගත් විට මූල්‍ය ප්‍රකාශයන් වංචා හෝ දෝෂ නිසා ජනිත කිසිදු සැලකිය යුතු අවප්‍රකාශයකින් තොර බවට සාධාරණ සහතික කිරීමක් ලබා ගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාවක් නිකුත් කිරීම මාගේ අභිප්‍රාය වේ. සාධාරණ සහතික කිරීමක් යනු ඉහළ පෙළේ සහතික කිරීමක් වුවද, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති අනුව සිදු කරන ලද විගණනයකදී, සැලකිය යුතු අවප්‍රකාශයක් ඇත් නම් හැම විට ම එය අනාවරණය කර ගැනෙන බවට සහතිකයක් නොවේ. වංචා හෝ දෝෂ නිසා අවප්‍රකාශ ජනනය විය හැකි අතර, ඒවා

තනි තනිව හෝ එකට ගත් විට මෙම මූල්‍ය ප්‍රකාශ පදනම් කර ගෙන පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපානු ඇති බවට යුක්ති සහගත ලෙස අපේක්ෂා කළ හැකි නම්, සැලකිය යුතු අවප්‍රකාශ ලෙස සැලකේ.

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අනුව සිදු කරනු ලබන විගණනයක කොටසක් ලෙස මා විසින් විගණනය මුළුල්ලෙහි වෘත්තීයවේදී විචාර බුද්ධියෙන් යුතුව කටයුතු කරන අතර වෘත්තීයවේදී සැකය පවත්වා ගෙන යනු ලැබේ. ඒ හැරුණු විට මා විසින්:

- වංචා හෝ දෝෂ නිසා මූල්‍ය ප්‍රකාශ තුළ සැලකිය යුතු අවප්‍රකාශ අන්තර්ගත වීමෙන් ඇති විය හැකි අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම, එම අවදානම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ මාගේ මතය සඳහා පදනමක් සම්පාදනය කිරීමට ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි අත් කර ගැනීම සිදු කරනු ලැබේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සකස් කිරීම, චේතනාන්විතව බැහැර කිරීම, වරදවා විස්තර කිරීම හෝ අභ්‍යන්තර පාලනය ප්‍රතික්ෂේප කිරීම වංචාවේදී සිදු විය හැකි බැවින්, වංචාවේ ප්‍රතිඵලයක් ලෙස ජනිත සැලකිය යුතු අවප්‍රකාශයක් අනාවරණය කර නොගැනීමෙන් ඇති වන අවදානම, දෝෂයේ ප්‍රතිඵලයක් ලෙස පැන නගින අවදානමකට වඩා බලවත්ය.

- සමාගමේ අභ්‍යන්තර පාලනයේ කාර්යසාධකත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම සඳහා නොව, අවස්ථාවට උචිත විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම පිණිස, විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගනු ලැබේ.

- යොදා ගෙන ඇති ගණකාධිකරණ ප්‍රතිපත්තිවල උචිත භාවය සහ කළමනාකාරිත්වය විසින් සිදු කෙරෙන විගණන ඇස්තමේන්තු හා ආශ්‍රිත අනාවරණය කිරීම්වල යුක්තිසහගත භාවය තක්සේරු කරනු ලැබේ.

- කළමනාකාරිත්වය විසින් අඛණ්ඩභාවය පිළිබඳ ගණකාධිකරණ පදනම යොදා ගනු ලැබීමේ උචිත භාවය, සහ අත් කර ගත් විගණන සාක්ෂි පදනම් කර ගෙන, සමාගමට අඛණ්ඩ භාවයකින් යුතුව පෙරට යාමට තිබෙන හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කරවන සිදුවීම් හෝ තත්ත්වයන් සම්බන්ධයෙන් සැලකිය යුතු සංශයක් පවතීද යන්න නිශ්චය කරනු ලැබේ. සැලකිය යුතු සංශයක් පවතින බවට මා විසින් නිගමනය කෙරෙන්නේ නම්, මූල්‍ය ප්‍රකාශයන් තුළ කර ඇති අනාවරණයන් පිළිබඳ මාගේ විගණක වාර්තාවේදී අවධානය යොමු කරවීම, හෝ එම අනාවරණයන් ප්‍රමාණවත් නොවේ නම් මාගේ මතය වෙනස් කිරීම, මා විසින් කළ යුතු වේ. මාගේ නිගමන මාගේ විගණන වාර්තාවේ දින දක්වා අත් කර ගත් විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් නිසා සමාගමට අඛණ්ඩ භාවයකින් යුතුව පෙරට යාම නතර කිරීමට සිදු විය හැකිය.

- අනාවරණයන්ද ඇතුළු මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය, සහ මූල්‍ය ප්‍රකාශවලදී පාදක ගනුදෙනු හා සිදුවීම් සාධාරණ ඉදිරිපත් කිරීමක් වන ආකාරයකින් ඉදිරිපත් කෙරෙන්නේද යන්න තක්සේරු කරනු ලැබේ.

මා විසින්, මාගේ විගණනය අතරතුරදී මවිසින් හඳුනා ගන්නා ලද දේ අතර පවත්නා අභ්‍යන්තර පාලනය ආශ්‍රිත සැලකිය යුතු අඩුලුහුඬුකම් ඇතුළු වැදගත් විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන්, පාලනය භාර අයවලුන් සමග අදහස් හුවමාරු කර ගනු ලැබේ.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනත පහත දැක්වෙන අවශ්‍යතා සැපිරීම සඳහාවූ විශේෂිත විධිවිධානවලින් සමන්විත වේ:

- මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් අත් කර ගෙන ඇති අතර, මාගේ විමර්ශනයෙන් පෙනී යන පරිදි නම්, 2007 අංක 7 දරන සමාගම් පණතේ 163 (I) (d) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පණතේ 12 (a) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව සමාගම විධිමත් ගණකාධිකරණ වාර්තා පවත්වා ගෙන ගොස් ඇත.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශ, 2007 අංක 7 දරන සමාගම් පණතේ 151 වගන්තියේ අවශ්‍යතාවට අනුකූල වේ.

- ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශ, 2018 අංක 19 දරන ජාතික විගණන පණතේ 6 (1) (d)(iii) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, පූර්ව වර්ෂයට අනුරූප වේ.

- ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශ, 2018 අංක 19 දරන ජාතික විගණන පණතේ 6 (1) (d) (iv) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, මා විසින් පූර්ව වර්ෂයේදී ඉදිරිපත් කරන ලද සියලු නිර්දේශවලින් සමන්විත වේ.

වැදගත් කාරණාවලට සීමාකෘතව ක්‍රියාවට නංවන ලද ක්‍රියා පටිපාටි සහ අත් කර ගත් සාක්ෂි පදනම් කර ගෙන,

- 2018 අංක 19 දරන ජාතික විගණන පණතේ 12 (d) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, සමාගමේ පාලක මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකුට ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතුවලින් බැහැරව සමාගම විසින් ඇති කර ගනු ලැබූ කිසිදු ගිවිසුමක් සම්බන්ධයෙන් කවර හෝ සෘජු හෝ වක්‍ර බැඳියාවක් ඇති බව ප්‍රකාශ කිරීම සඳහා,

විගණකාධිපතිවරයාගේ වාර්තාව

- 2018 අංක 19 දරන ජාතික විගණන පණතේ 12 (f) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද අදාළ කිසිදු ලිඛිත නීතියක්, පොදු හා විශේෂිත නිර්දේශයක් සමාගම විසින් නොපිළිපදිනු ලැබ ඇති බව ප්‍රකාශ කිරීම සඳහා,
- 2018 අංක 19 දරන ජාතික විගණන පණතේ 12 (g) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, සමාගම විසින් සිය බලතල, කාර්යයන් හා වගකීම් ඉටු කරනු ලැබ නැති බව ප්‍රකාශ කිරීම සඳහා,
- 2018 අංක 19 දරන ජාතික විගණන පණතේ 12 (h) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, සමාගමේ සම්පත් අදාළ කාල රාමු ඇතුළත සහ අදාළ නීතිවලට අනුකූලව සකසුරුවම් සහගතව, කාර්යක්ෂම ලෙස හා ඵලදායක අයුරින් ප්‍රසම්පාදනය කොට හා ප්‍රයෝජනයට ගෙන නොමැති බව ප්‍රකාශ කිරීම සඳහා,

කිසිවක් මාගේ අවධානයට ලක්වී නැත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දොළහ සඳහා

	සටහන්	මාස 12 2018.12.31 රු. '000	මාස 12 2017.12.31 රු. '000
ආදායම	05	2,910,540	3,015,362
විකිණුම් පිරිවැය		(593,251)	(550,824)
දළ ලාභය		2,317,289	2,464,538
ආයෝජන ආදායම	06	15,627	25,533
වෙනත් ලාභ හා අලාභ	07	54,355	29,429
පරිපාලන වියදම්		(1,509,457)	(1,491,586)
ක්ෂය කිරීම්		(500,861)	(461,542)
වෙනත් වියදම්		(462,421)	(383,491)
මූල්‍ය පිරිවැය	08	(40,994)	(9,905)
බදුවලට පෙර ලාභය/(අලාභය)	09	(126,461)	172,976
ආදායම් බදු වියදම	10	(1,046)	85,041
අදාළ කාල පරිච්ඡේදය සඳහා බදුවලට පසු ලාභය/(අලාභය)		(127,507)	258,017
වෙනත් විස්තීර්ණ ආදායම්			
සේවක ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලාභය/(අලාභය)		14,996	2,415
අදාළ කාල පරිච්ඡේදය සඳහා මුළු විස්තීර්ණ	-	(112,512)	260,432
කොටසක ඉපැයීම් - මූලික (රු.)	11	(0.05)	0.13

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 38 දක්වාවූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල ඒකාබද්ධ අංගයක් වේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනට

වත්කම්		2018.12.31 රු. '000	2017.12.31 රු. '000
ජංගම නොවන වත්කම්			
දේපළ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ	12	7,485,222	7,818,434
කල් බදු ඉඩම - ප්‍රධාන දේපළ	13	6,539,823	6,610,530
කල් බදු ඉඩම භාවිතය සඳහා ඇති අයිතිය	14	2,011	3,017
නොනිමි ප්‍රාග්ධනය		591,537	243,414
මුළු ජංගම නොවන වත්කම්		14,618,593	14,675,395
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	15	63,494	58,009
අය විය යුතු වෙළඳ හා වෙනත් වත්කම්	16	138,929	151,640
අදාළ පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල්	17	5,634	1,354
වෙනත් වත්කම්	18	255,149	180,503
ජංගම මූල්‍ය වත්කම්	19	6,904	135,608
මුදල් හා බැංකු ශේෂ	20	241,848	225,599
මුළු ජංගම වත්කම්		711,958	752,713
මුළු වත්කම්		15,330,551	15,428,109
ස්කන්ධය හා වගකීම්			
කොටස් හිමියන්ගේ ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	21	20,466,456	20,466,456
සංචිත	22	187,217	161,348
සමුච්චිත අලාභය		(6,732,856)	(6,594,476)
මුළු ස්කන්ධය		13,920,817	14,033,329
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	23	106,259	122,581
විලම්බිත බදු වගකීම්	24	397,616	396,570
මුළු ජංගම නොවන වගකීම්		503,875	519,152
ජංගම වගකීම්			
ගෙවිය යුතු වෙළඳ හා වෙනත් වත්කම්	25	293,987	411,346
අදාළ පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල්	26	10,581	12,558
ගිවිසුම් වගකීම්	27	106,118	68,228
රඳවා ගැනීමේ ගාස්තු - ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය		62,234	111,028
බැංකු අයිරාව		432,938	272,468
මුළු ජංගම වගකීම්		905,859	875,628
මුළු වගකීම්		1,409,733	1,394,780
මුළු කොටස් ස්කන්ධය හා වගකීම්		15,330,551	15,428,109
කොටසක ශුද්ධ වත්කම - (රු.)	28	6.80	6.86

2007 අංක 7 දරන සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබ ඇති බව මම සහතික කරමි.

මූල්‍ය ප්‍රධානි

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2019 මැයි මස 17 වන දින අත්සන් තබන ලදී.

අධ්‍යක්ෂ *අධ්‍යක්ෂ*

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 38 දක්වාවූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල ඒකාබද්ධ අංගයක් වේ.

ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දොළහ සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ, ප්‍රතිෂ්ඨාපන සංචිත	සමුච්චිත අලාභය	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
2017 ජනවාරි 01 දිනට ශේෂය	**20,466,456**	**21,896**	**(6,715,455)**	**13,772,897**
මාස 12 කාල පරිච්ඡේදය සඳහා ලාභය	-	-	258,017	258,017
සේවක ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලාභය/(අලාභය), ශුද්ධ බදු - අලාභය	-	-	2,415	2,415
ගෘහභාණ්ඩ, සවි කිරීම් හා උපකරණ ප්‍රතිෂ්ඨාපනය	-	(128,983)	128,983	-
ගෘහභාණ්ඩ, සවි කිරීම් හා උපකරණ සංචිතය මාරු කිරීම	-	268,435	(268,435)	-
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,466,456**	**161,348**	**(6,594,476)**	**14,033,329**
මාස 12 කාල පරිච්ඡේදය සඳහා ලාභය	-	-	(127,507)	(127,507)
සේවක ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලාභය/(අලාභය), ශුද්ධ බදු - අලාභය	-	-	14,996	14,996
ගෘහභාණ්ඩ, සවි කිරීම් හා උපකරණ ප්‍රතිෂ්ඨාපනය	-	(90,320)	90,320	-
ගෘහභාණ්ඩ, සවි කිරීම් හා උපකරණ සංචිතය මාරු කිරීම	-	116,189	(116,189)	-
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,466,456**	**187,217**	**(6,732,856)**	**13,920,817**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 38 දක්වාවූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල ඒකාබද්ධ අංගයක් වේ.

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දොළහ සඳහා

	31.12.2018 රු. '000	31.12.2017 රු. '000
බදුවලට පෙර ලාභය	(126,461)	172,976
ගැළපීම්		
ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය	500,861	461,542
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන	21,106	22,576
බිඳ වැටීම් සඳහා ප්‍රතිපාදන	(104)	1,329
පොලී වියදම්	40,994	9,905
දේපළ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ අලෙවියෙන් ලද ලාභය	(6,070)	(6,620)
අනුපලබ්ධි විනිමය ලාභ	(17,391)	(884)
පොලී ආදායම	(15,627)	(25,533)
නොනිමි ප්‍රාග්ධන වෙනස් වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	397,308	635,291
භාණ්ඩ තොගවල (වැඩි වීම්)/අඩු වීම්	(5,485)	(6,521)
ලැබිය යුතු වත්කම් (වැඩි වීම)/අඩු වීම	12,711	(2,797)
අදාළ පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල් වැඩි වීම/අඩු වීම	(6,256)	2,373
වෙනත් වත්කම් (වැඩි වීම)/අඩු වීම	11,809	446
ගෙවිය යුතු වෙළඳ හා වෙනත් වත්කම් වැඩි වීම/(අඩු වීම)	(117,359)	(5,701)
ගිවිසුම් බැරකම් වැඩි වීම/(අඩු වීම)	37,890	(27,262)
මෙහෙයුම් මගින් උපයා ගත් මුදල	330,617	595,829
ගෙවූ බදු	(16,738)	(20,737)
විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම	(22,432)	(22,907)
මෙහෙයුම් කටයුතු මගින් උපයා ගත් ශුද්ධ මුදල	291,447	552,185
ආයෝජන කටයුතු ආශ්‍රිත මූල්‍ය ප්‍රවාහ		
දේපළ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ මිල දී ගැනීම	(280,162)	(111,128)
නොනිමි ප්‍රාග්ධනය සඳහා කරන ලද ආයෝජන	(283,310)	(629,947)
දේපළ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ විකිණීමෙන් ලද මුදල	6,070	6,620
කල් බදු ඉඩම භාවිතය සඳහා ඇති අයිතියෙහි සිදු වූ ශුද්ධ වෙනස්කම්	1,006	(3,017)
ලද පොලී ආදායම	15,627	25,533
ආයෝජන කටයුතු සඳහා යෙදවූ ශුද්ධ මුදල	(540,769)	(711,939)
මූල්‍යකරණ කටයුතු ආශ්‍රිත මූල්‍ය ප්‍රවාහ		
මූල්‍ය පිරිවැය	(40,994)	(9,905)
මූල්‍යකරණ කටයුතු සඳහා යෙදවූ ශුද්ධ මුදල	(40,994)	(9,905)
මුදල් හා මුදල් හා සමාන වත්කම්වල ශුද්ධ වැඩි වීම/(අඩු වීම)	(290,317)	(169,659)
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් හා සමාන වත්කම්	106,130	258,398
කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් හා සමාන වත්කම්	(184,186)	88,739

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 38 දක්වාවූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල ඒකාබද්ධ අංගයක් වේ.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දොළහ සඳහා

1. සමායතන තොරතුරු

1.1 සාමාන්‍ය

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත හා ලියාපදිංචි කරන ලද සීමිත බැරකම් සහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ අංක 02 දරන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම සත්කාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාරික කටයුතුවල නිරතව සිටින අතර හිල්ටන් කළම්බුහෝටලයේ හිමිකාරත්වය දරයි.

1.3 මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දුන් දිනය

2019 මැයි 17 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙනු ලැබිණ.

2. මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

සමාගමේ මූල්‍ය ප්‍රකාශ (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, කොටස් වටිනාකමේ වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ ගණකාධිකරණ ප්‍රතිපත්ති හා සටහන්) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද පොදුවේ SLFRS ලෙස හඳුන්වනු ලබන ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන සමාගම් පණතේ අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කරනු ලැබ ඇත.

2.2 මිනුම් පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් පහත සඳහන් වැදගත් අයිතමය හැර සෙසු මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත:

- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම පිළිබඳ බැරකම නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම ලෙස පිළිගනු ලැබේ.

2.3 ක්‍රියාකාරී ව්‍යවහාර මුදල හා ප්‍රදර්ශක ව්‍යවහාර මුදල

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇති අතර එය සමාගමේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල මෙන් ම ප්‍රදර්ශක ව්‍යවහාර මුදලද වේ. අන්‍යාකාරයකින් ප්‍රකාශ කර නැත් නම්, ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

2.4 තුලනාත්මක තොරතුරු

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම පිළිබඳ LKAS 01 අනුකූලව, සමාගම විසින් හැම විටම, මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී ගණකාධිකරණ ප්‍රතිපත්ති අදාළ කර ගනු ලැබ ඇත.

2.5 වැදගත්කම හා සමාහරණය

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම පිළිබඳ LKAS 01 අනුකූලව, මූල්‍ය ප්‍රකාශ තුළදී සෑම වැදගත් සමාන අයිතම කාණ්ඩයක්ම වෙන වෙනම දක්වා ඇත. වැදගත් නම්, ස්වභාවය හෝ කාර්යයන් අනුව එකිනෙකට වෙනස් අයිතමයන් වෙන වෙනම දක්වා ඇත.

හඳුනා ගත් අගයන් හිලව් කිරීමට නීතිමය වශයෙන් බලාත්මක කරන ලද අයිතියක් ඇති සහ ශුද්ධ පදනමින් පියවා දැමීමේ හෝ වත්කම් උපලබ්ධි කොට ඊට සමගාමීව බැරකම පියවා දැමීමේ අපේක්ෂාවක් ඇති අවස්ථාවල පමණක් මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ ශුද්ධ අගය වාර්තා කර ඇත. යම් ගණකාධිකරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපණයක් මගින් නියම කර හෝ අවසර ලබාදී ඇත් නම් මිස, ගණකාධිකරණ ප්‍රතිපත්තිවල නිශ්චිතව අනාවරණය කෙරෙන පරිදි විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය තුළ ආදායම් හා වියදම් හිලව් කර නැත.

3. ගණකාධිකරණ ප්‍රතිපත්ති

සමාගම හැම විටම ගණකාධිකරණ ප්‍රතිපත්ති අදාළ කර ගෙන ඇති අතර ගණකාධිකරණ ප්‍රතිපත්ති පිළිබඳව 3.1 සටහන තුළ ප්‍රකාශිත වෙනස්කම් හැරුණු විට ඒවා පූර්ව වර්ෂයේදී යොදා ගත් ප්‍රතිපත්තිවලට අනුරූප වේ.

තුලනාත්මක තොරතුරු

වඩාත් මැනවින් ඉදිරිපත් කළ යුතු අවස්ථාවල සහ ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සමග සැසඳෙන පරිදි පූර්ව වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය සංශෝධනය කරනු ලැබ ඇත.

3.1 ගණකාධිකරණ ප්‍රතිපත්ති හා අනාවරණය කිරීම් සම්බන්ධයෙන් සිදු වූ වෙනස් වීම්

නව හා සංශෝධිත ප්‍රමිති හා අර්ථ නිරූපණ

හෝටලය ප්‍රථම වතාවට SLFRS 9 සහ 15 අදාළ කර ගත්තේය. මෙම නව ගණකාධිකරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීම නිසා සිදුවූ වෙනස්කම්වල ස්වභාවය හා බලපෑම පහත විස්තර කරනු ලැබේ.

2018 වසරේදී වෙනත් සංශෝධන හා අර්ථ නිරූපණ කිහිපයක් ප්‍රථම වතාවට අදාළ කර ගෙන ඇති නමුත් හෝටලයේ මූල්‍ය ප්‍රකාශවලට ඒවායින් බලපෑමක් සිදුවී නැත.

SLFRS 15 ගනුදෙනුකරුවන් සමග ඇති කර ගන්නා ගිවිසුම්වලින් ලැබෙන ආදායම

SLFRS 15 ඉදි කිරීමේ ගිවිසුම් පිළිබඳ LKAS 11 ආදායම පිළිබඳ LKAS 18 හා ආශ්‍රිත අර්ථ නිරූපණ අවලංගු කරන අතර, වෙනත් ප්‍රමිතිවල විෂය පථයන්ට අයත් වන්නේ නම් මිස ගනුදෙනුකරුවන් සමග ඇති කර ගන්නා ගිවිසුම්වලින් ලැබෙන සියලු ආදායම්වලට එය අදාළ වේ. නව ප්‍රමිතිය ගනුදෙනුකරුවන් සමග ඇති කර ගන්නා ගිවිසුම්වලින් ලැබෙන ආදායම සලකා බැලීම සඳහා

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දොළහ සඳහා

පියවර පහකින් සමන්විත ආකෘතියක් තහවුරු කරයි. SLFRS 15 යටතේ ආදායම හඳුනා ගනු ලබන්නේ ගනුදෙනුකරුවෙකුට භාණ්ඩ හෝ සේවාවන් පැවරීමට හුවමාරු වශයෙන් හිමි විය යුතු යැයි ආයතනයක් විසින් අපේක්ෂා කෙරෙන මුදල පිළිබිඹු කරන අගයක් ලෙසය.

සිය ගනුදෙනුකරුවන් සමග ඇති කර ගන්නා ගිවිසුම්වලට ආකෘතියේ ඒ ඒ පියවරයන් අදාළ කර ගන්නා විට අදාළ සියලු කරුණු හා තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ආයතන විචාර බුද්ධියෙන් යුතුව කටයුතු කළ යුතු යැයි ප්‍රමිතියෙන් නියම කරනු ලැබේ. ගිවිසුමක් ඇති කර ගැනීමේදී දැරීමට සිදු වන වර්ධනය වන පිරිවැය සහ ගිවිසුමක් ක්‍රියාත්මක කිරීමේදී සෘජුවම දැරීමට සිදු වන පිරිවැය සැලකිල්ලට ගත යුතු යැයිද ප්‍රමිතියෙන් නියම කරනු ලැබේ.

හෝටලය, විකරණය කළ ප්‍රත්‍යවලෝකන ප්‍රවිෂ්ටයක් යොදා ගනිමින් 2018 ජනවාරි 1 දින සිට බලපවත්වන පරිදි SLFRS 15 අදාළ කර ගත්තේය. SLFRS 15 අදාළ කර ගැනීම හේතු කොට ගෙන හෝටලයේ ගණකාධිකරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් සිදු කිරීමේ අවශ්‍යතාව මතුවූ අතර ආදායම් ප්‍රකාශය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළදී හඳුනා ගැනෙන සමහර අගයන් හඳුනා ගැනීම, මැනීම හා ඉදිරිපත් කිරීම කෙරෙහි එය බලපෑවේය. හෝටලය SLFRS 15 අදාළ කර ගැනීම හේතු කොට ගෙන 2018 ජනවාරි 1 දින වන විට සංචිතවල සැලකිය යුතු ගැළපීමක් සිදු කර නොතිබිණ.

SLFRS 9 - මූල්‍ය මෙවලම්

මූල්‍ය මෙවලම් පිළිබඳ SLFRS 9 මූල්‍ය මෙවලම් පිළිබඳ LKAS 39 හිලව් කරයි: 2018 ජනවාරි 1 දින සිට හෝ ඉන් පසුව වාර්ෂික කාල පරිච්ඡේද හඳුනා ගැනීම හා මැනීම සිදු කරන විට මූල්‍ය මෙවලම්වල පැතිකඩ තුනම - වර්ගීකරණය හා මැනීම; ඌනකරණය; සහ තුලනය - එක්තැන් කරමින් එය සිදු කළ යුතුය.

හෝටලය, 2018 ජනවාරි 1 දින සිට බලපවත්වන පරිදි ප්‍රත්‍යවලෝකනාත්මක ආකාරයකින් SLFRS 9 අදාළ කර ගෙන ඇත.

ඌනකරණ අවශ්‍යතාද ඇතුළුව වර්ගීකරණය හා මැනීම සම්බන්ධයෙන් ගත් විට තුලනාත්මක තොරතුරු පූර්ව කාල පරිච්ඡේදයන්ට අදාළ වන පරිදි නැවත ප්‍රකාශ කිරීමක් සිදු නොකිරීම සඳහා නිදහස් කිරීමක් පිළිගෙන ඇත. එම නිසා එක් එක් මූලික මූල්‍ය ප්‍රකාශයට අදාළ තුලනාත්මක තොරතුරු LKAS 39 යටතේ අදාළ වන වර්ගීකරණ හා මැනීම් අවශ්‍යතාවන්ට යටත් වනු ඇත. SLFRS 15 අදාළ කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම්වල ධාරණ අගයන්හි සිදු වී ඇති වෙනස්කම් 2018 ජනවාරි 1 දිනට රඳවා ගෙන ඇති ඉපැයීම් හා සංචිතයන් යටතේ හඳුනා ගනු ලැබේ.

SLFRS 9 අදාළ කර ගැනීම හේතු කොට ගෙන, මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හඳුනා ගැනීම, වර්ගීකරණය හා මැනීම සහ මූල්‍ය වත්කම් ඌනකරණය සම්බන්ධයෙන් අදාළ වන ප්‍රතිපත්තිවල වෙනස්කම් සිදු කිරීමේ අවශ්‍යතාව මතුවී ඇත. හෝටලය, SLFRS 9 අදාළ කර ගැනීමේදී, 2018 ජනවාරි 1 දිනට පැවති සංචිතවලට අදාළව සැලකිය යුතු ගැළපීමක් සිදු කර නැත.

3.2 විශේෂිත ගණකාධිකරණ තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී අනාගතය පිළිබඳ ඇතැම් විවක්ෂණ ගණකාධිකරණ උපකල්පන යොදා ගැනීමට සිදුවේ. එපමණක් නොව, වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ ආදායම, වියදම, වත්කම් හා බැරකම් පිළිබඳ වාර්තාගත අගයන් කෙරෙහි සහ අවිනිශ්චිත බැරකම් අනාවරණය කිරීම කෙරෙහි බලපෑම් ඇති වන තීරණ ගැනීමට, ඇස්තමේන්තු කිරීම් සිදු කිරීමට සහ උපකල්පනවලට එළඹීමට එහි දී කළමනාකාරිත්වයට සිදු වේ. කෙසේ වුවද, මෙම උපකල්පන හා ඇස්තමේන්තුවල අවිනිශ්චිත භාවය හේතු කොට ගෙන අනාගත කාල පරිච්ඡේදවලදී මෙම වත්කම් හෝ බැරකම්වල ධාරණ අගයෙහි සැලකිය යුතු ගැළපීම් කිරීමට සිදු විය හැකිය. එම නිසා සැබෑ අත්දැකීම හා ප්‍රතිඵල මෙම තීරණ හා ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

සමාගමේ ගණකාධිකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී කළමනාකාරිත්වය විසින් පහත සඳහන් තීරණ ගැනීම්, ඇස්තමේන්තු කිරීම් සහ උපකල්පනවලට එළඹීම් සිදු කරන ලද අතර මූල්‍ය ප්‍රකාශවල පිළිගත් අගයන් කෙරෙහි වඩාත්ම සැලකිය යුතු බලපෑමක් ඇතිවී තිබෙන්නේ ඒවා මගිනි:

අ) බදුකරණය

සමාගම ආදායම් බදුවලට සහ අගය එකතු කළ බද්ද (වැට්) හා ජාතිය ගොඩ නැගීමේ බද්ද ඇතුළු වෙනත් බදුවලට යටත් වේ. මූල්‍ය ප්‍රකාශවලදී SLFRS ප්‍රමිතිය අදාළ කර ගැනීම පිළිබඳව සලකා බැලීම සඳහා බදු මාර්ගෝපදේශ නිකුත් කෙරෙන තෙක් ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු සඳහා වෙන් කළ යුතු මුළු ප්‍රතිපාදන සහ බදු පැනවීම හේතු කොට ගෙන බදු ගෙවිය යුතු ලාභය නිශ්චය කිරීම සඳහා විශේෂිත තීරණ ගැනීම අවශ්‍ය වේ. මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලද කාල වකවානුවේදී බදු නීතිවල අදාළත්වය පිළිබඳ අර්ථ නිරූපණ සම්බන්ධයෙන් අවිනිශ්චිතතා පවතී.

අතිරේක බදු ගෙවීමට සිදු වේද යන්න සම්බන්ධයෙන් කරනු ලබන ඇස්තමේන්තු පදනම් කර ගෙන සමාගම විසින් ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදුවලට අදාළව වත්කම් හා බැරකම් හඳුනා ගනු ලැබිණ. මුලදී වාර්තාගත අගයන්ගෙන් අවසන් බදු ප්‍රතිඵලය වෙනස් වන අවස්ථාවලදී එම වෙනස තීරණය ගන්නා කාල පරිච්ඡේදයට අදාළ ආදායම්, විලම්බිත හා වෙනත් බදු අගයන් කෙරෙහි බලපෑමක් ඇති කරයි.

ආ) දේපළ, යන්ත්‍රසූත්‍ර හා උපකරණවල ප්‍රයෝජනවත් ජීව කාලය

සමාගම සෑම වාර්තාකරණ දිනයකදීම ශේෂ අගයන්, ප්‍රයෝජනවත් ජීව කාලයන් සහ වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමවේදයන් සමාලෝචනය කරයි. කළමනාකාරිත්වය විසින් තීරණ ගනු ලබන්නේ මෙකී අගයන්, අනුපාතිකයන් හා

ක්‍රමවේදයන් ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලිය තුළදී බැවින් ඒවා අවිනිශ්චිතතාවට බඳුන් වේ.

ඇ) ව්‍යාපාරයේ අඛණ්ඩතාව

සමාගම ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් විසින් තක්සේරුවක් සිදු කරනු ලැබ ඇති අතර පෙරදැකිය හැකි අනාගතයේදී සිය ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය කරන සම්පත් සමාගම සතුව තිබෙන බවට ඔවුහු සෑහීමට පත්ව සිටිති. එපමණක් නොව, ව්‍යාපාරයක් ලෙස සමාගම අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව පිළිබඳව යම් සැකයක් ජනිත කරවන කිසිදු සැලකිය යුතු අවිනිශ්චිතතාවක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය නොදන්නා අතර සමාගමේ කටයුතු ඇවර කිරීමේ හෝ මෙහෙයුම් කටයුතු නතර කිරීමේ අපේක්ෂාවක් ඔවුන්ට නැත. එම නිසා, තව දුරටත් ව්‍යාපාරයේ අඛණ්ඩතාව පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබේ.

ඈ) මූල්‍ය වත්කම් මත ඌනකරණ අලාභ

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කළ යුතු ඌනකරණ අලාභයක් සිදුව ඇත් දැයි නිශ්චය කිරීම සඳහා වාස්තවික සාක්ෂි පවතී දැයි සමාගම ඒ ඒ වාර්තාකරණ දිනයේදී හෝ වඩාත් නිරතුරුව තක්සේරු කර බලයි.

ඉ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

ආයුගණක තක්සේරු යොදා ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය නිශ්චය කරනු ලැබේ. ආයුගණක තක්සේරුවල දී එළඹෙන විවිධ උපකල්පනයන් අනාගතයේදී සැබවින් සිදු වන වර්ධනයන්ට වඩා වෙනස් විය හැකි ය. වට්ටම් අනුපාතිකය, ඉදිරි වැටුප් වැඩි වීම්, මරණ අනුපාතික යනාදිය තීරණය කිරීම මේ උපකල්පන අතරට ඇතුළත් වේ. තක්සේරුවේ සංකීර්ණතාව, පදනම් කර ගන්නා උපකල්පන සහ ඒවායේ දීර්ඝ කාලීන ස්වභාවය නිසා මෙම උපකල්පනවල සිදු වන වෙනස් වීම් හේතු කොට ගෙන නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් බෙහෙවින් වෙනස් වේ. මෙම සියලු උපකල්පන සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලැබේ.

යෝග්‍ය වට්ටම් අනුපාතිකය තීරණය කිරීමේදී කළමනාකාරිත්වය විසින් නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ අපේක්ෂිත කාල පරිච්ඡේදයට අනුරූපී බහිර්නිවේශිත කල් පිරීම් සහිත ශ්‍රී ලංකා රජයේ බැඳුම්කරවල ආයෝජනය කිරීමෙන් උපයා ගත හැකි ආදායම සලකා බලයි. මරණ අනුපාතිකය ගණනය කිරීම සඳහා ප්‍රසිද්ධ කරනු ලැබ ඇති මරණ ප්‍රමාණ වගු පදනම් කර ගනු ලැබේ. ඉදිරි වැටුප් වැඩි වීම් ගණනය කිරීම සඳහා අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාතික සහ සමාගමේ අපේක්ෂිත අනාගත වැටුප් වර්ධන අනුපාතික පදනම් කර ගනු ලැබේ.

4. විශේෂිත ගණකාධිකරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

ස්වකීය මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී සමාගම විසින් අදාළ කර ගනු ලබන විශේෂිත ගණකාධිකරණ ප්‍රතිපත්ති අතරට පහත දැක්වෙන ප්‍රතිපත්ති ඇතුළත් වේ. අන්‍යාකාරයකින් ප්‍රකාශ කර නැත් නම්, මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලු කාල පරිච්ඡේද සඳහා හැම විට ම පහත විස්තර කෙරෙන ගණකාධිකරණ ප්‍රතිපත්ති අදාළ කර ගනු ලැබ ඇත.

4.1 ආදායම් හඳුනා ගැනීම

(i) ගනුදෙනුකරුවන් සමග ඇති කර ගන්නා ගිවිසුම්වලින් ලැබෙන ආදායම

සත්කාරකත්ව සේවාවන් සහ විවේකය ආශ්‍රිත සේවාවන් සම්පාදනය කිරීමේ ව්‍යාපාරයක හෝටලය නිරතව සිටී.

භාණ්ඩ හා සේවා සඳහා හුවමාරු වශයෙන් හිමි විය යුතු යැයි හෝටලය අපේක්ෂා කරන මුදල පිළිබිඹු කරන අගයක් මත භාණ්ඩ හෝ සේවා පාලනය ගනුදෙනුකරුවා වෙත පැවරෙන විට ගනුදෙනුකරුවන් සමග ඇති කර ගන්නා ගිවිසුම්වලින් ලැබෙන ආදායම හඳුනා ගනු ලැබේ.

ගනුදෙනුකරුවා වෙත පැවරීමට පෙරම භාණ්ඩ හෝ සේවාවන්හි පාලනය නිසි පරිදි සිදු වන නිසා සිය ආදායම් විධිවිධානවල මූලධර්මය එය විය යුතු බවට හෝටලය පොදු වශයෙන් නිගමනයකට එළඹ ඇත.

SLFRS 15 අදාළ කර ගැනීමෙන් ඇති වන බලපෑම් කළමනාකාරිත්වය විසින් පහත අනාවරණය කෙරෙන පරිදි තක්සේරු කරනු ලැබ ඇත:

(a) සේවා සම්පාදනය

සේවා සම්පාදනය සම්බන්ධයෙන් යම් කාල පරිච්ඡේදයක කාර්ය සාධන බැඳීම් සැපිරෙන විට සේවා සම්පාදනයෙන් ලැබෙන ආදායම හඳුනා ගනු ලැබේ.

කාමරවල වාසය කිරීම දෛනික පදනමකින් සිදු වන විට කාමර ආදායම හඳුනා ගනු ලබන අතර, ආහාර පාන ආදායම ඒවා අලෙවි කරන මොහොතේදීම (එනම්, කාර්යසාධන බැඳීම සැපිරෙන අවස්ථාවේදීම) ගණනය කරනු ලැබේ.

(ii) පොලිය

සියලු මූල්‍ය මෙවලම් ක්‍රමක්ෂය පිරිවැය සහ අලෙවිය සඳහා පවත්නා බවට වර්ගීකරණය කෙරෙන පොලී සහිත මූල්‍ය වත්කම් අනුව මැනීම සඳහා සඵල පොලී අනුපාතිකය (EIR) යොදා ගනිමින් පොලී ආදායම හෝ වියදම වාර්තාගත කෙරෙන අතර, මූල්‍ය මෙවලමේ අපේක්ෂිත ජීව කාලය හෝ අදාළ අවස්ථාවලදී වඩාත් කෙටි කාල පරිච්ඡේදයක් සඳහා මූල්‍ය වත්කමේ හෝ බැරකමේ ශුද්ධ ධාරණ අගය යොදා ගනිමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් නිශ්චිත වශයෙන් වට්ටම් කරනු ලබන්නේ සඵල පොලී අනුපාතිකය පදනම් කර ගනිමිනි. මූල්‍ය නොවන වත්කම්වල පොලී ආදායම FF&E සංචිතයට ඇතුළත් කරනු ලබයි. අනෙක් සියලු පොලී ආදායම් මූල්‍ය ආදායමට ඇතුළත් කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දොළහ සඳහා

(iii) කඩ කුලී ආදායම

කඩ කුලී ආදායම දෛනික පදනමකින් හඳුනා ගනු ලැබේ.

(iv) පිරිවැටුම පදනම් කර ගත් බදු

පිරිවැටුම පදනම් කර ගත් බදු අතරට අගය එකතු කළ බද්ද, ජාතිය ගොඩ නැගීමේ බද්ද සහ සංචාරක කර්මාන්ත සංවර්ධන බද්ද ඇතුළත් වේ. හෝටලය අදාළ ආයතනික රීති අනුව එවැනි බදු ගෙවයි.

වෙනත් ආදායම්

වෙනත් ආදායම් සමුච්චය වීම පදනම් කර ගනිමින් හඳුනා ගනු ලැබේ.

4.2 වියදම් හඳුනා ගැනීම

දැරූ පිරිවැය හා නිශ්චිත ආදායම් අයිතමවල ඉපැයීම් අතර ඇති සෘජු සම්බන්ධය පදනම් කර ගෙන විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළදී වියදම් හඳුනා ගනු ලැබේ. ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගැනීම සහ දේපළ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා දැරූ සියලු වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හර කර ඇත.

සමාගමේ කාර්ය සාධන මූලිකාංග ප්‍රමාණවත් ලෙස නිරූපණය වන්නේය යන පදනම මත, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා "වියදම් ශ්‍රිතය" පිළිබඳ විධික්‍රමය උපයෝගී කර ගෙන ඇත.

ආදායම් බදු වියදම ප්‍රවර්තන හා විලම්බිත බදුවලින් සමන්විත වේ. ආදායම් බදු වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළදී හඳුනා ගනු ලැබේ.

4.3 බදුකරණය

4.3.1 ප්‍රවර්තන බදු

ප්‍රවර්තන වර්ෂයට අදාළව සහ පූර්ව වර්ෂ සඳහා ගෙවිය යුතු බදුවල කවර හෝ ගැළපීමකට අදාළව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අය කර ගැනීමට හෝ ඔහුට ගෙවීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණවලින්, ප්‍රවර්තන බදු වත්කම් හා වගකීම් සමන්විත වේ. වාර්තා කරන දිනට පනවා ඇති හෝ සාරානුකූලව පනවා ඇති බදු අනුපාතික හා බදු නීති උපයෝගී කර ගෙන මුදල් ප්‍රමාණයන් ගණනය කරනු ලැබේ.

4.3.2 විලම්බිත බදු

වත්කම් හා බැරකම්වල බදු පදනම් සහ ඒවායේ ධාරණ අගයන් අතර වාර්තාකරණ කාල පරාසයේ දිනට පවත්නා තාවකාලික වෙනස්කම් පිළිබඳ බැරකම් විධික්‍රමය යොදා ගනිමින් මූල්‍ය වාර්තාකරණ කාර්යය සඳහා විලම්බිත බදු හඳුනා ගනු ලැබේ.

අඩු කළ හැකි සියලු වෙනස්කම් සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් හඳුනා ගනු ලැබේ. අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්වලින් සහ අභාවිත බදු බැර කිරීම් හා අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාමෙන් ප්‍රයෝජන ගැනීමට හැකි වන පරිදි බදු අය කළ හැකි ලාභ පැවතීමට ඇති සම්භාවිතාවේ ප්‍රමාණයට පමණක් අභාවිත බදු බැර කිරීම් හා අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාම සිදු කරනු ලැබේ.

විලම්බිත බදු වත්කම්වල ධාරණ අගය සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කෙරෙන අතර, සම්පූර්ණ විලම්බිත බදු වත්කම හෝ එහි යම් කොටසක් ප්‍රයෝජනයට ගැනීමට ඉඩ සැලසෙන පරිදි ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභයක් තව දුරටත් පැවතීමේ සම්භාවිතාවක් නොමැති වන ප්‍රමාණයට අඩු කරනු ලැබේ. හඳුනානොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයක දී ම නැවත තක්සේරු කෙරෙන අතර, ඉදිරියේදී බදු අයකළ හැකි ලාභ මගින් විලම්බිත බදු වත්කම නැවතඅය කර ගැනීමට ඉඩ සැලසෙන සම්භාවිතාවේ ප්‍රමාණයට හඳුනා ගනු ලැබේ.

වාර්තාකරණ දිනය වන විට පනවනු ලැබ ඇති හෝ තදනන්තරව පනවනු ලබන බදු අනුපාතික හා බදු නීතිපදනම් කර ගෙන, වත්කම් උපලබ්ධි වන විට හෝ බැරකම් පියවෙන විට වසර තුළදී අදාළ කර ගැනීමට අපේක්ෂිත බදු අනුපාතිකය මත විලම්බිත බදු වත්කම් හා බැරකම් තක්සේරු කරනු ලැබේ.

4.4 මූල්‍ය නොවන වත්කම්

4.4.1 දේපළ, පිරියත හා උපකරණ

a) හඳුනා ගැනීම හා තක්සේරු කිරීම

වත්කම ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සම්භාවිතාවක් ඇත් නම් සහ දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ LKAS 16 ප්‍රමිතිය අනුව වත්කමේ පිරිවැය විශ්වසනීය ආකාරයෙන් තක්සේරු කළ හැකි නම් දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගනු ලැබේ. ආරම්භයේදී දේපළ හා උපකරණ පිරිවැය අනුව තක්සේරු කරනු ලැබේ.

පිරිවැය ආකෘතිය

දේපළ, පිරියත හා උපකරණ ඒවායේ දෛනික සේවාකරණ පිරිවැය බැහැර කර, වටිනාකමේ සමුච්චිත ක්ෂය කිරීම හා සමුච්චිත ඌනකරණය අඩු කොට, පිරිවැය අගය අනුව දක්වා ඇත. එම පිරිවැයට, උපකරණවල කොටස් ප්‍රතිෂ්ඨාපනය කළ විට අදාළ හඳුනා ගැනීමේ නිර්ණායක සපුරා ඇත් නම්, එම පිරිවැයද ඇතුළත් වේ.

තදනන්තර පිරිවැය

ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගෙන යාම හෝ ව්‍යාපාරයේ ඉපැයීම් ශක්තිය වර්ධනය කිරීම පිණිස ස්ථාවර ස්වභාවයේ වත්කම් අත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා තදනන්තරව දරනු ලබන වියදම ප්‍රාග්ධන වියදම ලෙස සැලකෙන අතර එවැනි වියදම් වත්කමක ධාරණ අගය තුළ හඳුනා ගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණවල දෛනික සේවාකරණය ආශ්‍රිත දරන ලද පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ක්ෂය කිරීම

දේපලේ සහ උපකරණයේ පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාල තුළ ඒවායේ ශේෂ වටිනාකම් දක්වා අඩු කිරීම සඳහා සරල රේඛීය ක්‍රමය යොදා ගනිමින් ක්ෂය කිරීම ගණනය කරනු ලැබේ. මිලදී ගත් දින සිට බැහැර කරනු ලබන දින දක්වා ප්‍රමාණානුකූල පදනම මත ක්ෂය කිරීම සිදු කරනු ලැබේ. ක්ෂය කිරීම් ආශ්‍රිත අනුපාතික පහත දැක්වෙන ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාල මත පදනම් වේ:

වත්කම් වර්ගය	%
ගොඩනැගිලි	2.5
පිරියත හා යන්ත්‍රසූත්‍ර	7.5
ශීතකරණ හා මුළුතැන්ගේ උපකරණ	7.5
පරිගණක හා රූපවාහිනී	20
මෝටර් රථ	25
ගෘහභාණ්ඩ, සවි කිරීම් හා උපකරණ	10
මෙහෙයුම් උපකරණ	33

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම වත්කමේ ශේෂ අගය, ප්‍රයෝජනවත් ජීව කාලය සහ ක්ෂය කිරීමේ විධික්‍රමය සමාලෝචනය කර අදාළ පරිදි ගැළපීම් සිදු කරනු ලැබේ.

හඳුනා ගැනීම ඉවත් කිරීම

දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීමෙන් පසුව හෝ භාවිත කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකෙරෙන විට ඒවා හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ. වත්කම හඳුනා ගැනීම ඉවත් කිරීම මගින් ඇති වන කිසි යම් ම හෝ ලාභය හෝ අලාභය (ශුද්ධ බැහැර කිරීමෙන් ලැබෙන මුදල් සහ වත්කමේ ධාරණ අගය අතර පවත්නා වෙනස ලෙස ගණනය කරනු ලැබේ) වත්කම හඳුනා ගැනීම ඉවත් කරනු ලබන වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" යටතේ හඳුනා ගනු ලැබේ.

4.4.2 මූල්‍ය නොවන වත්කම් ඌනකරණය

සමාගම විසින්, සෑම වාර්තාකරණ දිනයකදීම, යම් වත්කමක් ඌනකරණය විය හැකි යම් සංඥාවක් වේ දැයි තක්සේරු කරනු ලැබේ. යම් සංඥාවක් වෙතොත් හෝ යම් වත්කමක් සම්බන්ධයෙන් වාර්ෂික ඌනකරණ පරීක්ෂාව සිදු කළ යුතු වේ නම් සමාගම විසින් වත්කමේ ආපසු ලබා ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ.

4.5 පෙර ගෙවුම් බදු වාරිකය

අදාළ බදු කාල පරිච්ඡේදය වන 99 අවුරුද්ද පුරා බදු ඉඩම සම වාර්ෂික පදනම්න් ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය කිරීම 2012 ජූනි මාසයේ සිට ආරම්භ කෙරිණ.

4.6 ඉන්වෙන්ටරි

යල් පිනූ හා මන්දගාමීව වැය වන අයිතමයන් නිසි ලෙස සලකා බැලීමෙන් පසුව පහළ යන පිරිවැය මත සහ විකිණීමෙන් ලබා ගත හැකි ඇස්තමේන්තුගත ශුද්ධ අගය මත ඉන්වෙන්ටරි අයිතම තක්සේරු කරනු ලැබේ. විකිණීමෙන් ලබා ගත හැකි ශුද්ධ අගය යනු ඉන්වෙන්ටරි අයිතමවල විකුණුම් පිරිවැය සහ/හෝ ඒවා ඒවායේ වත්මන් තත්ත්වයෙන් විකිණිය හැකි තත්ත්වයට පරිවර්තනය කිරීමේ පිරිවැය සලකා බැලීමෙන් පසුව සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු ඔස්සේ එම භාණ්ඩ විකිණිය හැකි මිල වේ.

ඉන්වෙන්ටරියේ එක් එක් අයිතම කාණ්ඩයේ පිරිවැය හරිත සාමාන්‍ය පදනම මත නිශ්චය කරනු ලැබේ.

4.7 මූල්‍ය වත්කම් - හඳුනා ගැනීම හා තක්සේරුව

මූල්‍ය සාධන පත්‍රයක් යනු එක් ආයතනයකට මූල්‍ය වත්කමක් සහ තවත් ආයතනයකට මූල්‍ය බැරකමක් හෝ කොටස් වටිනාකම් සාධන පත්‍රයක් හිමි වන කවර හෝ ගිවිසුමකි.

මූල්‍ය වත්කම්

(a) මූලික හඳුනා ගැනීම හා තක්සේරුව

මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කම් වර්ගීකරණය කොට, තදනන්තරව ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීර්ණ ආදායම් (OCI) යටතේ සාධාරණ අගය සහ ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත තක්සේරු කරනු ලැබේ.

මූලික හඳුනා ගැනීම මත මූල්‍ය වත්කම් වර්ගීකරණය කිරීම මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ ලක්ෂණ සහ හෝටලය එම ලක්ෂණ හැසිරවීම සඳහා යොදා ගන්නා ව්‍යාපාරික ආකෘතිය මත රඳා පවතී. හෝටලය ප්‍රාග්‍රහික පියවරක් ගෙන නැති වැදගත් මූල්‍ය සංරචකයක් අඩංගු නොවන අය විය යුතු වෙළඳ වත්කම් සම්බන්ධයෙන් හැර හෝටලය මූලික වශයෙන් මූල්‍ය වත්කමක් තක්සේරු කරන්නේ එහි සාධාරණ අගය මතය, ලාභය හා අලාභය අනුව සාධාරණ අගයක් සහිත මූල්‍ය වත්කමක් නොවේ නම්, එහි ගනුදෙනු පිරිවැය මතය. හෝටලය ප්‍රාග්‍රහික පියවරක් ගෙන නැති වැදගත් මූල්‍ය සංරචකයක් අඩංගු නොවන අය විය යුතු වෙළඳ වත්කම් තක්සේරු කරනු ලබන්නේ SLFRS 15 යටතේ නිශ්චිය කෙරෙන ගනුදෙනු මිල මතය.

ක්‍රමක්ෂය පිරිවැය මත හෝ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කමක් වර්ගීකරණය හෝ තක්සේරු කිරීමට නම්, එම වත්කම මගින්, මුල් මුදල නොගෙවන ලද නිසා 'තනිකරම මුල් මුදල හා පොලිය පමණක් ගෙවන (SPPI) මූල්‍ය ප්‍රවාහයන් හට ගත යුතු වේ.

මූල්‍ය වත්කම් හැසිරවීම සඳහා හෝටලය විසින් යොදා ගනු ලබන ව්‍යාපාරික ආකෘතිය මූල්‍ය ප්‍රවාහයන් ජනනය කර ගැනීම සඳහා එය මූල්‍ය වත්කම් කළමනාකරණය කරන ආකාරය

පෙන්නුම් කරයි. මූල්‍ය ප්‍රවාහයන් හට ගන්නේ ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහයන් රැස් කර ගැනීමෙන්, මූල්‍ය වත්කම් අලෙවි කිරීමෙන් හෝ ඒ දෙයාකාරයෙන්මද යන්න ව්‍යාපාරික ආකෘතිය විසින් තීරණය කරනු ලැබේ.

වෙළඳපොළ රෙගුලාසියකින් හෝ සම්මුතියකින් ස්ථාපිත කාල රාමුවක් තුළ මූල්‍ය වත්කම් සම්පාදනය කළ යුතු මූල්‍ය වත්කම් මිලදී ගැනීම් හෝ අලෙවි කිරීම් වෙළඳ දිනය - හෝටලය විසින් වත්කම මිලදී ගන්නා ලද හෝ අලෙවි කරන ලද දිනය - මත හඳුනා ගනු ලැබේ.

(b) තදනන්තර තක්සේරුව

තදනන්තර තක්සේරුව සඳහා මූල්‍ය වත්කම් කාණ්ඩ හතරකට වර්ගීකරණය කරනු ලැබේ:

i. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් (ණය සාධන පත්‍ර)

ii. සමුච්චය වන ලාභ හා අලාභ ප්‍රතිවක්‍රීකරණය වන වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් (ණය සාධන පත්‍ර)

iii. හඳුනා ගැනීම ඉවත් කිරීම නිසා සමුච්චය වන ලාභ හා අලාභ ප්‍රතිවක්‍රීකරණය නොවන වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගය මත නිමිත කරන ලද මූල්‍ය වත්කම් (කොටස් වටිනාකම් සාධන පත්‍ර)

iv. ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් (ණය සාධන පත්‍ර)

හෝටලයට වඩාත් ම වැදගත් වන කාණ්ඩය මෙය වේ. පහත දැක්වෙන කොන්දේසි දෙකම සැපිරෙන්නේ නම් හෝටලය ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් තක්සේරු කරනු ඇත:

- මූල්‍ය වත්කම පවතින්නේ ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහයන් රැස් කර ගැනීම පිණිස මූල්‍ය වත්කම් අත් කර ගැනීමේ අරමුණ සහිත ව්‍යාපාරික ආකෘතියක් තුළය.

- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින්, මුල් මුදල නොගෙවීම හේතුවෙන් නියමිත දිනයන්හිදී තනිකරම මුල් මුදල හා පොලිය පමණක් ගෙවන මූල්‍ය ප්‍රවාහයන් හට ගනී.

ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගනු ලබන මූල්‍ය වත්කම් තදනන්තරව සඵල පොලී අනුපාතික (EIR) විධික්‍රමය යොදා ගනිමින් තක්සේරු කෙරෙන අතර ඌනකරණයට යටත් වේ. වත්කම හඳුනා ගැනීම ඉවත් කෙරෙන, සංශෝධනය කෙරෙන හෝ ඌනකරණය කෙරෙන විට ලාභය හෝ අලාභය අනුව ලාභය හා අලාභ හඳුනා ගනු ලැබේ.

හෝටලය සතු ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගනු ලබන මූල්‍ය වත්කම් අතරට මුදල් හා බැංකු ශේෂ, කෙටි කාලීන ආයෝජන, අදාළ පාර්ශ්වයන්ගෙන් අය විය යුතු මුදල්, අය විය යුතු වෙළඳ වත්කම් සහ ජංගම නොවන ආයෝජන ඇතුළත් වේ.

හෝටලය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගය මත (ණය සාධන පත්‍ර) සහ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගය මත (කොටස් වටිනාකම් සාධන පත්‍ර) සහ ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් වර්ගීකරණය නොකරයි.

(c) හඳුනා ගැනීම ඉවත් කිරීම

ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන අවස්ථාවල දී මූල්‍ය වත්කමක (හෝ අදාළ පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ:

- වත්කමෙන් මූල්‍ය ප්‍රවාහයන් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම් කල් ඉකුත්වී ඇත, හෝ

- හෝටලය විසින් වත්කමෙන් මූල්‍ය ප්‍රවාහ ලබා ගැනීමට ඇති සිය අයිතිවාසිකම් පවරා දෙනු ලැබ හෝ ලැබෙන මූල්‍ය ප්‍රවාහයන් 'ගිවිසුමෙන් ඔබ්බට යැවීමේ' විධිවිධානයක් යටතේ කිසිදු සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් ම තුන් වන පාර්ශ්වයක් වෙත ගෙවීමේ වගකීමක් භාර ගනු ලැබ ඇත, නැතහොත්

(a) හෝටලය විසින් වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභවලින් සැලකිය යුතු ප්‍රමාණයක් පවරනු ලැබ ඇත, හෝ

(b) හෝටලය විසින් වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභවලින් සැලකිය යුතු ප්‍රමාණයක් පවරා දෙනු ලැබ හෝ රඳවා ගනු ලැබ නැති නමුත් වත්කමේ පාලනය පවරනු ලැබ ඇත.

හෝටලය වත්කමකින් මූල්‍ය ප්‍රවාහයන් ලබා ගැනීමට ඇති සිය අයිතිවාසිකම් පවරාදී හෝ ගිවිසුමෙන් ඔබ්බටයන විධිවිධානයකට ඇතුළත්ව ඇති විට, එය හිමිකාරත්වයේ අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගෙන ඇත්ද ඒ කොතෙක් දුරටද යන්න හෝටලය විසින් තක්සේරු කරනු ලැබේ. එය වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයකින් පවරා දී හෝ රඳවා ගෙන හෝ වත්කමේ පාලනය පවරාදී හෝ නොමැතිනම්, පවරනු ලැබූ එම වත්කමට හෝටලයේ සම්බන්ධය අඛණ්ඩව පවතින ප්‍රමාණයට පමණක් හෝටලය විසින් එම වත්කම හඳුනා ගනු ලැබේ. එවැනි අවස්ථාවක, හෝටලය විසින් ආශ්‍රිත බැරකමක්ද හඳුනා ගනුලැබේ. පවරනු ලැබූ වත්කම සහ ආශ්‍රිත බැරකම තක්සේරු කිරීම සඳහා සමාගම විසින් රඳවා ගනු ලැබ ඇති අයිතිවාසිකම් හා බැඳීම් පිළිබිඹු වන පදනමක් මත යොදා ගනු ලැබේ.

හෝටලයේ අඛණ්ඩ සම්බන්ධය පවරනු ලද වත්කම සම්බන්ධයෙන් ඇප වීමක ස්වරූපය ගන්නා අතර වත්කමේ මුල් ධාරණ අගයේ අවමය සහ ආපසු ගෙවීමට හෝටලයට සිදු වියහැකි ප්‍රතිෂ්ඨාවේ උපරිම අගය මත තක්සේරු කරනු ලැබේ.

(c) ඌනකරණය

ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත පවත්වා ගෙන නොයන සියලු ණය සාධන පත්‍ර සම්බන්ධයෙන් අපේක්ෂිත ණය අලාභ (ECLs) සලකා බැලිය යුතු බව හෝටලය විසින් හඳුනා ගනු ලැබේ. මුල් සළුල පොලී අනුපාතිකයේ ආසන්න අගයකට වට්ටම් කරන ලද, ගිවිසුම අනුව ලැබිය යුතු ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහයන් සහ ලැබෙනු ඇති බවට හෝටලය අපේක්ෂා කරන සියලු මූල්‍ය ප්‍රවාහයන් අතර පවත්නා වෙනස පදනම් කර ගෙන, අපේක්ෂිත ණය අලාභ ගණනය කරනු ලැබේ. රඳවා ගන්නා ලද ඇපකර අලෙවි කිරීමෙන් ලැබෙන මූල්‍ය ප්‍රවාහයන් හෝ ගිවිසුම්ගත කොන්දේසිවල කොටසක් වන වෙනත් ණය ඉවැඩි කිරීම් අපේක්ෂිත මූල්‍ය ප්‍රවාහයන් අතරට ඇතුළත් වනු ඇත.

අය විය යුතු වෙළඳ වත්කම් සම්බන්ධයෙන් අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී හෝටලය විසින් සරල කළ ප්‍රවිෂ්ටයක් යොදා ගනු ලැබේ. එම නිසා හෝටලය විසින් ණය අවදානමෙහි ඇති වන වෙනස්කම් පිළිබඳව සොයා බැලීමක් නොකෙරෙන නමුත් ඒ ඒ වාර්තාකරණ දිනට අපේක්ෂිත දීර්ඝ කාලීන ණය අලාභ පදනම් කර ගෙන අලාභ සලකා බැලීමක් කළ යුතු බව හඳුනා ගනු ලැබේ. හෝටලය ණය අහිමි වීම පිළිබඳ සිය අතීත අත්දැකීම් පදනම් කර ගෙන, ණය හිමියන්ට හා ආර්ථික වාතාරණයට විශේෂිත අනාගත සාධකවලට ගළපන ලද ප්‍රතිපාදන ආකෘතියක් හඳුනා ගෙන ඇත.

මූල්‍ය බැරකම්

(a) මූලික හඳුනා ගැනීම හා තක්සේරුව

අදාළ පරිදි ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය බැරකම්, ණය දීම් හෝ ණය ගැනීම් සහ ගෙවිය යුතු මුදල් ලෙස හෝ ක්‍රියාත්මක ඉදිරි රැකුමකට අයත් ඉදිරි රැකුම් සාධන පත්‍ර වශයෙන් නිමිති කරන ලද ව්‍යුත්පන්න ලෙස මූලික හඳුනා ගැනීමේ දී මූල්‍ය බැරකම් වර්ගීකරණය කරනු ලැබේ.

සියලු මූල්‍ය බැරකම් මූලික වශයෙන් සාධාරණ අගය මත හඳුනා ගැනෙන අතර, ණය දීම් හා ණය ගැනීම් සහ ගෙවිය යුතු මුදල් ආශ්‍රිත මූල්‍ය බැරකම් සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයවල් බැහැර කර හඳුනා ගනු ලැබේ.

හෝටලයේ මූල්‍ය බැරකම් අතරට, ගෙවිය යුතු වෙළඳ හා වෙනත් මුදල් සහ බැංකු අයිරා ඇතුළු අදාළ පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල් ඇතුළත් වේ.

හෝටලය සතුව ලාභය හා අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය බැරකම් සහ ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර නොමැත.

(b) තදනන්තර තක්සේරුව

මූල්‍ය බැරකම් තක්සේරුව පහත විස්තර කෙරෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී:

ණය දීම් හා ණය ගැනීම්

හෝටලයට වඩාත් ම අදාළ වන කාණ්ඩය මෙය වේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව, පොලී සහිත ණය දීම් හා ණය ගැනීම් තදනන්තරව සළුල පොලී අනුපාතික විධික්‍රමය යොදා ගනිමින් තක්සේරු කරනු ලැබේ. බැරකම් හඳුනා ගැනීම ඉවත් කෙරෙන විට සහ සළුල පොලී අනුපාතික ක්‍රමක්ෂය ක්‍රියාවලිය යටතේ, ලාභය හා අලාභය මත ලාභ හා අලාභ හඳුනා ගනු ලැබේ.

අත් කර ගැනීම මත යම් වට්ටමක් හෝ අධිමිලක් වේ නම් සහ සළුල පොලී අනුපාතිකයේ ඒකාබද්ධ අංගයක් ලෙස ගාස්තු හෝ පිරිවැය වේ නම් සලකා බලමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. සළුල පොලී අනුපාතික ක්‍රමක්ෂය, ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ මූල්‍ය පිරිවැයවල් ලෙස ඇතුළත් කරනු ලැබේ. මෙම කාණ්ඩය සාමාන්‍යයෙන් පොලී සහිත ණය දීම් හා ණය ගැනීම්වලට අදාළ වේ.

(c) හඳුනා ගැනීම ඉවත් කිරීම

බැරකමක් යටතේ ඇති වන බැඳීම පියවා දැමෙන හෝ අවලංගු කෙරෙන හෝ කල් ඉකුත් වන විට එම මූල්‍ය බැරකම හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ. සැලකිය යුතු ලෙස වෙනස් වූ කොන්දේසි මත එක ම ණයහිමියාගෙන්ම ලබා ගන්නා වෙනත් මූල්‍ය බැරකමකින් දැනට පවත්නා මූල්‍ය බැරකමක් ප්‍රතිෂ්ඨාපනය කෙරෙන විට හෝ පවත්නා මූල්‍ය බැරකමක කොන්දේසි සැලකිය යුතු ලෙස සංශෝධනය කෙරෙන විට, එම හුවමාරුව හෝ සංශෝධනය මුල් බැරකම හඳුනා ගැනීම ඉවත් කිරීම සහ නව බැරකමක් හඳුනා ගැනීම ලෙස සලකනු ලැබේ. අදාළ ධාරණ අගයන්හි වෙනස්කම් ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළදී හඳුනා ගනු ලැබේ.

මූල්‍ය සාධන පත්‍ර හිලව් කිරීම

වත්කම් උපලබ්ධි කිරීම හා බැරකම් පියවීම එක විටම සිදු කිරීම සඳහා, හඳුනා ගත් අගයන් හිලව් කිරීම පිණිස වර්තමානයේ බලාත්මක කළ හැකි නීතිමය අයිතියක් ඇත් නම් සහ ශුද්ධ පදනමක් මත පියවීමේ අභිප්‍රායක් ඇත් නම්, මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කෙරෙන අතර ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය තුළ වාර්තා කරනු ලැබේ.

4.8 මුදල් හා බැංකු ශේෂ

මුදල් හා බැංකු ශේෂ, අතේ ඇති මුදල් හා බැංකුවේ ඇති ශේෂ වශයෙන් අර්ථ නිරූපණය කරනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා, අතේ ඇති මුදල්වලින් සහ හිඟ බැංකු අයිරා බැහැර කළ විට බැංකුවේ ඇති තැන්පතුවලින් මුදල් හා මුදල් හා සමාන වත්කම් සමන්විත වේ. අත්පත් කර ගත් දින සිට මාස තුනකින් හෝ ඊට අඩු කාලයකින් කල් පිරෙන කෙටි කාලීන ආයෝජනද මුදල් හා සමාන වත්කම් ලෙස සැලකේ.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දොළහ සඳහා

4.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් ස්කන්ධ වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. ස්කන්ධ සාධන පත්‍ර නිකුත් කිරීමේ සෘජු පිරිවැයවල් බැහැර කර, ලද හෝ ලැබිය යුතු වත්කම් හෝ වෙනත් සම්පත්වල සාධාරණ අගය මත කොටස් සාධන පත්‍ර තක්සේරු කරනු ලැබේ.

4.10 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

4.10.1 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේදී හඳුනා ගනු ලබන බැරකම මගින්, ප්‍රක්ෂේපිත ඒකක ණය විධික්‍රමය යොදා ගනිමින් ආයුගණක අගය පදනම් කර ගෙන තක්සේරු කරනු ලබන, වාර්තාකරණ දිනට පවතින නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය නියෝජනය වේ. ආයුගණක තක්සේරුවලදී වට්ටම් අනුපාතික හා අනාගත වැටුප් වර්ධක පිළිබඳව උපකල්පන කිරීමට සිදු වේ. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම මෙම උපකල්පනවල සිදු වන වෙනස් වීම් කෙරෙහි අතිශයින් සංවේදී වේ. මෙම ප්‍රතිලාභ සඳහා බැහැරින් මූල්‍ය සම්පාදනය නොකෙරේ.

සමාගම විසින් නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මෙන් පැන නගින ආයුගණක ලාභ හා අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේදී වහාම හඳුනා ගනු ලැබේ.

කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත අනුව පාරිතෝෂික ගෙවීමේ බැරකම පැන නගින්නේ වසර 5ක අඛණ්ඩ සේවයක් සපුරා ඇත් නම් පමණි.

4.10.2 නිශ්චිත දායකත්ව සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම යනු යම් ආයතනයක් විසින් තවත් ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවනු ලබන සහ තව දුරටත් ප්‍රතිලාභ ගෙවීමට නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් ඇති නොවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලැසුම්වලට දායකත්වය ලබා දීමට ඇති බැඳීම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේදී, සේවකයන් විසින් සේවාවන් සම්පාදනය කෙරෙන කාල පරිච්ඡේදයන්ට අදාළ සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

a) සේවක අර්ථ සාධක අරමුදල

පිළිගත් අර්ථසාධක අරමුදලට එක් එක් සේවකයාගේ වැටුපෙන් පිළිවෙළින් 12%ක් හා 8%ක් සමාගම හා සේවකයන් විසින් දායක කරනු ලැබේ.

b) සේවක භාරකාර අරමුදල

සේවක භාරකාර අරමුදල සඳහා සමාගම විසින් එක් එක් සේවකයාගේ වැටුපෙන් 3%ක් දායක කරනු ලැබේ.

4.11 මූල්‍ය බැරකම්

4.11.1 මූලික හඳුනා ගැනීම හා තක්සේරුව

ගිවිසුම්ගත විධිවිධානයේ හරය අනුව සහ මූල්‍ය බැරකම් පිළිබඳ අර්ථ නිරූපණ අනුව සමාගම විසින් ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය (FVTPL) මත මූල්‍ය බැරකම් හෝ වෙනත් මූල්‍ය බැරකම් යටතට මූල්‍ය බැරකම් වර්ගීකරණය කරනු ලැබේ.

සමාගම මූල්‍ය බැරකමේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වකරුවෙකු බවට පත් වන විට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේදී සමාගම විසින් මූල්‍ය බැරකම් හඳුනා ගනු ලැබේ.

a) FVTPL මත මූල්‍ය බැරකම

ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය බැරකම් අතරට, වෙළඳාම සඳහා රඳවා ගෙන ඇති හෝ මූලික හඳුනා ගැනීම මත එසේ නම් කරන ලද මූල්‍ය බැරකම් ඇතුළත් වේ. මූලික හඳුනා ගැනීමෙන් තදනන්තරව ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය බැරකම් සාධාරණ අගය සහ ලාභ හෝ අලාභ තුළ හඳුනා ගත් වෙනස් වීම් අනුව තක්සේරු කරනු ලැබේ.

මූලික හඳුනා ගැනීම මත, වත්කම අත්පත් කරගැනීමට සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය, දරන ලද පිරිවැයක් ලෙස ලාභය හෝ අලාභය තුළදී හඳුනා ගනු ලැබේ. මූලික හඳුනා ගැනීම මත, ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය බැරකම් නම් කිරීම සඳහා යොදාගනු ලබන නිර්ණායක, ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් සඳහායොදා ගනු ලබන නිර්ණායකවලට සමාන වේ.

b) වෙනත් මූල්‍ය බැරකම්

වෙනත් මූල්‍ය බැරකම්වලට තැන්පතු, සමාගම විසින් නිකුත් කරන ලද ණය සහ වෙනත් ණයට ගත් අරමුදල් ඇතුළත් වන අතර, අත්පත් කර ගැනීම සඳහා සෘජුව දරන ලද පිරිවැය අඩු කොට සාධාරණ අගය මත මූලික වශයෙන් තක්සේරු කොට තදනන්තරව සළුල පොලී අනුපාතික විධික්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය මත තක්සේරු කරනු ලැබේ. නිකුතුව යටතේ යම් වට්ටමක් හෝ අධිමිලක් වේ නම් සහ සළුල පොලී අනුපාතිකයේ ඒකාබද්ධ අංගයක් ලෙස පිරිවැයවල් වේ නම් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ.

4.11.2 මූල්‍ය බැරකම් හඳුනා ගැනීම ඉවත් කිරීම

බැරකමක් යටතේ ඇති වන බැඳීම පියවා දැමෙන හෝ අවලංගු කෙරෙන හෝ කල් ඉකුත් වන විට එම මූල්‍ය බැරකම හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ. සැලකිය යුතු ලෙස වෙනස්වූ කොන්දේසි මත එකම ණයහිමියාගෙන්ම ලබා ගන්නා වෙනත් මූල්‍ය බැරකමකින් දැනට පවත්නා මූල්‍ය බැරකමක් ප්‍රතිෂ්ඨාපනය කෙරෙන විට හෝ පවත්නා මූල්‍ය බැරකමක කොන්දේසි සැලකිය

යුතු ලෙස සංශෝධනය කෙරෙන විට, එම හුවමාරුව හෝ සංශෝධනය මුල් බැරකම හඳුනා ගැනීම ඉවත් කිරීම සහ නව බැරකමක් හඳුනා ගැනීම ලෙස සලකනු ලැබේ. අදාළ ධාරණ අගයන්හි වෙනස්කම් ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළදී හඳුනා ගනු ලැබේ.

4.12 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස උද්ගතවූ වර්තමාන (නෛතික හෝ සම්ප්‍රයුක්ත) බැඳීමක් සමාගම සතු වේ නම්, සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වේ නම් සහ බැඳීමේ අගය පිළිබඳව විශ්වසනීය තක්සේරුවක් කිරීමට හැකි වේ නම්, එවිට ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. ප්‍රතිපාදනවලට අදාළ වියදම්, කවර හෝ ප්‍රතිපූරණයක් වේ නම් බැහැර කොට, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ දක්වනු ලැබේ.

4.13 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ LKAS 7 ප්‍රමිතිය තුළ දක්වා ඇති පරිදි අනියම් විධික්‍රමය යොදා ගනිමින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ සකස් කර ඇත. මුදල් හා මුදල් හා සමාන වත්කම්වලට අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් හා බැංකු අයිරා අයත් වේ.

4.14 ආංශික තොරතුරු

අංශයක් යනු සේවා සම්පාදනයේ නිරත සහ සෙසු අංශවලට වෙනස් අවදානම් හා ප්‍රතිලාභවලට යටත් වන වෙන්කර හඳුනා ගත හැකි සංරචකයකි. සමාගමේ සියලු මෙහෙයුම් එකම අංශයක් ලෙස සලකනු ලබන බැවින් අංශයක් වශයෙන් හඳුනා ගත හැකි සංරචක සමාගම සතු නොවේ.

4.14.1 ප්‍රසිද්ධ කරන ලද නමුත් මෙතෙක් බලාත්මක නොවූ ප්‍රමිති

ප්‍රසිද්ධ කරන ලද නමුත් හෝටලයේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කෙරෙන දිනය දක්වා බලාත්මක කර නොමැති ප්‍රමිති හා අර්ථ නිරූපණ පහත දක්වා ඇත. එම ප්‍රමිති බලාත්මකවූ විට අදාළ පරිදි යොදා ගැනීමට හෝටලය අපේක්ෂා කරයි.

බදුකර පිළිබඳ SLFRS 16 ප්‍රමිතිය

SLFRS 16 ප්‍රමිතිය කේවල බදු ගැනුම්කරු ගිණුම්කරණ ආකෘතියක් ඉදිරිපත් කරන අතර, බදු දීමනාකරුගේ ගිණුම්කරණ කටයුතු දැනට සිදු වන ආකාරයටම වෙනසක් නැතිව ඉදිරියටත් පවත්වා ගෙන ගියද, බදු කාලය මාස 12ක් හෝ ඊට අඩු නොවේ නම් හෝ අදාළ වත්කමේ අගය ඉතා අඩු නම් මිස, බදුකරවලදී සියලුම බදුකර සඳහා වත්කම් හා බැරකම් හඳුනාගත යුතුයැයි නියම කරයි. බදුකර පිළිබඳ LKAS 17 ප්‍රමිතිය, යම් විධිවිධානයක බදුකරයක් අන්තර්ගත වේ දැයි තීරණය කරන IFRIC 4 ප්‍රමිතිය, මෙහෙයුම් බදුකර දිරි ගැන්වීම් පිළිබඳ SIC 15 ප්‍රමිතිය සහ බදුකරයේ නෛතික ස්වරූපය අදාළ වන ගනුදෙනුවල හරය ඇගයීම පිළිබඳ SIC 27 ප්‍රමිතිය මෙමගින් අවලංගු වේ.

2019 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේද සම්බන්ධයෙන් SLFRS 16 ප්‍රමිතිය බලපැවැත්වේ.

2019 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි SLFRS16 ප්‍රමිතිය යොදා ගන්නා විට ඉඩම බදු දීමට හිල්ටන් කළමිබු හෝටලයේ WIP අවන්හලට තිබෙන අයිතිවාසිකම් බලපෑමට ලක් වනු ඇත. හෝටලය SLFRS16 යොදා ගැනීමෙන් ඇති විය හැකි බලපෑම පිළිබඳව අවසන් තීරණයක් ගැනීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටී.

පහත දැක්වෙන සංශෝධන හා වැඩි දියුණු කිරීම් සමාග මේ මූල්‍ය ප්‍රකාශවලට සැලකිය යුතු බලපෑමක් කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ:

- SLFRS 10 සහ LKAS 28 සඳහා සංශෝධන: ආයෝජකයෙකු සහ එහි හවුල්කරු ව්‍යාපාරයක් හෝ බද්ධ ව්‍යාපාරයක් අතර වත්කම් අලෙවිය හෝ දායකත්වය.
- LKAS 7 අනාවරණ මුල පිරීම - LKAS 7 සඳහා සංශෝධන.
- LKAS 12 උපලබ්ධි නොවූ අලාභ සඳහා විලම්බිත බදු වත්කම් හඳුනා ගැනීම - LKAS 12 සඳහා සංශෝධන.
- SLFRS 2 කොටස් පාදක ගෙවුම් ගනුදෙනු වර්ගීකරණය සහ තක්සේරු කිරීම - SLFRS 2 සඳහා සංශෝධන.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දොළහ සඳහා

	31.12.2018 රු. '000	31.12.2017 රු. '000
5. ගනුදෙනුකරුවන් සමග ඇති කර ගත් ගිවිසුම්වලින් ලද ආදායම		
5.1 ගනුදෙනුකරුවන් සමග ඇති කර ගත් ගිවිසුම්වලින් ලද දළ	2,940,886	3,046,805
අඩු කළා: සංචාරක කර්මාන්ත සංවර්ධන බද්ද	(30,346)	(31,443)
ගනුදෙනුකරුවන් සමග ඇති කර ගත් ගිවිසුම්වලින් ලද ශුද්ධ	2,910,540	3,015,362

ආදායම ගණනය කරන විට රු. මිලියන 483ක් (2017 - රු. මිලියන 499) වූ අගය එකතු කළ බද්ද අඩු කර ඇත.

5.2 ආදායම		
කාමර ආදායම	1,219,736	1,317,248
ආහාර පාන ආදායම	1,631,492	1,635,026
අනෙක් මෙහෙයුම් දෙපාර්තමේන්තු	59,312	63,088
	2,910,540	3,015,362
6. ආයෝජන ආදායම		
පොලී ආදායම - ණය හා ලැබිය යුතු		
භාණ්ඩාගාර බිල්පත් මත පොලිය	-	8,738
කාර්ය මණ්ඩල ණය මත පොලිය	5	5
නේවාසික විදේශීය ව්‍යවහාර මුදල් ගිණුම් මත පොලිය	1,009	999
ස්ථාවර තැන්පතු මත පොලිය	-	14,089
FF&E ප්‍රතිෂ්ඨාපන සංචිතය මත පොලී ආදායම	615	1,702
ඇමතුම් තැන්පතු මත පොලිය	13,998	-
	15,627	25,533
7. වෙනත් ලාභ හා අලාභ		
පිරියත හා උපකරණ බැහැර කිරීම මත ලාභය	6,070	6,620
කඩ කුලී	9,600	10,200
උපලබ්ධි නොවූ විනිමය ලාභ	17,391	884
උපලබ්ධි වූ විනිමය ලාභ	13,273	636
වෙනත් ආදායම්	-	50
විවිධ ආදායම්	8,021	11,039
	54,355	29,429
8. මූල්‍ය පිරිවැය		
බැංකු ගාස්තු	67	81
අයිරා පොලිය	40,927	9,824
	40,994	9,905

	31.12.2018 රු. '000	31.12.2017 රු. '000
9. අදාළ කාල පරිච්ඡේදය සඳහා ලාභය		
පහත දැක්වෙන වියදම්ද ඇතුළු සියලු වියදම් පියවීමෙන් පසුව අදාළ කාල පරිච්ඡේදය සඳහා ලාභය:		
අධ්‍යක්ෂවරුන්ගේ වැටුප්	4,405	6,053
විගණකවරුන්ගේ වේතන - සමාගම	600	916
- හිල්ටන් කලම්බු	1,709	1,553
ක්ෂය කිරීම්	500,861	461,542
කාර්ය මණ්ඩල පිරිවැය (පහත දැක්වෙන සේවක	505,935	448,163
- නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික	21,106	22,577
- නිශ්චිත දායකත්ව සැලසුම් පිරිවැය - EPF & ETF	65,773	60,735
කළමනාකරණ ගාස්තු	2,440	29,625
සමූහ සේවා සහ ප්‍රතිලාභ භාරය - හිල්ටන්	59,191	61,164
නෛතික ගාස්තු	125	140
10. ආදායම් බදු වියදම්		
අදාළ කාල පරිච්ඡේදය සඳහා ප්‍රතිපාදන	-	11,691
පූර්ව වර්ෂයේ ඌන ප්‍රතිපාදන	-	5,913
විලම්බිත බදු (ආදායම) වියදම	(1,046)	(102,645)
	(1,046)	(85,041)

වර්ෂයට අදාළ බදු අය කළ හැකි ආදායම 100%ක් හිලව් කිරීම සඳහා ප්‍රයෝජනයට ගත හැකි සමුච්චිත බදු අලාභ පැවතීම නිසා වර්ෂය තුළදී ආදායම් බදු ගිණුම් තුළ කිසිදු ප්‍රතිපාදනයක් කර නැත. කෙසේ වුවද 24 වන සටහනේ දැක්වෙන පරිදි විලම්බිත බදු සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

10.1 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ සහ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ බදු අය කළ හැකි ලාභය සහ ගිණුම්ගත ලාභය අතර සංසන්දනාත්මක විග්‍රහයක් පහත දැක්වේ:

	31.12.2018 රු. '000	31.12.2017 රු. '000
ආදායම් බදුවලට පෙර ගිණුම්ගත ලාභය	(126,461)	172,976
සමාහාර ප්‍රතික්ෂේපිත අයිතම	494,820	567,223
සමාහාර අනුදත හැකි වියදම	(639,126)	(647,558)
වෙළඳ ලාභ හා වෙනත් ආදායම් මූලාශ්‍ර @ 12%	(270,767)	92,641
වෙනත් ආධීන වියදම් @ 28%	15,627	24,534
බදු අය කළ හැකි මුළු ලාභය	15,627	117,175
හිමිකම් පෑ අලාභය	(15,627)	(41,011)
බදු අය කළ හැකි ලාභය	-	76,164
බදු අය කළ හැකි වෙළඳ ලාභය @ 12%	-	60,217
බදු අය කළ හැකි වෙනත් ආදායම් මූලාශ්‍ර @ 28%	-	15,947
වෙළඳ ලාභය මත බදු	-	7,226
වෙනත් ආදායම් මූලාශ්‍ර මත බදු	-	4,465
ප්‍රවර්තන වර්ෂයේ මුළු බදු වියදම	-	11,691

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දොළහ සඳහා

	31.12.2018 රු. '000	31.12.2017 රු. '000
10.2 විලම්බිත බදු		
විලම්බිත බදු හට ගැනීමට හේතුව:		
- තාවකාලික වෙනස්කම් ඇති වීම හා ආපිට හැරීම (23 වන සටහන)	(1,046)	102,645
මුළු විලම්බිත බදු භාරය	(1,046)	102,645
10.3 ඉදිරියට ගෙනා බදු අලාභ		
ඉදිරියට ගෙනා බදු අලාභ	9,702,737	9,743,748
ප්‍රවර්තන කාල පරිච්ඡේදය තුළ හිලව් කළ බදු අලාභ	(15,627)	(41,011)
ඉදිරි කාල පරිච්ඡේද සඳහා ඉදිරියට ගෙනා බදු ආලභ	9,687,110	9,702,737

11. කොටසක ඉපැයීම - මූලික

වර්ෂය සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ට හිමි විය යුතු ලාභය වර්ෂය තුළදී නොගෙවන ලද සාමාන්‍ය කොටස් සංඛ්‍යාවෙන් බෙදීමෙන් කොටසක මූලික ඉපැයීම ගණනය කරනු ලැබේ.

සාමාන්‍ය කොටසක ලාභය/(අලාභය)	(0.05)	0.13
ලවය ලෙස යොදා ගන්නා ලද මුදල	**රු. '000**	**රු. '000**
සාමාන්‍ය කොටස් හිමියන්ට හිමි විය යුතු ලාභය	(112,512)	260,432
හරය ලෙස යොදා ගන්නා ලද මුදල	**ප්‍රමාණය '000**	**ප්‍රමාණය '000**
කොටසක මූලික ලාභය ගණනය කිරීම සඳහා බර තබන ලද සාමාන්‍ය කොටස්වල සාමාන්‍ය අගය	2,046,646	2,046,646

12. දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ	බදු ඉඩම මත පිහිටි ගොඩනැගිලි රු. '000	පිරියත හා යන්ත්‍ර සූත්‍ර රු. '000	හෝටල් ගෘහභාණ්ඩ හා සවි කිරීම් රු. '000	මෝටර් රථ රු. '000	ශීතකරණ හා මුළුතැන්ගේ උපකරණ රු. '000	රූපවාහිනී හා පරිගණක රු. '000	මෙහෙයුම් උපකරණ රු. '000	එකතුව රු. '000
පිරිවැය/ප්‍රතිතක්සේරුව								
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**8,520,932**	**547,743**	**1,477,994**	**92,939**	**730,922**	**277,706**	**119,326**	**11,767,562**
වර්ෂය තුළදී එකතු කිරීම්	14,876	14,900	47,775	-	20,019	11,064	2,545	111,179
නොනිමි ප්‍රාග්ධනයෙන් පැවරුම්	492,342	-	30,690	-	125,397	-	-	648,429
පෙර වාර්තාගත ශේෂය								
2017 දෙසැම්බර් 31 දිනට	**9,028,150**	**562,643**	**1,556,409**	**92,939**	**876,338**	**288,770**	**121,871**	**12,527,119**
ගැළපීම - නොනිමි ප්‍රාග්ධනයෙන් පැවරුම් *	(311,464)	-	77,648		28,156	5,309	17,027	(183,323)
2017 දෙසැම්බර් 31 දිනට ගැළපූ ශේෂය	**8,716,686**	**562,643**	**1,634,057**	**92,939**	**904,494**	**294,079**	**138,897**	**12,343,796**
වර්ෂය තුළදී එකතු කිරීම්	142,569	27,491	55,210	-	19,260	8,189	27,524	280,243
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**8,859,256**	**590,134**	**1,689,267**	**92,939**	**923,754**	**302,268**	**166,422**	**12,624,039**
සමුච්චිත ක්ෂය කිරීම								
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,138,029**	**444,899**	**1,053,500**	**90,849**	**339,180**	**239,815**	**11,577**	**4,317,850**
වර්ෂය සඳහා භාරය	218,892	12,775	60,687	844	39,644	17,636	40,357	390,833
බැහැර කිරීම්								
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,356,921**	**457,674**	**1,114,187**	**91,693**	**378,824**	**257,451**	**51,934**	**4,708,683**
ගැළපීම - නොනිමි ප්‍රාග්ධනයෙන් පැවරුම් *	(10,148)	3	6,850	-	1,298	1,305	1,678	986
2017 දෙසැම්බර් 31 දිනට ගැළපූ ශේෂය	2,346,773	457,677	1,121,037	91,693	380,122	258,756	53,612	4,709,669
වර්ෂය සඳහා භාරය	219,994	12,821	77,515	1,187	48,625	17,132	51,874	429,148
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,566,767**	**470,496**	**1,198,552**	**92,879**	**428,747**	**275,888**	**105,485**	**5,138,817**
ලේඛනගත අගය								
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**6,382,903**	**102,844**	**424,494**	**2,090**	**391,742**	**37,891**	**107,749**	**7,449,712**
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	**6,671,229**	**104,968**	**442,222**	**1,246**	**497,514**	**31,319**	**69,937**	**7,818,436**
2017 දෙසැම්බර් 31 දිනට ගැළපූ ශේෂය	**6,369,914**	**104,966**	**513,020**	**1,246**	**524,372**	**35,323**	**85,286**	**7,634,127**
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**6,292,489**	**119,637**	**490,715**	**60**	**495,007**	**26,380**	**60,936**	**7,485,222**

හෝටලයේ දේපළ, පිරියත හා උපකරණවල පූර්ණ හිමිකාරත්වය හා පාලනය හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම සතු වේ.

12.2 1998 වසරේ දී ඇමරිකන් ඩොලර් 360,000 ක මුදලක් වැය කරමින් ලෝක වෙළඳ මධ්‍යස්ථානය හා හිල්ටන් හෝටලය යා කර පාලමක් ඉදි කරනු ලැබිණ. ඒ සඳහා සීමාසහිත ඔවර්සීස් රියල්ටි සමාගම සහ හිල්ටන් ඉන්ටර්නැෂනල් සමාගම පිළිවෙළින් ඇමරිකන් ඩොලර් 180,000ක් සහ ඇමරිකන් ඩොලර් 90,000ක් දායක කළ අතර ඉතිරි මුදල සමාගම විසින් දරන ලදී. සමාගම විසින් දරන ලද ඇමරිකන් ඩොලර් 90,000ක මුදල ගොඩනැගිලි යටතේ මූල්‍ය ප්‍රකාශ තුළ ප්‍රාග්ධනීකරණය කර ඇත.

12.3 රු. මිලියන 2,063 ක (2017 වර්ෂයේ රු. මිලියන 1,986) පිරිවැයකට දේපළ, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් සමාගම විසින්තව දුරටත් භාවිතයට ගනු ලැබේ. අර්නස්ට් ඇන්ඩ් යංග් ආයතනයේ පහසුකම් සැපයීම යටතේ, වරලත් තක්සේරුකරුවෙකුගේ සහාය ඇතිව සමාගම විසින් සෑම වත්කමක් පිළිබඳව ම සවිස්තර වත්කම් සත්‍යාපනයක් හා ඇගයීමක් සිදු කරනු ලැබ ඇත. සමාගම වත්කම්වල වෙළඳපොළ වටිනාකම සැලකිල්ලට ගනිමින් 2019 ජනවාරි 01 දින සිට බලපවත්වන පරිදි ප්‍රතිතක්සේරු ආකෘතිය යොදා ගනු ඇත.

12.4 2010 වර්ෂයේදී රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් ගොඩනැගිල්ල රු. මිලියන 5,600 කට ප්‍රතිතක්සේරු කරන ලදී. පූර්ව ගණකාධිකරණ ප්‍රමිතිය (SLAS) යටතේ ගොඩනැගිල්ලේ ප්‍රතිතක්සේරු මුදල LKAS ප්‍රමිතීන්ට මාරු වීමේ දිනට පැවති කල්පිත පිරිවැය ලෙස සැලකීමට සමාගම තීරණය කළේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාගම විසින් එකී මාරු වීමේ දිනට පැවති 4,706,460 ක් වූ (රු '.000) තක්සේරු සංචිතය රඳවා ගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබ ඇත.

12.5 2017 වසරේදී පළමු අදියරේ පිරිවැය ප්‍රාග්ධනීකරණය කිරීම පිරිවැය උපදේශකවරයාගේ වාර්තාවේ සඳහන් සම්පූර්ණ කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය මත පදනම් විය. පිරිවැයට හා ක්ෂය කිරීමට අදාළව කරනු ලබන ගැළපීම වර්ෂය තුළදී ලද අවසන් බිල්පත් මත පදනම් වේ*.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දොළහ සඳහා

	31.12.2018 රු. '000	31.12.2017 රු. '000
13. බදු ඉඩම		
ඉදිරියට ගෙනා ශේෂය	6,610,530	6,681,237
අදාළ කාල පරිච්ඡේදය සඳහා ක්‍රමක්ෂය	(70,707)	(70,707)
ඉදිරියට ගෙන ගිය ශේෂය	6,539,823	6,610,530

බදු ඉඩම 99 අවුරුදු බදු පදනම මත ලබා ගෙන ඇති අතර 2012 ජූනි 28 දින සිට බලාත්මක වේ. බදු ඉඩමේ තක්සේරු වටිනාකම වන රු. බිලියන 7ක මුදල ප්‍රාග්ධනීකරණය කර ඇති අතර ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කරනු ලැබ ඇත. එපමණක් නොව, ක්‍රීඩා සංකීර්ණය ඉදි කෙරෙන ඉඩම කුලී රහිත පදනම මත 2012 ජූනි 28 දින සිට වසර 5ක කාල පරිච්ඡේදයක් සඳහා බදු දීමට 2012 ඔක්තෝබර් 3 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබිණ. 2016/12/13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම ඉඩමේ බදුකරය ප්‍රධාන ගොඩනැගිල්ලේ බදුකරය හා සම්පාත වන පරිදි 2111 ජූනි මාසය දක්වා දීර්ඝ කර ඇති අතර බදු කොන්දේසි නිශ්චය කිරීම මෙතෙක් සිදුවී නැත.

14. කල් බදු ඉඩම භාවිතය සඳහා ඇති අයිතිය		
වර්ෂය ආරම්භයේදී	3,017	4,023
ක්ෂය කිරීම	(1,006)	(1,006)
වර්ෂය අවසානයේදී	2,011	3,017

හිල්ටන් කළමිබු හෝටලයේ Ikoi Tei අවන්හල පිහිටා ඇති බදු ඉඩම අත්පත් කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ගෙවන ලද මුදල 2016.12.02 දිනෙන් ආරම්භ කර 5 වසරක බදු කාල පරිච්ඡේදය තුළදී ක්ෂය කරනු ලැබේ.

15. භාණ්ඩ තොග		
ආහාර	15,904	11,748
පාන වර්ග	32,538	34,494
පොදු ගබඩාව	10,482	8,163
ඉංජිනේරු ගබඩාව	4,570	3,604
	63,494	58,009

16. ලැබිය යුතු වෙළඳ හා වෙනත් වත්කම්		
ලැබිය යුතු වෙළඳ වත්කම්	140,677	153,388
අඩු කළා: ණයකරුවන් අඩු කිරීම	(1,748)	(1,748)
	138,929	151,640

17. අදාළ පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල්		
හිල්ටන් කළමිබු රෙසිඩන්ස්	1,289	240
හිල්ටන් ක්වාලාලම්පූර්	-	196
හිල්ටන් වීරවිල	4,344	918
	5,634	1,354

18. වෙනත් වත්කම්		
තැන්පතු, පෙර ගෙවුම් හා අත්තිකාරම්	107,999	83,404
වෙනත් ලැබිය යුතු මුදල්	24,900	45,468
අත්තිකාරම් - ප්‍රතිසංස්කරණ වියදම්	80,817	26,950
ලැබිය යුතු ආදායම් බදු	41,433	24,681
	255,149	180,503

	31.12.2018 රු. '000	31.12.2017 රු. '000
19. ජංගම මූල්‍ය වත්කම්		
කෙටි කාලීන ආයෝජන		
ඇමතුම් තැන්පතු	-	114,558
	-	114,558
ගෘහභාණ්ඩ, සවි කිරීම් හා උපකරණ සංචිතය සඳහා ආයෝජනය		
ඇමතුම් තැන්පතු	6,904	21,050
	6,904	21,050
මුළු කෙටි කාලීන ආයෝජනය	6,904	135,608

හිල්ටන් ඉන්ටර්නැෂනල් මැනේජ්මන්ට් කෝපරේෂන් සහ හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම අතර ඇති කර ගත් 2012 ඔක්තෝබර් 18 දින දරන කළමනාකරණ ගිවිසුමේ 4 වන පරිච්ඡේදයේ V වන වගන්තිය ප්‍රකාරව ගෘහභාණ්ඩ, සවි කිරීම් හා උපකරණ සංචිතය සඳහා කරනු ලබන ආයෝජන භාවිතයට ගැනීම සීමා කර ඇති අතර ගෘහභාණ්ඩ, සවි කිරීම් හා උපකරණ ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා භාවිත කළ යුතුය. මෙම ආයෝජන හෝටලයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා උපයෝගී කර ගෙන ඇති බැවින් දැන් ඒවා පෙරදී වර්ගීකරණය කර තිබූ ජංගම නොවන මූල්‍ය වත්කම් කාණ්ඩයෙන් ඉවත් කර ජංගම මූල්‍ය වත්කම් ලෙස නැවත වර්ගීකරණය කර ඇත.

20. මුදල් හා බැංකු ශේෂ		
ඉදිරි කිරීමේ ගිණුම ලංකා බැංකුව - ඇමරිකන් ඩොලර්	93,248	32,544
මෙහෙයුම් බැංකු ගිණුම	148,550	193,005
මුදල්	50	50
	241,848	225,599

ඇමරිකන් ඩොලර් ඉතිරි කිරීමේ ගිණුමේ වර්ෂ අවසාන ශේෂය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ශේෂ පත්‍ර දිනයේ අවසන් අනුපාතිකයට අනුව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ව්‍යවහාර මුදල වන රුපියල් බවට පරිවර්තනය කර ඇත.

21. ප්‍රකාශිත ප්‍රාග්ධනය

21.1 නිකුත් කරන ලද හා සම්පූර්ණයෙන් ගෙවන ලද		
සාමාන්‍ය කොටස් 2,046,645,685	20,466,456	20,466,456

22. සංචිත		
ගෘහභාණ්ඩ, සවි කිරීම් හා උපකරණ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ සංචිතය (21.1)	187,217	161,348
22.1 ගෘහභාණ්ඩ, සවි කිරීම් හා උපකරණ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ සංචිත		
වර්ෂය ආරම්භයේදී ශේෂය	161,348	21,896
එකතු කළා: වර්ෂය තුළදී සම්පාදිත ප්‍රතිපාදන	116,189	268,435
අඩු කළා: කොටස් වටිනාකම් ප්‍රකාශයට මාරු කළ අගයන්		
ගෘහ භාණ්ඩ හා සවි කිරීම් මිලදී ගැනීම හා ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා		
භාවිත කළ මුදල්	(90,320)	(128,983)
වර්ෂය අවසානයේදී ශේෂය	187,217	161,348

වර්ෂය තුළදී ඇමරිකන් ඩොලර් 700,000 කට සමාන මුදලක් ගෘහභාණ්ඩ, සවි කිරීම් හා උපකරණ සංචිතයට මාරු කර ඇත.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දොළහ සඳහා

	31.12.2018 රු. '000	31.12.2017 රු. '000
23. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		
වර්ෂය ආරම්භයේදී ශේෂය	122,581	125,326
වර්ෂය සඳහා භාරය	12,565	9,105
සංක්‍රාන්තික බැරකම/(වත්කම) සහ ආයුගණක අලාභය/(ලාභය) හඳුනා ගැනීම	4,767	10,042
උපකල්පනවල සිදුවූ වෙනස් වීම් හෝ පූර්ව වර්ෂවල ලබා දුන්	(19,762)	(12,457)
(අධි)/ඌන ප්‍රතිපාදන නිසා හට ගත් අලාභය/(ලාභය)		
වර්ෂය සඳහා පොලී පිරිවැය	8,541	13,472
වර්ෂය තුළදී කරන ලද ගෙවීම්	(22,432)	(22,907)
වර්ෂය අවසානයේදී ශේෂය	106,259	122,581

පියල් එස්. ගුණතිලක ඇසෝසියේට් ආයතනය විසින් කරන ලද ආයුගණක තක්සේරුව මත සමාගමේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව පදනම්වී ඇත. වට්ටම් අනුපාතික උපකල්පනය සහ වාර්ෂික මූලික වැටුප් වර්ධකය හැර සෙසු සියලුම උපකල්පන එලෙසින්ම පවතින අතර ඉදිරි වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළදී නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මට ලබා දෙන දායකත්වයේ කිසිදු වෙනසක් අපේක්ෂා නොකෙරේ. භාණ්ඩාගාර බැඳුම්කරවල ඵලදා අනුපාතික නියෝජනය වන පරිදි වට්ටම් අනුපාතික (පසු ගිය වර්ෂයේ පැවති 10.25% සිට) 12% දක්වා සංශෝධනය කරන ලදී. සේවක ප්‍රතිලාභවල පිරිවැය නිශ්චය කිරීම සඳහා පහත දැක්වෙන ප්‍රධාන උපකල්පන උපයෝගී කර ගන්නා ලදී:

වට්ටම් අනුපාතිකය	12.00%	10.25%
අනාගත වැටුප් වර්ධක	3.00%	6.00%

සංවේදිතාව හා කල් පිරීම	වට්ටම් අනුපාතිකය		වැටුප් වර්ධකය	
	2018 රු. '000	2017 රු. '000	2018 රු. '000	2017 රු. '000
සියයට එකකින් වැඩි වීම	(3,353)	(4,934)	3,578	(4,751)
සියයට එකකින් අඩු වීම	(3,629)	4,510	3,348	4,414

2018 දෙසැම්බර් 31 දිනට ගෙවීම් පිළිබඳ කල් පිරීම් විශ්ලේෂණය - වට්ටම්	
ඉදිරි මාස 12 තුළ	26,893
වර්ෂ 1 සහ 2 අතර	28,439
වර්ෂ 2 සහ 5 අතර	56,530
වර්ෂ 5 සහ 10 අතර	104,639
මුළු අපේක්ෂිත ගෙවීම්	216,501

	31.12.2018 රු. '000	31.12.2017 රු. '000
24. විලම්බිත බදු බැරකම		
වර්ෂය ආරම්භයේදී ශේෂය	396,570	499,215
විලම්බිත බදු වියදම/(ආදායම)	1,046	(102,645)
වර්ෂය අවසානයේදී ශේෂය	397,616	396,570
24.1 අවසන් විලම්බිත බදු බැරකම් ශේෂ පහත සඳහන් පරිදි අදාළ වේ:		
බදු කටයුතු සඳහා කඩිනම් ක්ෂය කිරීම	739,776	732,903
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	(14,876)	(17,161)
ඉදිරියට ගෙනා බදු අලාභ උපයෝගී කර ගැනීමට අදාළ විලම්බිත බදු වත්කම	(327,284)	(319,172)
විලම්බිත බදු වත්කම 14% අනුපාතිකයට ගණනය කර ඇත	397,616	396,570

	31.12.2018 රු. '000	31.12.2017 රු. '000
25. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්		
වෙළඳ කටයුතු සඳහා ගෙවිය යුතු මුදල්	140,763	138,318
සමුච්චිත වියදම් ඇතුළු විවිධ ණයහිමියන්	58,473	151,512
ගෙවිය යුතු කළමනාකරණ ගාස්තු *	(3,779)	7,654
වෙනත් බැරකම්	44,730	39,860
කැඩුණු බැඳුණු දෑ ප්‍රතිෂ්ඨාපනය	10,834	10,938
ගෙවිය යුතු ව්‍යවස්ථාපිත මුදල්	42,967	63,064
	293,987	411,345

* ඍණ ශේෂයෙන් හිල්ටන් ඉන්ටර්නැෂනල් මැනේජ්මන්ට් (එල්එල්සී) සමාගමට ගෙවන ලද අධි කළමනාකරණ ගාස්තු නියෝජනය වේ.

26. අදාළ පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල්		
හිල්ටන් ඉන්ටර්නැෂනල් ආසියා ශාන්තිකර	6,810	6,874
හිල්ටන් ඉන්ටර්නැෂනල් ඇමරිකා එක්සත් ජනපදය	3,771	5,684
	10,581	12,558
27. ගිවිසුම් බැරකම්		
ආගන්තුක අත්තිකාරම් තැන්පතු හා අත්තිකාරම්	106,118	68,228
	106,118	68,228
28. කොටසකට ශුද්ධ වත්කම්		
ශුද්ධ වත්කම්වල වටිනාකම	13,920,817	14,033,329
සාමාන්‍ය කොටස් සංඛ්‍යාව	2,046,646	2,046,646
කොටසකට ශුද්ධ වත්කම්	6.80	6.86
29. ආදායම් බදු බැරකම		
ආරම්භක ශේෂය	(24,681)	(21,548)
අදාළ කාල පරිච්ඡේදය සඳහා ප්‍රතිපාදනය	-	11,691
පූර්ව වර්ෂයේ ඌන ප්‍රතිපාදනය	-	5,913
බදු බැර		
ආර්ථික සේවා භාරය	(16,738)	(12,313)
රැඳවුම් බද්ද	(62)	(1,409)
කල්පිත බද්ද	-	(1,044)
ස්වයං තක්සේරු ගෙවීම	-	(5,971)
වර්ෂය අවසානයේදී ශේෂය (වෙනත් වත්කම්වලට මාරු කළ ප්‍රවර්තන වර්ෂයේ ශේෂය)	(41,481)	(24,681)
30. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්		
30.1 වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් හා සමාන වත්කම්		
මුදල් හා බැංකු ශේෂය	225,599	395,104
ඇමතුම් තැන්පතු	135,608	202,660
භාණ්ඩාගාර බිල් පත්	-	-
බැංකු අයිරාව	(272,468)	(340,250)
ඇමරිකන් ඩොලර් ඉතිරි කිරීමේ තැන්පතුව මත උපලබ්ධි නොවූ විනිමය	17,391	884
	106,130	258,398

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දොළහ සඳහා

	31.12.2018 රු. '000	31.12.2017 රු. '000
30.2 වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් හා සමාන වත්කම්		
මුදල් හා බැංකු ශේෂය	241,848	225,599
ඇමතුම් තැන්පතු	6,904	135,608
බැංකු අයිරාව	(432,938)	(272,468)
	(184,186)	88,739

31. 2018 දෙසැම්බර් 31 දිනට මිනුම් පදනම අනුව මූල්‍ය මෙවලම් විශ්ලේෂණය කිරීම

කාණ්ඩ අනුව මූල්‍ය වත්කම් - ණය හා ලැබිය යුතු මුදල්

ජංගම වත්කම් ආශ්‍රිත මූල්‍ය මෙවලම්		
ලැබිය යුතු වෙළඳ හා වෙනත් මුදල්	138,929	151,640
වෙනත් වත්කම්	255,149	183,520
අදාළ පාර්ශ්වයෙන් ලැබිය යුතු මුදල්	5,634	1,354
වෙනත් ජංගම මූල්‍ය වත්කම්	6,904	135,608
අත ඇති හා බැංකුවේ ඇති මුදල්	241,848	225,599
එකතුව	648,463	697,721

කාණ්ඩ අනුව මූල්‍ය බැරකම් - ක්ෂය කරන ලද පිරිවැය අනුව මනිනු ලබන මූල්‍ය බැරකම්

ජංගම බැරකම් ආශ්‍රිත මූල්‍ය මෙවලම්		
ලැබිය යුතු වෙළඳ හා වෙනත් මුදල්	293,987	490,021
අදාළ පාර්ශ්වයට ගෙවිය යුතු මුදල්	10,581	12,558
බැංකු අයිරා	432,938	272,468
එකතුව	737,506	775,047

32. මූල්‍ය අවදානම් කළමනාකරණය

සමාගමේ ව්‍යාපාරික කටයුතු (ව්‍යවහාර මුදල් අවදානම, පොලී අනුපාතික අවදානම හා මිල අවදානම ඇතුළු) වෙළඳපොළ අවදානම, ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම යනාදි විවිධ මූල්‍ය අවදානම්වලට පාත්‍ර වේ. සමාගමේ සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය මූල්‍ය අවදානම් පුරෝකථනය කළ නොහැකි බව කෙරෙහි අවධානය යොමු කරමින් සමාගමේ මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි ඉන් ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කර ගැනීමට උත්සාහ කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්ති යටතේ මුදල් දෙපාර්තමේන්තුව විසින් අවදානම් කළමනාකරණ කාර්යය ඉටු කරනු ලබයි.

සමාගමේ ප්‍රධාන මූල්‍ය මෙවලම් අතරට කෙටි කාලීන තැන්පතු, මූල්‍ය වෙළඳපොළ ආයෝජන හා මුදල් අයත් වේ. මෙම මූල්‍ය මෙවලම්වල ප්‍රධාන අභිප්‍රාය සමාගමේ මෙහෙයුම්වල ද්‍රවශීලතාව ඉහළ නැංවීම හා පවත්වා ගෙන යාම සහ සමාගමේ මූල්‍ය සංචිතවල ප්‍රතිලාභ උපරිම කිරීමයි. ස්වකීය ව්‍යාපාරික කටයුතුවලින් සෘජුව පැන නගින ලැබිය යුතු වෙළඳ මුදල් සහ ගෙවිය යුතු වෙළඳ මුදල් ඇතුළු වෙනත් විවිධ මූල්‍ය මෙවලම් ගණනාවක්ද සමාගම සතුව ඇත.

32.1 ණය අවදානම

"ණය අවදානම යනු යම් මූල්‍ය මෙවලමක් යටතේ සිය ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට යම් ප්‍රතිපාර්ශ්වයක් අසමත් වීම නිසා අනාගතයේ මූල්‍ය අලාභයක් සිදු වීමට ඇති හැකියාවයි. හෝටලය ස්වකීය මෙහෙයුම් කටයුතු (ප්‍රධාන වශයෙන්, වෙළඳ කටයුතුවලින් ලැබිය යුතු මුදල්) මගින් සහ ස්වකීය මූල්‍ය කටයුතු මගින් ණය අවදානමට පාත්‍ර වේ."

"පිළිගත්, විශ්වසනීය, ණය ලැබීමට සුදුසු තෙවන පාර්ශ්වයන් සමග පමණක් හෝටලය වෙළඳ කටයුතුවල නිරත වෙයි. ණය කොන්දේසි යටතේ ගනුදෙනු කිරීමට අපේක්ෂා කරන සියලුම ගනුදෙනුකරුවන් ණය සත්‍යාපන ක්‍රියාවලියකට යටත් කිරීම හෝටලයේ ප්‍රතිපත්තියයි. ඊට අමතරව, අය විය යුතු ශේෂ අඛණ්ඩ පදනමකින් නිරීක්ෂණය කෙරෙන අතර හෝටලයේ බොල් ණය පාත්‍රතාව ඉතා අවම මට්ටමක පැවතීම එහි ප්‍රතිඵලයයි."

"මුදල් හා මුදල් හා සමාන වත්කම් සහ වෙනත් මූල්‍ය නොවන වත්කම් හා අදාළ පාර්ශ්වයන්ගෙන් අය විය යුතු මුදල් යනාදි හෝටලයේ අනෙක් මූල්‍ය වත්කම්වලින් පැන නගින ණය අවදානම සම්බන්ධයෙන් ගත් විට හෝටලයේ ණය අවදානම් පාත්‍රතාව ප්‍රතිපාර්ශ්වයන් ණය ගෙවීම පැහැර හැරීම මගින් උද්ගත වේ. හෝටලය ප්‍රතිපාර්ශ්වීය අවදානම් අධික වශයෙන් සංකේන්ද්‍රණය වීම වළක්වා ගැනීමට හැකි වන පරිදි සිය මෙහෙයුම් පවත්වා ගෙන යාමට කටයුතු කරන අතර ප්‍රතිපාර්ශ්වයන් සිය බැඳීම් නොපිරිහෙළා ඉටු කරන බව සහතික කිරීම සඳහා සියලු යුක්ති සහගත පියවර ගනී."

32.2 ණය අවදානම් පාත්‍රතාව

සාමාන්‍යයෙන් ණය අවදානමට පාත්‍ර වන මූල්‍ය වත්කම්වල උපරිම අවදානම් තත්ත්ව (ඇපකර තිබෙන්නේද යන්න නොතකා) ඒවායේ ධාරණ අගයන්ට සමාන වේ. පහත වගුව උපරිම අවදානම් තත්ත්ව පෙන්වා දෙයි:

	2018 දෙසැම්බර් 31 දිනට				
	අතේ හා බැංකුවේ ඇති මුදල්	කෙටි කාලීන ආයෝජන	අය විය යුතු වෙළඳ හා වෙනත් මුදල්	අදාළ පාර්ශ්වයන්ගෙන් අය විය යුතු මුදල්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
බැංකුවේ ඇති තැන්පතු	-	6,904	-	-	6,904
අය විය යුතු වෙළඳ හා වෙනත්	-	-	138,929	-	138,929
අදාළ පාර්ශ්වයන්ගෙන් අය විය	-	-	-	5,634	5,634
අතේ හා බැංකුවේ ඇති මුදල්	147,036	91,269	-	-	238,305
සමස්ත ණය අවදානම් පාත්‍රතාව	147,036	98,172	138,929	5,634	389,771

	2017 දෙසැම්බර් 31 දිනට				
	අතේ හා බැංකුවේ ඇති මුදල්	කෙටි කාලීන ආයෝජන	අය විය යුතු වෙළඳ හා වෙනත් මුදල්	අදාළ පාර්ශ්වයන්ගෙන් අය විය යුතු මුදල්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
බැංකුවේ ඇති තැන්පතු	-	135,608	-	-	135,608
අය විය යුතු වෙළඳ හා වෙනත් මුදල්	-	-	151,640	-	151,640
අදාළ පාර්ශ්වයන්ගෙන් අය විය	-	-	-	1,354	1,354
අතේ හා බැංකුවේ ඇති මුදල්	193,055	32,544	-	-	225,599
සමස්ත ණය අවදානම් පාත්‍රතාව	193,055	168,152	151,640	1,354	514,201

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දොළහ සඳහා

32.3 අය විය යුතු වෙළඳ හා වෙනත් මුදල්

		2018 දෙසැම්බර් 31 දිනට රු. '000	2017 දෙසැම්බර් 31 දිනට රු. '000
හිඟ හිටීමක් හෝ ඌනකරණයක් සිදුව නොමැති		105,527	121,542
	30-60	24,708	18,894
	61-90	3,200	5,252
හිඟ හිටීමක් සිදුව ඇති නමුත් ඌනකරණයක් සිදුව නොමැති	91-120	254	918
	121-150	119	1,817
	151>	7,482	4,965
ඌනකරණය කළ දළ ධාරණ අගය		140,677	153,388
අඩු කළා: ඌනකරණ ප්‍රතිපාදනය			
වෙන වෙන ම තක්සේරු කළ ඌනකරණ ප්‍රතිපාදනය		(1,748)	(1,748)
එකතුව		138,929	151,641

32.4 අදාළ පාර්ශ්වයන්ගෙන් අය විය යුතු මුදල්

හිල්ටන් දාමයේ අනුබද්ධ සමාගම්වලින් අය විය යුතු මුදල්වලින් ශේෂය සමන්විත වේ.

32.5 මුදල් හා මුදල් හා සමාන වත්කම්වලට අදාළ ණය අවදානම

"ගිණුම් මූලිකාංග විශ්ලේෂණ හා වෙළඳපොළ දර්ශක සැලකිල්ලට ගනිමින්, වර්තමාන ශ්‍රේණිගත කිරීම් හා ආර්ථික දැක්ම පදනම් කර ගෙන, පිළිගත හැකි මූල්‍ය ප්‍රතිපාර්ශ්වයන්ගේ අනුදත් ලැයිස්තුවක් සමාගම විසින් පවත්වා ගෙන යනු ලැබේ. 2018 දෙසැම්බර් 31 දිනට රුපියල් 184,186,446/-ක (2017 දෙසැම්බර් 31 දිනට රු. 88,739,077/-ක) මුදල් හා මුදල් හා සමාන වත්කම් හෝටලය සතුව පැවතිණ."

32.6 ද්‍රවශීල අවදානම

ස්වාභාවික වර්ධනය ඇතුළු සමාගමේ කෙටි හා මැද කාලීන අරමුදල් බැඳියාවන් සපුරාලීමට සහ කවර හෝ අනපේක්ෂිත බැඳීම් හෝ අවස්ථාවන් වේ නම් සපුරාලීමට සමාගම සතුව අරමුදල් පවතින බව සහතික කිරීමට ප්‍රමාණවත් මට්ටමකට මුදල් තබා ගැනීම සමාගමේ ප්‍රතිපත්තියයි.

සමාගම විසින් දෛනික මුදල් කළමනාකරණ ක්‍රියාවලියක් යොදා ගනිමින් අරමුදල් ඌනතාවක් ඇති වීමේ අවදානම නිරීක්ෂණය කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේදී සමාගමේ මූල්‍ය ආයෝජන හා මූල්‍ය වත්කම් (උදා: අය විය යුතු ගිණුම්, වෙනත් මූල්‍ය වත්කම්) කල් පිරීම සහ මෙහෙයුම්වලින් ප්‍රක්ෂේපිත මූල්‍ය ප්‍රවාහ සැලකිල්ලට ගනු ලැබේ.

ශුද්ධ (ණය)/මුදල	2018 දෙසැම්බර් 31 දිනට රු. '000	2017 දෙසැම්බර් 31 දිනට රු. '000
කෙටි කාලීන ආයෝජන	6,904	135,608
අතේ හා බැංකුවේ ඇති මුදල	241,848	225,599
මුළු ද්‍රවශීල වත්කම්	248,752	361,207
බැංකු අයිරා	432,938	272,468
සමස්ත ණය ගැනීම්	432,938	272,468
ශුද්ධ (ණය)/මුදල	(184,186)	88,739

32.7 කල් පිරීම් විශ්ලේෂණය

පහත වගුව ගිවිසුම්ගත වට්ටම් නොකළ ගෙවීම් පදනම් කර ගෙන 2018 දෙසැම්බර් 31 දිනට හෝටලයේ මූල්‍ය බැරකම් කල් පිරීම් සංක්ෂිප්තව දක්වයි:

	2018 දෙසැම්බර් 31 දිනට		2017දෙසැම්බර් 31 දිනට	
	වසරක් තුළ	එකතුව	වසරක් තුළ	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
අය විය යුතු වෙළඳ හා වෙනත් මුදල්	293,987	293,987	479,574	479,574
අදාළ පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල්	10,581	10,581	12,558	12,558
රඳවා ගැනීමේ ගාස්තු - ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය	62,234	62,234	111,028	111,028
බැංකු අයිරා	432,938	432,938	272,468	272,468
	799,740	799,740	875,628	875,628

32.8 වෙළඳපොළ අවදානම

වෙළඳපොළ අවදානම යනු මූල්‍ය සාධන පත්‍රයක අනාගත මූල්‍ය ප්‍රවාහවල සාධාරණ අගය වෙළඳපොළ මිල හේතුවෙන් උච්චාවචනයන්ට ලක් වීමේ අවදානමයි. සිය මූල්‍ය සාධන පත්‍ර භාවිතය හේතුවෙන්ද විශේෂයෙන්ම ව්‍යවහාර මුදල් අවදානම හා වෙනත් මිල අවදානම් හේතුවෙන්ද හෝටලය වෙළඳපොළ අවදානමට නිරාවරණය වේ.

33. වාර්තාකරණ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශවල ගැළපීම් සිදු කිරීමට හෝ මූලය ප්‍රකාශ තුළදී අනාවරණයන් සිදු කිරීමට හේතු වන වැදගත් සිදුවීම් කිසිවක් වාර්තාකරණ දිනට පසුව සිදුවී නොමැත.

34. ප්‍රාග්ධන බැඳීම්

මෙම මූල්‍ය ප්‍රකාශ තුළදී, පහත සඳහන් ඒවා හැරුණු විට, අනාවරණයන් සිදු කිරීමට හේතු වන ප්‍රාග්ධන බැඳීම් හෝ අසම්භාව්‍ය බැරකම් නොමැත.

34.1 සමාගම විසින් 2014 ඔක්තෝබර් මාසයේ සිට හෝටලයේ මහා පරිමාණ අලුත්වැඩියාවක් ආරම්භ කරනු ලැබ ඇත. එතැන් සිට හිල්ටන් කලම්බු හෝටලය සුවිශාල ප්‍රතිසංස්කරණයන්ට භාජන වෙමින් පවතින අතර කාමර, ආහාරපාන අලෙවි සල් හා රැස්වීම් ශාලා යනාදී සියලුම දේපළ ඒ යටතේ වැඩි දියුණුවට ලක් වනු ඇත. මෙම අලුත්වැඩියා වැඩසටහන තීරු බදු සහිතව ඇමරිකන් ඩොලර් මිලියන 52කට අයවැයකරණය කර ඇති අතර ඉන් ඇමරිකන් ඩොලර් මිලියන 30ක් ඇමරිකන් ඩොලර් ණය මුදලකින්ද ඉතිරිය දේශීය වශයෙන් උත්පාදනය කර ගැනෙන අරමුදල් මගින්ද සපුරා ගැනීමට නියමිතය. ප්‍රාග්ධන බැඳීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති නමුත් එම බැඳීමෙන් ඇමරිකන් ඩොලර් මිලියන 27කට (රු. බිලියන 4.1කට) ආසන්න මුදලක් මෙතෙක් ගිවිසුම්ගත කර නැත.

අලුත්වැඩියාව සම්බන්ධයෙන් සමාගම දැනට එළඹ ඇති ගිවිසුම් සහ හිඟ ශේෂ පහත දක්වා ඇති පරිදි වේ:

	කොන්ත්‍රාත්තුවේ අගය ඇ.ඩො. '000	ගෙවූ මුදල ඇ.ඩො. '000	ශේෂය ඇ.ඩො. '000
සිවිල්/අවශ්‍යතා/වෙනත් ගිවිසුම	18,476	14,783	3,693
උපදේශන	5,899	5,561	338

34.2 බදු බැඳීම්

	31.12.2018 රු. '000	31.12.2017 රු. '000
අවලංගු කළ නොහැකි මෙහෙයුම් බදු සඳහා ගෙවිය යුතු බදු		
වසරක් තුළ	1,005	1,005
වසර එකත් පහත් අතර	2,011	3,017
	3,017	4,022

බදු බැඳීම 5 වසරක බදු දේපළක් වන පැරණි ලන්දේසි රෝහල් පරිශ්‍රයේ පිහිටි IkoiTei අවන්හලට සම්බන්ධය.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දොළහ සඳහා

35. අසම්භාව්‍ය වගකීම්

සේවා නියුක්තිය අවසන් කිරීම සහ උත්සව අවස්ථාවක විදුලිය බිඳ වැටීම හේතුවෙන් සිදු වූ අලාභ හා හානි සඳහා වන්දි ලබා ගැනීම සම්බන්ධයෙන් පවරන ලද නඩු කිහිපයක වගඋත්තරකරු බවට හෝටලය පත්ව සිටී. මෙම මූල්‍ය ප්‍රකාශ නිකුත් කරනු ලබන දින වන විට එම නඩුකරවල ප්‍රතිඵල පිළිබඳව පුරෝකථනය කිරීමට කළමනාකාරිත්වයට හැකියාවක් නොමැත. එම නිසා මෙම මූල්‍ය ප්‍රකාශවලදී එවැනි බැරකම් කිසිවක් සඳහා ප්‍රතිපාදන සලසාදී නැත.

කොළඹ මහ නගර සභාව 2007 ජූලි 6 දින ගැසට් පත්‍රයේ පළ කළ නිවේදනයක් මගින් 2007 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන අදාළ කාල පරිච්ඡේදය සඳහා හෝටල්, අවන්හල් හා නවාතැන් පොළවල් සම්බන්ධයෙන් වන බලපත්‍ර ගාස්තුව ප්‍රතිශෝධනය කර ඇත. හිල්ටන් කළම්බු හෝටලය ඇතුළු කොළඹ නගරයේ පිහිටි හෝටල් මෙම බලපත්‍ර ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් විරෝධය පළ කර ඇති අතර අදාළ ගැටලුව විසඳීම සඳහා මැදිහත්ව කටයුතු කරන සංචාරක අමාත්‍යාංශය සමග ඒ පිළිබඳව දැනට සාකච්ඡා කෙරෙමින් පවතී. 2011 ජූලි 28 දින දරන ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමයේ රැස්වීම් වාර්තාව පදනම් කර ගෙන මාසයකට රු. 50,000/- ක් බැගින්වූ ප්‍රතිපාදන හෝටලය විසින් මේ සඳහා වෙන් කරනු ලැබ ඇත. කොළඹ මහ නගර සභාව විසින් 2007, 2008, 2014 හා 2015 වර්ෂ සඳහා ගෙවීමට නියම කරන ලද බලපත්‍ර ගාස්තුව අභියෝගයට ලක් කරමින් හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම විසින් අධිකරණයේ නඩු පවරන ලදුව ශ්‍රී ලංකා මහේස්ත්‍රාත් අධිකරණය කොළඹ මහ නගර සභාවේ ඉල්ලීම නිෂ්ප්‍රභ කළ පසුබිම තුළ කොළඹ මහ නගර සභාව විසින් මෙවර ඉදිරිපත් කර ඇති බලපත්‍ර ගාස්තුවද ගෙවීමට සිදු නොවනු ඇති බවට කළමනාකාරිත්වය විශ්වාසය පළ කරයි. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනට රු. 6,932,522ක ප්‍රතිපාදනයක් එකී නඩු කටයුත්තට අදාළව හිල්ටන් කළම්බු හෝටලය විසින් පවත්වා ගෙන යනු ලැබේ.

36. ඇපකර වශයෙන් ඔඩපනය කරන ලද වත්කම්

ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් ඇමරිකන් ඩොලර් මිලියන 30ක ණය පහසුකමක් ලබා ගැනීම සඳහා DFCC බැංකුව සමග අත්සන් කරන ලද ගිවිසුමට අදාළව සමාගම විසින් හෝටලයේ ප්‍රධාන දේපළ උකස් කරනු ලැබ ඇත. කෙසේ වුවද, මෙම ණය පහසුකම මේ දක්වා ප්‍රයෝජනයට ගෙන නැත.

37. අදාළ පාර්ශ්වීය අනාවරණ

37.1 ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමග කරනු ලබන ගනුදෙනු

අදාළ පාර්ශ්වයන් අතරට ඇතුළත් වන්නේ සමාගමේ කටයුතු සැලසුම් කිරීම, මෙහෙයවීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් අධිකාරය හා වගකීම දරන පුද්ගලයන් ලෙස අර්ථ නිරූපණය කෙරෙන ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වේ. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සහ 2011 අංක 43 දරන ඌන-කාර්යසාධිත හෝ ඌන-උපයෝජිත වත්කම් පුනර්ජීවන පණතේ විධිවිධාන ප්‍රකාරව පත් කරන ලද නිසි බලධාරියාගෙන් ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමන්විත වේ.

අදාළ කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට ගෙවන ලද වැටුප් හා නිසි බලධාරියාට කරන ලද ගෙවීම්වල එකතුව රු. 4,686,159/-ක් වේ (2017 වර්ෂයේ ගෙවූ මුදල රු. 6,052,500/-කි).

ක්‍රිෂාන්ත කුරේ මහතා, ධීෂණා අමරසේකර මෙනවිය, ප්‍රියන්ත ජයමහ මහතා, අතුල සේනානායක මහතා, ටෙහානි එස්.ඒ. මැතිව් මහත්මිය, දිනුක් කොළඹගේ මහතා, එම්. ශෙස්මින් මන්සූර් මහතා, ඩබ්ලිව්.එස්.එල්.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා, සොනාලි ලියනමාන මෙනවිය සහ ප්‍රවීර් සමරසිංහ මහතා ශ්‍රී ලංකා රජය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නම් කරන ලදී. වර්තමානයේ සාමාන්‍ය කොටස් අයිතියෙන් 100% ක් ශ්‍රී ලංකා රජය සතුය.

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම DFCC බැංකුව පීඑල්සී වෙතින් ඇමරිකන් ඩොලර් මිලියන 30ක කෙටි කාලීන ණය පහසුකමක් සහ රු. මිලියන 500 ක බැංකු අයිරාවක් ලබා ගත්තේය. සමාගමේ සභාපතිවරයා වන ක්‍රිෂාන්ත කුරේ මහතා DFCC බැංකුව පීඑල්සී සමාගමේ අධ්‍යක්ෂවරයෙකි.

37.2 අදාළ පාර්ශ්වයන්ගෙන් අය විය යුතු මුදල් (17 වන සටහන බලන්න)

37.3 අදාළ පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල් (26 වන සටහන බලන්න)

37.4 අදාළ පාර්ශ්වයන් සමග කරන ලද ගනුදෙනු

	31.12.2018 රු. '000	31.12.2017 රු. '000
සමාගම කළමනාකරණය - හිල්ටන් ඉන්ටර්නැෂනල් කළමනාකරණ සමාගම		
සේවාවන් (ලැබීම)/සම්පාදනය	(61,681)	(87,344)
අනුබද්ධ සමාගම්/Group Hotel		
සේවාවන් (ලැබීම)/සම්පාදනය	74,224	60,122

අදාළ පාර්ශ්වයන් සමග කරන ලද ගනුදෙනුවල නියමයන් හා කොන්දේසි

අදාළ පාර්ශ්වයන් සමග කරන ලද ගනුදෙනු සිදු වූයේ ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතුවල කොටසක් ලෙසය. වර්ෂය අවසානයට පවතින හිඟ ජංගම ගිණුම් ශේෂ සුරැකුම් රහිත, පොලී රහිත ඒවා වන අතර පියවීම් සිදු වන්නේ අත්පිට මුදලිනි.

38. වාර්තාකරණ දින වන විට පවත්නා නඩු කටයුතු

38.1 SC HCCA LA 225/16

මෙම නඩුකරය සීමාසහිත කොර්නෙල් සහ සමාගම විසින් අංක HCCA LA 69/14 දරන නඩුවේ 2016 මාර්තු 31 දිනැති අධිකරණ නියෝග යට එරෙහිව ගොනු කරන ලද අභියාචනයකි. මෙම නඩුව වැඩි දුර විභාගය සඳහා 2019 සැප්තැම්බර් 16 වන දිනට නියම කර ඇත.

38.2 මහාධිකරණ (සිවිල්) නඩු අංක 1/98 (2)(ගොනු කළ දිනය 1998/3/31)

මෙම නඩුකරය හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම (5 වන වගඋත්තරකරු) ඇතුළුව සීමාසහිත මිට්සුයි සහ සමාගම, තායිසේ කොපරේෂන් සහ තවත් වගඋත්තරකරුවන් 9 දෙනෙකුට එරෙහිව සීමාසහිත කොර්නෙල් සහ සමාගම විසින් ගොනු කරනු ලැබ ඇත.

පැමිණිලිකරු බස්නාහිර පළාත් මහාධිකරණයේ මෙම නඩුකරය ගොනු කොට අධිකරණය වෙත කරුණු සැල කරමින්, පැමිණිල්ලේ (m) සහ (n) ඡේද යටතේ වූ ආයාචනා ප්‍රකාරව, සමථකරණ ගිවිසුම ක්‍රියාත්මක කිරීම වළක්වමින් ඒක පාර්ශ්වීය වාරණ නියෝගයක් ලබා ගත්තේය.

අධිකරණය විසින් මෙම නඩුව 2003.10.29 දින සිට සමථකරණයක් (වෙතොත්) ඇති කර ගැනීමට යටත් කොට පසෙක තබනු ලැබ ඇත.

38.3 කොළඹ දිසා අධිකරණ නඩු අංක 21819/MR

නිහාල් ශ්‍රී අමරසේකර මහතා විසින් පළමු වන විත්තිකාර ගාමිණී ලක්ෂ්මන් පීරිස් මහතාට එදිරිව රු. 35,938,000.00ක සහ රු. 36,071,000.00ක මුදලක් උදෙසා තීන්දුවක් ලබා ගැනීම පිණිස මෙම නඩුකරය ගොනු කරනු ලැබ ඇත. හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම 2 වන වගඋත්තරකරු වේ.

අධිකරණය විසින් මෙම නඩුව 2004 මාර්තු 17 දින සිට සමථකරණයක් (වෙතොත්) ඇති කර ගැනීමට යටත් කොට පසෙක තබනු ලැබ ඇත.

38.4 කොළඹ දිසා අධිකරණ නඩු අංක 15322/MR

(ගොනු කළ දිනය 1994/8/4)
හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම මෙම නඩුකරයේ පැමිණිලිකරු වේ.

රුපියල් 26,626,613.00ක මුදලක් ඒ මත නෛතික පොලිය ද සමග අය කරවා ගැනීමට නඩු තීන්දුවක් ලබා ගැනීම පිණිස මෙම නඩුකරය විත්තිකාර නිහාල් ශ්‍රී අමරසේකර මහතාට එරෙහිව ගොනු කරනු ලැබ ඇත.

අධිකරණය විසින් මෙම නඩුව 2007 පෙබරවාරි 28 දින සිට සමථකරණයක් (වෙතොත්) ඇති කර ගැනීමට යටත් කොට පසෙක තබනු ලැබ ඇත.

38.5 මහාධිකරණ (සිවිල්) නඩු අංක 754/2018/MR

සමාගම සහ සමාගමේ ලේකම්වරුන් සමාගමේ කොටස් පවරා දීම පිණිස කවර හෝ පියවරක් ගැනීම වැළැක්වීම සඳහා වාරණ නියෝගයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් නිහාල් ශ්‍රී අමරසේකර මහතා විසින් මෙම නඩුකරය ගොනු කරනු ලැබ ඇත.

වාචික ප්‍රකාශ මගින් විමසුමක් කිරීම සඳහා මෙම නඩුව 2019 නොවැම්බර් 22 වන දිනට නියම කර ඇත.

රැස්වීම පිළිබඳ නිවේදනය

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2019 ඔක්තෝබර් මස 10 දින ප.ව. 3.00ට කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවතේ, අංක 2 දරන ස්ථානයේ පිහිටි හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

~~~
~~~

සටහන්

සටහන්

පෙරකලාසි ආකෘති පත්‍රය

ස්ථානයේ පදිංචි ----------

වන මම/අපි හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ සාමාජිකයෙකු/සාමාජිකාවක/සාමාජිකයන් වන අතර, 2019 ඔක්තෝබර් මස 10 දින පැවැත්වීමට නියමිත සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී සහ එහි යම් කල් තැබූ සැසි වාරයකදී මා/අප නියෝජනය කරමින් ඊට සහභාගි වීමට සහ එම රැස්වීමේ ප්‍රතිඵලයක් ලෙස පවත්වනු ලබන සෑම ඡන්ද විමසීමකදීම මා/අප වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට මාගේ/අපගේ පෙරකලාසිකරු වශයෙන් ----------

---

යන ස්ථානයේ පදිංචි ----------

යන අය පත් කරන අතර ඔහු/ඇය අපොහොසත් වේ නම්,

කොළඹ පදිංචි ක්‍රිෂාන්ත ප්‍රසාද් කුරේ මහතා,	ඔහු අපොහොසත් වේ නම්,
කොළඹ පදිංචි ධීෂණා එස්. අමරසේකර මෙනවිය,	ඇය අපොහොසත් වේ නම්,
කොළඹ පදිංචි ජේ.එම්.යූ.පී. ජයමහ මහතා,	ඔහු අපොහොසත් වේ නම්,
කොළඹ පදිංචි අතුල සේනානායක මහතා,	ඔහු අපොහොසත් වේ නම්,
කොළඹ පදිංචි ටෙහානි එස්.ඒ. මැතිව්මහත්මිය,	ඇය අපොහොසත් වේ නම්,
කොළඹ පදිංචි ඩබ්ලිව්.එස්.එල්.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා,	ඔහුඅපොහොසත් වේ නම්,
කොළඹ පදිංචි සොනාලි ලියනමාන මහත්මිය,	ඇය අපොහොසත් වේ නම්,
කොළඹ පදිංචි ප්‍රවීර් ධනෝෂ් සමරසිංහ මහතා,	ඔහු අපොහොසත් වේ නම්,
කොළඹ පදිංචි චතුරි රණසිංහ මහත්මිය,	ඇය අපොහොසත් වේ නම්,
කොළඹ පදිංචි සංජීව් අලස් මහතා පත් කරමි/කරමු.	

න්‍යාය පත්‍ර අයිතමය	පක්ෂයි	විපක්ෂයි
1. රැස්වීම පිළිබඳ නිවේදනය පිළිගැනීම.		
2. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව සහ ගිණුම් ප්‍රකාශ සහ ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව භාර ගැනීම හා සලකා බැලීම.		
3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයට අනුව විගණකාධිපතිවරයා සමාගමේ විගණක වශයෙන් ඉදිරියටත් කටයුතු කරන බව සැලකිල්ලට ගැනීම.		

වර්ෂ 2019 ක් වූ ..... වන මෙදින අත්සන් තබන්නට යෙදිණ.

.....
කොටස් හිමිකරුගේ අත්සන

සටහන:

1. ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් 90 වන පිටුවේ දක්වා ඇත.
2. පෙරකලාසිකරු සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නොවේ.
3. ඡන්දය ලබා දීම සම්බන්ධයෙන් ඔබගේ උපදෙස් ලබා දීමට කරුණාකර අදාළ කොටුවේ "X" සලකුණු යොදන්න.

පෙරකලාසිය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

1. අදාළ හිස් තැනෙහි ඔබගේ සම්පූර්ණ නම හා ලිපිනය පැහැදිලිව ලියා අත්සන හා දිනය යොදා පෙරකලාසි ආකෘති පත්‍රය සම්පූර්ණ කරන්න.

2. පෙරකලාසිය නීතිඥයෙකු විසින් අත්සන් කරනු ලබන්නේ නම් හා ඒ සඳහා වන ඇටෝර්නි බලය සමාගමේ ලියාපදිංචි කර නොමැති නම් පෙරකලාසිය සමග අදාළ ඇටෝර්නි බලපත්‍රයද ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සමාගමක්/සමායතනයක් සම්බන්ධයෙන් නම්, පෙරකලාසිය නීත්‍යානුකූලව නියම කර ඇති ආකාරයෙන් සම්පූර්ණ කර සහතික කළ යුතුය.

4. සම්පූර්ණ කරන ලද පෙරකලාසි ආකෘති පත්‍රය රැස්වීම ආරම්භ වීමට යටත් පිරිසෙයින් පැය 48කට පෙර සමාගමේ ලියාපදිංචි කාර්යාලයට ලැබීමට සැලැස්විය යුතුය.

5. රැස්වීම සඳහා සහභාගි වීමට (සමාගමේ අධ්‍යක්ෂවරයෙකු නොවන) පෙරකලාසිකරුවෙකු පත් කරන කොටස් හිමියෙකු එම පෙරකලාසිකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය පෙරකලාසි ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතු අතර රැස්වීමට පැමිණෙන විට තම ජාතික හැඳුනුම්පත රැගෙන එන ලෙස පෙරකලාසිකරුගෙන් ඉල්ලා සිටිය යුතුය.

සමාගම පිළිබඳ තොරතුරු

සමාගමේ නම	හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී
නෛතික ස්වරූපය	සීමිත වගකීම් සහිත පොදු ලැයිස්තුගත සමාගමකි
සංස්ථාපිත දිනය	1983 මාර්තු 15
සමාගමේ ලියාපදිංචි අංකය	PQ 143
නිසි බලධාරියා	චන්ද්‍රකුමාර් රාමචන්ද්‍ර මහතා

අධ්‍යක්ෂවරු		
	ක්‍රිෂාන්ත ප්‍රසාද් කුරේ මහතා	- සභාපති
	ජේ.එම්.යූ.පී ජයමහ මහතා	-
	අතුල සේනානායක මහතා	-
	ධීෂණා එස්. සමරසේකර මෙනවිය	-
	ටෙහානි එස්.ඒ. මැතිව් මහත්මිය	-
	දිනුක් කොළඹගේ මහතා	- (19.04.01 දින සිට ඉල්ලා අස්වී ඇත)
	එම්. ශෙස්මින් මන්සූර් මහතා	- (19.04.03 දින සිට ඉල්ලා අස්වී ඇත)
	ඩබ්ලිව්.එස්.එල්.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා	-
	සොනාලි ලියනමාන මහත්මිය	-
	ප්‍රවීර් ධනෝෂ් සමරසිංහ මහතා	-
	සී.පී.ආර්. රණසිංහ මහත්මිය	- (19.04.09 දින සිට පත් කර ඇත)
	එස්.එන්. අලස් මහතා	- (19.04.09 දින සිට පත් කර ඇත)

ඉහත සඳහන් අධ්‍යක්ෂවරුන් සතුව සමාගමේ කොටස් නොමැත.

ලියාපදිංචි කාර්යාලය	හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී හිල්ටන් කළම්බු භාරයේ අංක 2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත කොළඹ 02 දුරකථනය : + 94 11 2433435 ෆැක්ස් : + 94 11 2446545 විද්‍යුත් තැපෑල : hdl_hilton@sltnet.lk වෙබ් අඩවිය : www.hoteldevelopers.lk
ලේකම්වරුන් හා රෙජිස්ට්‍රාර්වරු	සීමාසහිත එස්.එස්.පී. කෝපරේට් සර්විසස් (පෞද්ගලික) සමාගම අංක 101, ඉනර් ෆ්ලවර් රෝඩ්, කොළඹ 03
බැංකුකරුවෝ	DFCC බැංකුව පීඑල්සී 73/5, ගාලු පාර කොළඹ 03
නීතිඥවරු	ඩී.එල්. ඇන්ඩ් එෆ්. ද සේරම් සමාගම නීතිඥවරු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරු 47, ඇලෙක්සැන්ද්‍රා පෙදෙසෙ කොළඹ 7
විගණකවරු	විගණකාධිපති විගණකාධිපති දෙපාර්තමේන්තුව පොල්දූව පාර බත්තරමුල්ල

Printed by ANCL Printing Dept.